

# භික්ෂු භික්ෂුණී
# උභයප්‍රාතිමෝක්ෂය.

භික්ෂු භික්ෂුණී

# උභය ප්‍රාති මොක්ෂය.


කරන්දෙනියේ සුබෝධාරාම මහා විහාරාධිකාරි

වැලිතර වද්දුවේ සිරිපවරිඥ රාමාධිපති

ආචාර්ය්‍ය

**ඩබ්ලිව්. ඇස්. ධම්මකුසල**

උදම්මිට උත්තමාරාම මහා විහාර වාසී

**සු. ධම්මාලඞ්කාර තිස්ස**

යන ස්ථවිරයන් වහන්සේලා විසින්



**ඒ. ඩී. තෝබියස් ද සිල්වා කුලසිංහ මහතා සහ**

**වද්දුවේ**

**ඇන්. ඒ. මැන්දිස් මහතාද යන අප**

**විසින්**

රන්දෙණියේ "විද්‍යාදර්ශණ" මුද්‍රණාලයෙහි

මු ද්‍රා පි ත යි

**ශ්‍රී බුද්ධ වර්ෂ 2471.**

ක්‍රි. ව. 1927

# සංඥපනය

—(෧)—

## සන්න සහිත උභය ප්‍රාතිමෝක්ෂය

ශ්‍රී සද්ධර්මවරචක්‍රවර්තීස්වාමිවූ භගවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ ගිජුකුළුපව්වෙහි වැඩවාසයකර වදාරණ සමයෙහි භික්ෂු භික්ෂුණීන්ගේ උපොසථ කර්මය සඳහා ප්‍රාතිමෝක්ෂය අනුදැන වදාළසේක.

ප්‍රාතිමෝක්ෂ යනු සංස්කෘත වචනයෙකි, එහි පාළිවචනය පාතිමොක්ඛ යනුයි; පාතිමොක්ඛ ශබ්දයෙහි ලා අර්ථවිභාගය පාළි නය ආදි නානානයින් කටයුතුවේ එහෙත් මේ තරම් අතිසංක්ෂේප ලිපියෙකින් ඒ ඒ නයක්‍රමානුගතවැ අනුක්‍රමයෙන් කටයුතු සම්පූර්ණ විස්තරයක් කළනොහේ.

“පාතිමොක්ඛන්ති ආදිමේතං මුඛමේතං පමුඛමේතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛන්ති” යනු පාළිනයෙකි, ප්‍රාතිමෝක්ෂය යනු කුශලධර්මයන්ට මේ ප්‍රාතිමෝක්ෂ සංවරශීලය හෙවත් ශික්ෂාපද ශීලය (පූර්වෝත්පත්‍යර්ථයෙන්) ආදි වෙයි කාරණ නොහොත් මාර වෙයි පූර්වඞ්ගම වෙයි එහෙයින් ප්‍රාතිමෝක්ෂයයි කියනු ලැබේ; යනු එහි අර්ථයි. “පාතිමොක්ඛන්ති ප අති මොක්ඛං අති ප මොක්ඛං අතිසෙට්ඨං අතිඋත්තමන්ති අත්ථො” යනු අර්ථකථා නයෙකි; ප්‍රාතිමෝක්ෂය යනු ප්‍රකාරයෙන් අතිශයෙන් (ශීලයන් කෙරෙහි හෝ ශීලයන් අතුරෙන්) මාරවූය ප්‍රධානවූය (අතිපමොක්ඛං යනු උපසර්ගව්‍යත්‍යයෙන් කියයි) අතිශ්‍රේෂ්ඨය අත්‍යුත්තමය යන අර්ථයි යනු ඒ පාඨයෙහි තේරුමයි.

‘කිලෙසානං බලවභාවතො බහුක්ඛත්තුං අපායෙසු පතනසීලාති-පාතී, පුථුජ්ජනො; මරණවසෙන තම්හි තම්හි සත්තනිකායෙ අනනාභාවසා පතනසීලො’ති වා-පාතී, සත්තසන්තානො; චිත්තමෙව වා; පාතිං සංසාරදුක්ඛතො මොක්ඛෙතී’ති-පාතිමොක්ඛං” මේ ටීකානයෙකි, කෙලෙසුන් බලවත් බැවින් බොහෝවර අපායයන්හි වැටෙන සුලුවූයේනුයි පාතී නම, පෘථග්ජන තෙමේයි. මැරීම් වසින් ඒ ඒ සත්වනිකායයෙහි ආත්මභාවයාගේ වැටීම ස්වභාව කොට ඇත්තේනුයි හෝ පාති නම්, සත්වසන්තානය හෝ සිතම හෝයි; පෘථග්ජනයා හෝ සත්වසන්තානය හෝ සිත හෝ සසර දුකින් මුදනුයි පාතිමොක්ඛ නම්, යනු එහි අර්ථයි.

“ප පකාරෙන අති, අච්චන්තං මොක්ඛෙතීති=පාතිමොක්ඛං” යනු මෙහි කෘදන්ත නිර්වචනයෙකි, ප්‍රකාරයෙන් අත්‍යන්තයෙන් මුදනුයි ප්‍රාතිමොක්ෂ නම්, යනු එහි අර්ථයි; ප අති පූර්ව මුච-මොචනෙ යන ධාතුව කෙරෙන් ණ ප්‍රත්‍යයෙන් සිඬයි. පාතිං මොක්ඛෙති මොචයතී'ති=පාතිමොක්ඛං; ශීලය රක්නහු (අපායිකාදි දුකින් හෝ ආත්මානුවාදාදි භයින්) මුදනුයි ප්‍රාතිමොක්ෂ නම්, මේ නිර්වචන පක්ෂයෙහි පාතිං යන විතීර්ණානතා උප පදකොට ඇති මුච-ධාතු කෙරෙන් ණ ප්‍රත්‍යයෙන් සිඬයි තද්ධිත, සමාස, විධියෙන්ද මෙම පදය සිඬවේ.—

ඒ මේ ප්‍රාතිමොක්ෂය තෙමේ ශීලප්‍රාතිමොක්ෂය ග්‍රන්ථප්‍රාතිමොක්ෂයයි විවිධය, එයින් ශීලප්‍රාතිමොක්ෂය නම්. අධිශීල ශික්ෂාවයි, යත් පරමාර්ථ හෙයින් විරති චේතනාදි ධර්මයෝයි, කුශලයන් අතුරෙහි කායවාක් කර්මයෝයි.—

ග්‍රන්ථප්‍රාතිමොක්ෂය වනාහි “සුණාතු මෙ” යන්න ආදිකොට ඇති සියලු මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික චිත්තජාක්ෂර ප්‍රබන්ධයයි; ඒ මේ ග්‍රන්ථප්‍රාතිමොක්ෂය තෙමේ භික්ෂුප්‍රාතිමොක්ෂය, භික්ෂුණීප්‍රාතිමොක්ෂයයි, විවිධය; එයින් භික්ෂුප්‍රාතිමොක්ෂයෙහි නිදානොද්දේශය, පාරාජිකොද්දේශය, සඞ්ඝාදිසෙසොද්දේශය; අනියතොද්දේශය, විත්ථාරොද්දේශයයි උද්දේශපසෙකි. අධිකරණ සමථත් සමග ශික්ෂාපද දෙසියසත්විස්සෙකි, භික්ෂුණීප්‍රාතිමොක්ෂයෙහි වනාහි අනියතොද්දේශය හැර උද්දේශ සතරෙකි, ශික්ෂාපද තුන්සියඑකොළොසෙකි; මෙම ග්‍රන්ථප්‍රාතිමොක්ෂය තෙමේම ආඥා ප්‍රාතිමොක්ෂ නමුදු වේ. විනයමාතෘකා නමුදු සුත්තොද්දේශ නමුදු සඞ්ඝුපොසථ නමුදු වේ; චතුර්විධ විනයකර්ම අතුරෙන් ඥප්තිකර්මයෙහි සඞ්ග්‍රහීතයි. එහි නිදානය මහවග්ග උපොසථක්ඛන්ධකයෙහිද අවශෙෂ උද්දේශගත ශික්ෂාපද: භික්ෂු භික්ෂුණී විභඞ්ගවලයෙහිද අන්තර්ගත වෙති.

මෙහි යථාර්ථාවබොධය සඳහා අර්ථකථාචාර්ය අනුබුඬ බුඬඝොෂ මහාස්වාමිපාදයන් වහන්සේ විසින් කරවදළ කඞ්ඛාවිතරණී මාතිකට්ඨකථා යන නාමයෙන් ප්‍රසිඬවූ අටුවාවක්ද; බුඬනාගාචාර්ය පාදප්‍රණීත විනයත්ථමඤ්ජූසා නම් ටීකාවක්ද, සඞ්ඝරක්ඛිත මහා ස්ථවිර ප්‍රණීත ගණ්ඨිපද දීපනියක්ද, විචිත්‍රාලඞ්කාර මහාරාජගුරු ගණාචාර්ය මහාස්ථවිර ප්‍රණීත ප්‍රාතිමොක්ෂපදාර්ථ අනුවර්ණනාවක්ද; ඇත්තාහ; එතකුදුවුවත් පාළි නූගතුන්හට ඒ අර්ථකථා ටීකාදීන් අනුසාරයෙන් ප්‍රාතිමොක්ෂයෙහි සිංහලාර්ථ උගත හැකි වන්නේ නොවේ. ඔවුන්ට අනුග්‍රහ පිණිස පුරාතන ආචාර්ය දෙදෙනකු විසින්

කරණලද සිංහලාර්ථව්‍යාඛ්‍යා දෙකක් ඇත, ඉන් මේ ව්‍යාඛ්‍යානය අතිශයින් වඩා පුරාණවූද ව්‍යක්තවූද ගරුකටයුතුවූද ව්‍යාඛ්‍යානයයි, මේ කවරකලක විසූ කිනම් ආචාර්යවරයකු විසින් කරණලද්දදැයි නිසැකව කිවනොහෙත්, පොළොන්නරුපුර විසූ පණ්ඩිත ස්ථවිර කෙනෙකුවිසින් ලියනලද්දැයි සමහරුන්ගේ මතයි, ශාස්ත්‍රාගමධාරී විනයෙහි මනා පටුත්වයක්ඇති ප්‍රශස්ත ස්ථවිරයකු විසින් කරණලද්දක්බව මේ සන්නය බැලීමෙන් හැඟේ, සිංහල පදාර්ථාවබෝධයට මේ සන්නය ආධුනිකයන්හට අතිශයෙන් ප්‍රයෝජනවත්වෙයි මේ ප්‍රාතිමෝක්ෂය හා සන්නදෙක ආධුනික යතිපෝතකයන්ගේ ප්‍රයෝජනය සඳහා අපවිසින් යථාශක්තීන් ශුද්ධකොට සංස්කරණය කරණලදහ; පූර්වකරණ පූර්වකෘත්‍ය ප්‍රාප්තකාල ප්‍රකාශක ගාථා පාඨවලට සන්නද අපවිසින් ලියනලදී අක්ෂර යොජකයන්ගෙන්වූ ප්‍රමාදස්ථාන බොහෝයි. අප ප්‍රමාදභ්‍රමයෙන්වූ දෝෂස්ථාන ඇත්නම් සමීක්ෂකාරී සුධීහු අපට දන්වා එවත්වා.

රත්දෙළුම් මහාවිහාරිකශික්ෂාලරපරිවෙණාධිපති ජිනවර ශාසනාභිසාධක පරම කවිධජ ප්‍රාමාණිකවිනයාචාර්ය රාජගුරු වැලිතර ශ්‍රී සුදර්ශනාභිධාන මහාස්ථවිරස්වාමිපාදයන්වහන්සේ අවසානශෝධනපත්‍රබැලීමෙන් හා සූචිපත්‍රය සකස්කර දීමෙන් උපස්තම්භකවූ බවද රත්දෙළුම් ශ්‍රී පුෂ්පාරාමාධිපතිවූද මහාචෛත්‍යපිරුවන්හි උප ප්‍රධානාචාර්යවූද ගෞරවාර්හ ආචාර්ය උදම්මිට ශ්‍රී ධර්මරක්ඛිත තිස්ස මහාස්ථවිරයන් වහන්සේගෙන්ද යථාස්ථානයෙහි විශිෂ්ටාධාර ලත් බවද කෘතඥතානුස්මරණමුඛයෙන් මෙහි සඳහන් කරම්හ.

මෙකල බොහෝ භික්ෂූන් භික්ෂුණීප්‍රාතිමෝක්ෂය උද්ග්‍රහණධාරණාදියෙහි ව්‍යාවෘතන නොවීම බෙදයෙකි, විනයෙහි ව්‍යක්තවීම විනයධරවීම සඳහා භික්ෂුණීප්‍රාතිමෝක්ෂය අවශ්‍යයෙන් උගතයුතුයි භික්ෂුප්‍රාතිමෝක්ෂයද උගණීනත් සමාදරයෙන් පරිශීලනය කරන්නෝද පාඩම්ඇත්තෝද විරලවෙති.

සංස්කෘත කාව්‍යාලඞ්කාරාදියට මීට වඩා ප්‍රිය කෙරෙති, හෙද ශාසනහානියට කාරණකි, එබැවින් විනයිහාශ්‍රධාබුද්ධිවර්ධනය කොට උභයප්‍රාතිමෝක්ෂයද අනතුරුව ඛුද්දසික්ඛද උභයවිභඞ්ග ඛන්ධකපරිවාරයන් අටුවාසහිතවද විනයධරගුරුවරයන්ගෙන් සමාදරයෙන් උගෙණ ප්‍රාතිමෝක්ෂසංවරශීලයද ඉන්ද්‍රියසංවර, ආජීවපාරිශුද්ධි, ප්‍රත්‍යසන්නිශ්‍රිතශීලයන්ද පුරා සියලුදුක් දුරුකරණ නිවන්පසක් කිරීමෙහි අප්‍රමාදවෙත්වා.

මීට ශාසනස්ථිතිකාමී වැලිතර ශ්‍රී ධම්මකුසල ස්ථවිර
උදම්මිට ධම්මාලඞ්කාර තිස්ස ස්ථවිර

ශ්‍රී බුඩ වර්ෂ 2471
නිඛිනිමස පුරපසළොස්වක්දිනදිය.

උපොසථ කම්මස්ස.

# පුබ්බකරණ පුබ්බකිච්චානි.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං ඉත්ථන්නාමං විනයං පුච්ඡෙය්‍යං.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං.

සම්මජ්ජනී පදීපො ච උදකං ආසනෙන ච,
උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති.

ඔකාස—සම්මජ්ජනී, සම්මජ්ජනකරණඤ්ච; පදීපො ච, පදීප උජ්ජලනඤ්ච; ඉදානි සුරියාලොකස්ස අත්ථිතාය පදීපකිච්චං නත්ථි;

---

උපොසථකර්මයාගේ පූර්වකරණ පූර්වකෘත්‍යයෝ
කියනුලැබෙත්.

භන්තෙ, ස්වාමිනි; සඞ්ඝො, සඞ්ඝ තෙම; මෙ, මා කියන්නක්; සුණාතු, අසාවා; යදි, ඉදින්, සඞ්ඝස්ස, සංඝයාහට; පත්තකල්ලං, පැමිණි කල් ඇත්තේනම්; අහං, මම; ඉත්ථන්නාමං, මෙනම් ඇත්තාවූ; ආයස්මන්තං, ආයුෂ්මත්හු; විනයං, විනය; පුච්ඡෙය්‍යං, විචාරන්නෙමි; භන්තෙ, ස්වාමීනි; සඞ්ඝො, සඞ්ඝතෙම; මෙ, මා කියන්නක්; සුණාතු, අසාවා; යදි, ඉදින්; සඞ්ඝස්ස, සංඝයාහට; පත්තකල්ලං, පැමිණි කල් ඇත්තේනම්; අහං, මම; ඉත්ථන්නාමෙන, මෙනම් ඇත්තාහු විසින්; විනයං, විනය; පුට්ඨො, විචාරණ ලද්දේ; විස්සජ්ජෙය්‍යං, විසඳන්නෙමි.

සම්මජ්ජනී, හැමදීමය; පදීපො ච, පහන් දැල්වීමය; ආසනෙන, අසුන් පැණවීම සමග; උදකඤ්ච, පානීය පරිභොජනීය, පැන් එල වා තැබීමයයන; එතානි, මේසතර වත්හු; උපොසථස්ස, උපොසථ කර්මයහට; පුබ්බකරණං ඉති, පූර්වකරණයයි; වුච්චති, කියනු ලැබේ.

ඔකාස, අවසර, සම්මජ්ජනී, සම්මජ්ජනී යනු සම්මජ්ජනකරණඤ්ච, හැමදීම කිරීමය; පදීපො ච, පදීපො ච යනු පදීප උජ්ජලනඤ්ච,

**උදකං ආසනෙනච, ආසනෙන සහ පානීය පරිභොජනීය උදකට්ඨපනඤ්ච; උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති, එතානි චත්තාරි වත්තානි සම්මජ්ජන කරණාදීනි සඞ්ඝසන්නි පාතතො පඨමං කත්තබ්බත්තා උපොසථස්ස උපොසථකම්මස්ස පුබ්බකරණන්ති වුච්චති පුබ්බකරණානීති අක්ඛාතානි;**

**ඡන්දපාරිසුද්ධිඋතුක්ඛානං භික්ඛු ගණනාච ඔවාදො**
**උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති-**

**ඡන්දපාරිසුද්ධි, ඡන්දාරහානංභික්ඛූනංඡන්දපාරිසුද්ධි ආහරණඤ්ච, ඉධ නත්ථි; උතුක්ඛානං, හෙමන්තාදීනං තිණ්ණං උතූනං එත්ත කං අතික්කන්තං එත්තකං අවසිට්ඨන්ති එවං උතු ආචික්ඛනං, උතූනිධපන සාසනෙ හෙමන්තගිම්හවස්සානානං වසෙන තිණ්ණි හොන්ති-**

---

පහන් දැල්වීමය; ඉදානි, දැන්; සුරියාලොකස්ස, සූර්‍ය්‍යාලොකය තමා; අත්ථිතාය, ඇතිබැවින්; පදීපකිච්චං; පහං කෘත්‍යයක්; නත්ථි, නැත;

**උදකං ආසනෙන ච,** උදකං ආසනෙනච යනු ආසනෙන සහ අසුන් පැණවීම සමග; පානීය, පියයුතුවූද; පරිභොජනීය, පරිභොග කටයුතුවූද; උදකට්ඨපනඤ්ච, පැන් එලවා තැබීමය; **උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති,** උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති යනු සම්මජ්ජනකරණාදීනි, හැමදීම්කිරීම් ආදිවූ; එතානි චත්තාරි වත්තානි, මේ සතර වත්හු; සඞ්ඝසන්නිපාතතො, සංඝයාගේ රැස්වීමෙන්; පඨමං, පළමුකොට; කත්තබ්බත්තා, කටයුතු බැවින්; **උපොසථස්ස,** උපොසථස්ස යනු උපොසථකම්මස්ස, උපොසථ කර්මයට; **පුබ්බකරණන්තිවුච්චති,** පුබ්බකරණන්තිවුච්චති යනු පුබ්බකරණානි ඉති, පූර්වකරණහයි; අක්ඛාතානි, කියනලද්දහුය-

ඡන්දපාරිසුද්ධි, ඡන්දය හා පිරිසිදුබවය; උතුක්ඛානං, සෘතුකීමය; භික්ඛුගණනා, භික්ෂූන්ගේ ගිණීමය; ඔවාදො, භික්ෂුණීන්ට අවවාද දීමය යන; එතානි, මේ පස්වත්හු; උපොසථස්ස, උපොසථකර්මයට; පුබ්බකිච්චන්ති, පූර්ව කෘත්‍යහයි; වුච්චති, කියනු ලැබේ.

**ඡන්දපාරිසුද්ධි,** ඡන්දපාරිසුද්ධි යනු ඡන්දාරහානං, ඡන්දහීවූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; ඡන්දපාරිසුද්ධි, ඡන්දය හා පිරිසිදුබව; ආහරණඤ්ච, ගෙණඒමද; ඉධ, මෙහි; නත්ථි, නැත; **උතුක්ඛානං,** උතුක්ඛානං යනු හෙමන්තාදීනං, හිමන් ආදිවූ; තිණ්ණං උතූනං, තුන්සෘතූන් අතුරෙන්; එත්තකං, මෙපමණක්; අතික්කන්තං, ඉක්ම ගියේය; එත්තකං, මේපමණක්; අවසිට්ඨං ඉති, ඉතිරිවූයේයයි; එවං,

**අයං හෙමන්ත උතු අස්මිං උතුම්හි අට්ඨ උපොසථා ඉමිනා පක්ඛෙන එකො උපොසථො සම්පත්තො එකො උපොසථො අතික්කන්තො ඡ උපොසථා අවසිට්ඨා; භික්ඛුගණනාච, ඉමස්මිං උපොසථග්ගෙ සන්නිපතිතානං භික්ඛූනං ගණනා එත්තකා භික්ඛූ හොන්ති;**

**ඔවාදෙ, භික්ඛුණීනං ඔවාදෙ දාතබ්බා ඉදානිපන තාසං නත්ථිතාය සොච ඔවාදෙ ඉධ නත්ථි; උපොසථස්ස එතානි පුබ්බකිච්චානි වුච්චන්ති; එතානි පඤ්චකම්මානි ඡන්ද හරණාදීනි පාතිමොක්ඛුද්දෙසතො පඨමං කාතබ්බත්තා උපොසථස්ස උපොසථ කම්මස්ස පුබ්බකිච්චානි වුච්චන්ති පුබ්බ කිච්චානීති අක්ඛාතානි—**

---

මෙසේ; උතුආචික්ඛනං, ඍතු කීමය; ඉධ සාසනෙ, මේ බුද්ධශාසන යෙහි; උතුනිපන, ඍතූහු වනාහි; හෙමන්තගිම්හවස්සානානං වසෙන, හේමන්තය ග්‍රීෂ්මය වර්ෂාය යන මොවුන්ගේ වශයෙන්; තිනි හොන්ති, තුනෙක් වෙත්;

අයං, මේ; හෙමන්තඋතු, හිමසෘතුවයි; අස්මිං උතුම්හි, මේ සෘතුවෙහි; අට්ඨ උපොසථා, පොහෝඅටෙකි; ඉමිනා පක්ඛෙන, මේ පක්ෂයෙන්; එකොඋපොසථො, එක් උපෝෂථයෙක්; සම්පත්තො, පැමිණියේය; එකො උපොසථො, එක්උපෝෂථයෙක්; අතික්කන්තො, ඉක්මුනේය; ඡ උපොසථා, ෂට් උපෝෂථ කෙනෙක්; අවසිට්ඨා, ඉතිරිවූහ; **භික්ඛුගණනාච,** භික්ඛුගණනාච යනු ඉමස්මිං උපොසථග්ගෙ, මේපොහෝගෙහි; සන්නිපතිතානං, රැස්වූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; ගණනා, ගිණීමයි; එත්තකා,මෙපමණ; භික්ඛූ හොන්ති, භික්ෂූහු වෙත්;—

**ඔවාදෙ,** ඔවාදෙ යනු භික්ඛුනීනං, භික්ෂුණීන්ට; ඔවාදෙ, අවවාදය; දාතබ්බා, දියයුත්තේය; ඉදානිපන, දැන් වනාහි; තාසං, ඒ භික්ෂුනීන් තමා; නත්ථිතාය, නැතිබැවින්; සොච ඔවාදෙ, ඒ අවවාදයද; ඉධ, මෙහි; නත්ථි, නැත්තේය; **උපොසථස්ස එතානි පුබ්බකිච්චානි වුච්චන්ති,** උපොසථස්ස එතානි පුබ්බකිච්චානි වුච්චන්ති යනු ඡන්දහරණාදීනි, ඡන්දය ගෙණ ඒම ආදීවූ; එතානි, මේ; පඤ්චකම්මානි, පඤ්චකර්මයෝ; පාතිමොක්ඛුද්දෙසතො, පාමොක්උදෙසීමෙන්; පඨමං, පළමුකොට; කාතබ්බත්තා, කටයුතුබැවින්; **උපොසථස්ස,** උපොසථස්ස යනු උපොසථකම්මස්ස, උපෝෂථ කර්මයට; පුබ්බකිච්චානි වුච්චන්ති, පුබ්බකිච්චානි වුච්චන්ති යනු පුබ්බකිච්චානී ඉති, පූර්ව කෘත්‍යයයි; අක්ඛාතානි, කියන ලද්දාහුය;—

**උපොසථො යාවතිකා ච භික්ඛූ**
**කම්මප්පත්තා සභාගාපත්තියො ච,**
**න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා**
**තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.**

**උපොසථො, තීසු උපොසථ දිවසෙසු චාතුද්දසී පණ්ණරසී සාමග්ගීසු අජ්ජුපොසථො පණ්ණරසො; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා, යත්තකා භික්ඛූ තස්ස උපොසථකම්මස්ස පත්තා යුත්තා අනුරූපා සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන චත්තාරො භික්ඛූ පකතත්තා සඞ්ඝෙන අනුක්ඛිත්තා තෙ ච ඛො හත්ථපාසං අවිජහිත්වා එකසීමායං ඨිතා; සභාගාපත්තියො ච න විජ්ජන්ති, විකාලභොජනාදි වත්ථුසභාගාපත්තියො ච න විජ්ජන්ති; වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති, ගහට්ඨපණ්ඩකාදයො එකවීසති වජ්ජනීය පුග්ගලා හත්ථපාසතො බහිකරණවසෙන වජ්ජෙතබ්බා තස්මිං න හොන්ති;**

---

උපොසථො, උපෝෂථයබවද; කම්මප්පත්තා, කර්මයට පැමිණියාවූ; යාවතිකා භික්ඛූච, යම්පමණ භික්ෂූහුද; සභාගාපත්තියොච, වස්තුවෙන් සමාන ඇවැත්හුද; නවිජ්ජන්ති, නැත්තාහුද; තස්මිං, එහි; වජ්ජනීයා පුග්ගලාච, බැහැර කටයුතු පුද්ගලයෝද; න හොන්ති, නැත්තාහුද; (එසේ ඇතිකල්හි) පත්තකල්ලංඉති, පැමිණි කල්ඇත්තේයයි; වුච්චති, කියනුලැබේ; **උපොසථො,** උපොසථො යනු චාතුද්දසී, චාතුර්දසීය; පණ්ණරසී, පෞර්ණමීය; සාමග්ගීසු, සාමග්‍රීයය; (යන) තීසු උපොසථ දිවසෙසු, තුන් උපෝෂථ දිනයන් අතුරෙන්; අජ්ජුපොසථො, අද පොහොය; පණ්ණරසො, පෞර්ණමියය; **යාවතිකාච භික්ඛූකම්මප්පත්තා,** යාවතිකාච භික්ඛූ කම්මප්පත්තා යනු යත්තකා භික්ඛූ, යම්පමණ භික්ෂූහු; තස්සඋපොසථ කම්මස්ස, ඒ උපෝෂථකර්මයට; පත්තා, පැමිණියාහුද; යුත්තා, යෙදුනාහුද; අනුරූපා, සුදුසුවූවාහුද; සබ්බන්තිමෙනපරිච්ඡෙදෙන, හැමට අන්තිම ගණනින් (කෙළවරින්); පකතත්තා, ප්‍රකෘතිවත්වූ; සඞ්ඝෙන, සඞ්ඝයා විසින්; අනුක්ඛිත්තා, උත්ක්ෂෙපනීය කර්මය නොකරණ ලද්දාවූ; චත්තාරො භික්ඛූ, භික්ෂූන් සතරනමෙක; තෙචඛො, ඔවුහුද වනාහි; හත්ථපාසං, අත්පස, අවිජහිත්වා, නොහැර; එකසීමායං, එක් සීමාවෙක්හි; ඨිතා, සිටියාහ; **සභාගාපත්තියොචනවිජ්ජන්ති,** සභාගාපත්තියොච න විජ්ජන්ති යනු විකාලභොජනාදී නොකල්හි අනුභව කිරීම් ආදිවූ; වත්ථුසභාගාපත්තියොච, වස්තුවෙන් සමාන ඇවැත්හුද; නවිජ්ජන්ති, නැත්තාහුද; **වජ්ජනීයාච පුග්ගලාතස්මිං**

**පත්තකල්ලන්ති වුච්චති, සඞ්ඝස්ස උපොසථකම්මං ඉමෙහි චතූහි ලක්ඛණෙහි සඞ්ගහිතං පත්තකල්ලන්ති වුච්චති පත්තකාලවන්තන්ති අක්ඛාතං, පුබ්බකරණපුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛු සඞ්ඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොමි.**

---

**න හොන්ති,** වජ්ජනීයාව පුග්ගලා තස්මිං න හොන්ති යනු ගහට්ඨ පණ්ඩකාදයො, ගෘහස්ථ පණ්ඩකාදීවූ; එකවිසති වජ්ජනීය පුග්ගලා, එක්විසිදුරුකටයුතු පුද්ගලයෝ; හත්ථපාසතො, අත්පසින්; බහිකරණ වසෙන, බැහැරකිරීම් වශයෙන්; වජ්ජෙතබ්බා, දුරුකටයුත්තාහුය; (එසේ ඇතිකල්හි) තස්මිං, එහි; න හොන්ති නැත්තාහුය;

**පත්තකල්ලන්තිවුච්චති** පත්තකල්ලන්තිවුච්චති යනු සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; උපොසථ කම්මං, උපෝසථකර්මය; ඉමෙහි චතූහි ලක්ඛණෙහි, මේ ලකුණු සතරින්; සඞ්ගහිතං, සඞ්ග්‍රහ කරණ ලද්දේය; **පත්තකාලවන්තන්ති වුච්චති,** පත්තකාලවන්තන්ති වුච්චති යනු පත්තකාල වන්තං ඉති, පැමිණි කල්ඇත්තේ වන්නේයයි; අක්ඛාතං, කියන ලද්දේය; පුබ්බකරණ පුබ්බකිච්චානි, පූර්වකරණ පූර්ව කෘත්‍යයන්; සමාපෙත්වා, (කොට) නිමවා; දෙසිතාපත්තිකස්ස, දෙසනලද ඇවැත් ඇත්තාවූ; සමග්ගස්ස, සමගිවූ; භික්ඛු සඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාගේ; අනුමතියා, අනුදැනීමෙන්; පාතිමොක්ඛං, පාමොක්; උද්දිසිතුං, උදෙසන්ට; ආරාධනං කරොමි, ආරාධනා කරමි;

# භික්ඛු පාතිමොක්ඛං.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

---

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජුපොසථො පණ්ණරසො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.

කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ පාතිමොක්ඛං උද්දිසිස්සාමි තං සබ්බෙව සන්තා සාධුකං සුණොම මනසිකරොම යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං.

---

## භික්‍ෂු ප්‍රාතිමොක්‍ෂයෙහි පදය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

---

භන්තෙ, ස්වාමීනි; සඞ්ඝො, සඞ්ඝතෙමේ; මෙ, මා කියන්නක්; සුණාතු, අසාවා;—

අජ්ජුපොසථො, අද පොහොය; පණ්ණරසො, පෞර්ණමීය; යදි, ඉදින්; සඞ්ඝස්ස, සංඝයාහට; පත්තකල්ලං, පැමිණි කල් ඇත්තේ නම්; සඞ්ඝො, සංඝතෙමේ; උපොසථං කරෙය්‍ය, පොහෝ කරන්නේ ය; පාතිමොක්ඛං, පාමොක්; උද්දිසෙය්‍ය, උදෙසන්නේය;

සඞ්ඝස්ස, සංඝයාගේ; පුබ්බකිච්චං, පූර්වකෘත්‍යය; කිං, කොට නිමවන ලද්දේද; ආයස්මන්තො, ආයුෂ්මතුනි; පාරිසුද්ධිං, පිරිසිදු බව; ආරොචෙථ, කියව්;

පාතිමොක්ඛං, පාමොක්; උද්දිසිස්සාමි, උදෙසන්නෙමි; තං, ඒ උදෙසීම; සන්තා, විද්‍යමානවූ; සබ්බෙව, සියල්ලෝම; සාධුකං, මනාකොට; සුණොම, අසමු; මනසිකරොම, මෙනෙහි කරමු; යස්ස, යමෙක්හට; ආපත්ති, ඇවැත්; සියා, වන්නීද; සො, හෙතෙම; ආවිකරෙය්‍ය, ප්‍රකාශකරන්නේය; අසන්තියා, අවිද්‍යමානවූ; ආපත්තියා, ඇවතෙහි; තුණ්හීභවිතබ්බං, තුෂ්ණීම්භූතවියයුතු;

තුණ්හී භාවෙන ඛෝ පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි යථා ඛෝ පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති යො පන භික්ඛු යාවතතියං අනුසාවියමානෙ සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය සම්පජාන මුසාවාදස්ස හොති—

සම්පජාන මුසාවාදො ඛෝ පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධාපෙක්ඛෙන සන්ති ආපත්ති ආවිකාතබ්බා ආවිකතා හිස්ස ඵාසු හොති—

උද්දිට්ඨං ඛෝ ආයස්මන්තො නිදානං තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි—

---

තුණ්හීභාවෙනඛෝපන, තුෂ්ණීම්භූතවීමෙන් වනාහි; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පරිසුද්ධාඉති, පිරිසිදුහයි; වෙදිස්සාමි, දනගන්නෙමි, යථාඛෝපන, යම්සේ වනාහි; පච්චෙකපුට්ඨස්ස, වෙන්ව විචාරණ ලද්දහුගේ; වෙය්‍යාකරණං හොති, ප්‍රකාශකිරීමවේද; එවංඑව, එප රිද්දෙන්ම; එවරූපාය පරිසාය, මෙබඳුපිරිසෙහි; යාවතතියං, තුන් වෙනි වර දක්වා අනුසාවිතං හොති, අස්වනලද්දේවේ; යොපන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; යාවතතියං, තුන්වෙනිවර දක්වා; අනුසාවියමානෙ, අස්වනුලබනකල්හි; සන්තිං ආපත්තිං; විද්‍යමාන ඇවත; සරමානො, සිහිකරන්නේ; නාවිකරෙය්‍ය, ප්‍රකාශ නොකරන්නේ නම්; අස්ස, ඒ මහණහට; සම්පජාන මුසාවාදො හොති, දැන බොරුකීම වේ;

ආයස්මන්තො, ආයුෂ්මතුනි; සම්පජාන මුසාවාදො ඛෝපන, දැන බොරුකීම වනාහි; භගවතා, භාග්‍යවතුන් විසින්; අන්තරායිකො ධම්මො ඉති, (ප්‍රථමධ්‍යානාදියට) අන්තරාය කර ධර්මයයි; වුත්තො, වදාරණ ලද්දේය; තස්මා, එසේ හෙයින්; සරමානෙන, ඇවත සිහි කරන්නාවූ; ආපන්නෙන, ඇවතට පැමිණියාවූ; විසුද්ධාපෙක්ඛෙන, පිරිසිදුබවද අපෙක්ෂා කරන්නාවූ; භික්ඛුනා, භික්ෂුව විසින්; සන්ති ආපත්ති, විද්‍යමාන ඇවත; ආවිකාතබ්බා, ප්‍රකාශකටයුත්තේය; ආවිකතාහි, ප්‍රකාශකිරීම වනාහි; අස්ස, ඔහට; ඵාසුහොති, (ප්‍රථම ධ්‍යානාදියම්) පහසුවෙයි;—

ආයස්මන්තො, ආයුෂ්මතුනි; නිදානං, නිදානය; උද්දිට්ඨංඛෝ, උදෙසනලද්දේමය; තත්ථ, එහි; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි,

**කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.**

**නිදානුද්දෙසො.**

**තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති. යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො සික්ඛං අප්පච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතායපි පාරාජිකො හොති අසංවාසො. 1.**

---

විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසිදුවව්ද; දුතියම්පි, දෙවනුවද; පුච්ඡාමි, විචාරමි;

කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසිදුවව්ද; තතියම්පි, තුන්වෙනුවද; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසිදුවව්ද; එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා එහෙයින්; තුණ්හී, තුෂ්ණීම්භූතවීමය; එවං, මෙසේ; එතං, මේ කාරණය; ධාරයාමි ඉති, සිතමියි (නොහොත්) ධරමියි; නිදානුද්දෙසො, නිදානොද්දෙශය; පඨමො, පළමුයි.

---

තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති= තත්‍ර, ඒ "පාතිමොක්ඛං උද්දිසිස්සාමි" යි ප්‍රතිඥා කරණලද ප්‍රාතිමොක්ෂයෙහි; ඉමෙ චත්තාරො පාරාජිකා ධම්මා, මේ සතරපාරාජිකා පත්තීහු; උද්දෙසං, තමතමන්ගේ ස්වරූපයෙන් උදෙසිය යුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.—

යො පන භික්ඛු, යම් කිසි මහණෙක්තෙමේ වනාහි; භික්ඛූනං, භික්ෂූන්ගේ; සික්ඛාසාජීව සමාපන්නො, අධිශීල සඞ්ඛ්‍යාත ශික්ෂාවට හා ප්‍රඥප්ත ශික්ෂාපද සඞ්ඛ්‍යාත සාජීවයට පැමිණියේ; සික්ඛං, ප්‍රාතිමොක්ෂසංවර සඞ්ඛ්‍යාත ශික්ෂාව; අප්පච්චක්ඛාය, "බුද්ධං පච්චක්ඛාමි" යනාදීන් ප්‍රත්‍යාඛ්‍යාන නොකොට; දුබ්බල්‍යං අනාවිකත්වා, "දුක්කරං ජීවිතං එකාගතානං, එකසෙය්‍යා" යනාදීන් සාජීවයෙහි දුර්වලබව පහළ නොකොට; අන්තමසො; යටත්පිරිසෙයින්; තිරච්ඡාන ගතායපි, තිරිසන් ගිය මාගමක් කෙරෙහිදු; † මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෛථුන්දම් සෙවියේ වීනම්; අයං අපි, මේ තෙමේද; පාරාජිකො,

---

† තිරිසන් ගිය මාගම්හි හාද

යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍ය යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසීති තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො. 2.

යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය අම්භො පුරිස කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන මතන්තෙ ජීවිතා සෙය්‍යොති ඉති චිත්තමනො චිත්තසඞ්කප්පො අනෙකපරියායෙන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය අයම්පි පාරාජිකො හොති අසංවාසො. 3.

---

කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ; අසංවාසො හොති, පූර්වතන් මහණුන්ගේ එක කම්මාදි සංවාස තමා හා සමග නැති බැවින් අසංවාසවේ. 1.

යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; අදින්නං, හිමියන් නුදුන් වස්තුව; ගාමා වා, ග්‍රාමයෙන් හෝ; අරඤ්ඤා වා, අරණ්‍යයෙන් හෝ ථෙය්‍යසඞ්ඛාතං, සොරසිතින්; ආදියෙය්‍ය, ගණීද; යථාරූපෙ, යම් බඳුවූ; අදින්නාදානෙ, නුදුන් වස්තුව ගැන්මෙහි; රාජානො, රජදරුවෝ; චොරං ගහෙත්වා, සොරනු ගෙණ; හනෙය්‍යුං වා, මරද්ද; බන්ධෙය්‍යුං වා, බඳිද්ද; පබ්බාජෙය්‍යුං වා, රටින් නගද්ද; චොරොසි, චොරයෙහි; බාලොසි, බාලයෙහි; මූළ්හොසි, මූඪයෙහි; ථෙනොසීති, දනා අයත් සොරා ගත්තෙහිය යනාමේ වචනයෙන් හෝ භය ගන්වා බෙණෙද්ද; තථාරූපං අදින්නං, "පාදය පාදාරහය අතිරෙකපාදය" යන එබඳුවූ නුදුන් වස්තුව; ආදියමානො, සොරසිතින් ගන්නාවූ; අයම්පි භික්ඛු, මේ මහණද; පාරාජිකො, පරදවන ලද්දේ; අසංවාසො හොති, අසංවාසවේ. 2.

යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; සඤ්චිච්ච, මොහු මරමි දැන දැන; මනුස්සවිග්ගහං, මිනුෂ්‍යදෙහය; ජීවිතා වොරොපෙය්‍ය, රූපාරූප ජීවිතයෙන් තොරකෙරේද; අස්ස, ඔහු සමීපයෙහි; සත්ථහාරකං වා, ජීවිතය හරණකරණ ශස්ත්‍රයක් හෝ; පරියෙසෙය්‍ය, මිනිසා කැමති සඳ; ගතහැකිසේ එලවා තබාද; මරණවණ්ණං වා, "යො එව, මරති සො ධනං වා ලභති" යනාදීන් මරණෙහි ගුණ හෝ; සංවණ්ණෙය්‍ය, ප්‍රකාශකෙරේද, මරණාය වා සමාදපෙය්‍ය, "සත්ථං

**යො පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තූපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය ඉති ජානාමි ඉති පස්සාමීති තතො අපරෙන සමයෙන සමනුග්ගාහීයමානො වා අසමනුග්ගාහීයමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය අජානමෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමි තුච්ඡං මුසා විලපින්ති අඤ්ඤත්‍ර අධිමානා අයම්පි පාරාජිකො හොති අසංවාසො. 4.**

---

වා ආහර විසංවා ඛාද" යනාදීන් මියන පිණිස උපාය හෝ උගන්වාද; අම්භො පුරිස, භවත් පුරුෂය; තුය්හං, තාගේ; පාපකෙන, ලාමකවූ; ඉමිනා දුජ්ජීවිතෙන, මේ දුක්ඛජීවිකාවෙන්; කිං, කිම; තෙ ජීවිතා, තාගේ ජීවත්වීමට වඩා; මතං සෙය්‍යොති, මියයාම උතුම යයි; ඉති චිත්තමනො, මෙබඳු මරණ සිත් මරණමනස් ඇත්තේ; ඉති චිත්තසංකප්පො, මෙබඳු මරණ සංඥාදි විසිතුරු විධාන ඇත්තේ; අනෙකපරියායෙන, නොයෙක්කාරණයෙන්; මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණෙහි ගුණ හෝ කියාද; මරණායවා සමාදපෙය්‍ය, මියනු පිණිස උපාය හෝ උගන්වාද; අයම්පි, මේ මහණද; පාරාජිකො, පරදවන ලද්දේ; අසංවාසො හොති, අසංවාසවේ. 3.

යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; අනභිජානං, "ස්වසන්තානයෙහි නොඋපන් බැවින්ම තමා කෙරෙහි ඇතැයි" නොදන්නේ; අලමරියඤාණදස්සනං, ක්ලෙශ ප්‍රහාණියෙහි සමර්ථවූ විශුද්ධ ඥානදර්ශන ඇති; උත්තරිමනුස්සධම්මං, ධ්‍යානාදි උතුරු මිනිස් දම්; අත්තූපනායිකං, තමා කෙරෙහි එළවා තමා හෝ එහි එළවා; ඉති ජානාමි, මේ කාරණයෙන් මා කෙරෙහි ඇතැයි දනිමි; ඉති පස්සාමි, මේ කාරණයෙන් ඇසින් දුටුවාසේ දක්මියි; අඤ්ඤත්‍ර අධිමානා, අධිගත ධර්ම ඇත්තෙමි යන අභිමාන නැතිව; සමුදාචරෙය්‍ය, විඥවූ මිනිස්සතක්හට කියාද; තතො අපරෙන සමයෙන, ඒ ආරොචිත කාලයෙන් අන්‍ය කාලයෙක; සමනුග්ගාහියමානො වා, "ධ්‍යාන විමොක්ෂාදීන් අතුරෙහි කවර ධර්මයෙක් තොප විසින් අධිගතද යනාදීන්" විචාරණු ලබන්නේ හෝ; අසමනුග්ගාහියමානො වා, නොවිචාරණු ලබන්නේ හෝ; ආපන්නො, ආරොචිත කාලයෙහිම පරිජි අවන්නේ; විසුද්ධාපෙක්ඛො, තමහට ගෘහස්ථ භාවාදි විශුද්ධිය කැමැත්තේ; ආවුසො, ඇවැත්නි; අජානං, "උතුරු මිනිස්දම් මා කෙරෙහි නැතිහෙයින් ම ඇතැයි" නොදන්නෙම්; එවං ජානාමි, මෙසේ දන්මියි; අපස්සං, නොදක්නෙම්; එවං පස්සාමි, මෙසේ දක්මියි; අවචං, කීමි; තුච්ඡං, වචනාර්ථ රහිතවූ හෙයින් සිස්වූ; මුසා,

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාරාජිකා ධම්මා යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛූහි සද්ධිං සංවාසං යථා පුරෙ තථා පච්ඡා පාරාජිකො හොති අසංවාසො.**

**තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.**

**උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා සුතා ඛො පනායස්මන්තෙහි තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා ද්වෙ අනියතා ධම්මා තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා**

---

බොරු; විලපිතන්ති, කීම්; එවං චෙදයන්, මෙසේකියාද; අසම්පි භික්ඛු, මේ මහණද; පාරාජිකො, පරාජයට පැමිණියේ; අසංවාසො හොති, අසංවාස වේ. 4.

ආයස්මන්තො, ආයුෂ්මතුනි; චත්තාරො පාරාජිකා ධම්මා, සතර පාරාජිකාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසන ලදහු; භික්ඛු, මහණ තෙම; යෙසං, යම් පාරාජික කෙණෙකුන් අතුරෙන්; අඤ්ඤතරංවා අඤ්ඤතරංවා, එක්තරා එක්තරා පාරාජිකාවක්; ආපජ්ජිත්වා, ඇව ද; භික්ඛූහි සද්ධිං, සිල්වත් භික්ඛූන් හා සමග; සංවාසං, එකකම්මාදි භෙද සංවාසය; නලභති, නොලැබේද; පුරෙ යථා, ගෘහස්ථානුපසම්පන්න කාලයෙහි යම්සේද; පච්ඡා, පසුව; පාරාජිකො, පරිජි වේද; තථා, එසේම; අසංවාසො හොති, භික්ෂූන් හා සමග සංවාස නැත්තේ වේද; එසේවූ සතර පාරාජිකාපත්තිහු උදෙසන ලදහයි සේයි;

තත්ථ, ඒ සතර පාරාජිකයෙහිලා; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; එත්ථ, මේ පාරාජිකයෙහි; පරිසුද්ධාකච්චි, පිරිසිදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවනවටත් විචාරමි; එත්ථ මේ පාරජිකයෙහි, පරිසුද්ධා කච්චි, පිරිසිදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වනවටත් විචාරමි; එත්ථ, මේ පාරාජිකයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසිදුද; ආයස්මන්තො, ආයුෂ්මත්හු; එත්ථ, මේ සතර පාරාජිකයෙහි; පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා, එහෙයින්; තුණ්හී, තුෂ්ණිම්භූතයහ; එතං, මේ තුෂ්ණිම්භාවය; එවං ධාරයාමි, මෙසෙයින් දරමි; පිරිසිදු හෙයිනැයි සලකමි.

ආයස්මන්තො, ආයුෂ්මත්නි; උද්දිට්ඨං ඛො නිදානං, නිදානය උදෙසනලද; චත්තාරො පාරාජිකා ධම්මා, සතර පාරාජිකාපත්තීහු;

මෙ නවුති පාචිත්තියා ධම්මා චත්තාරො පාටිදෙසනියා ධම්මා පඤ්ච සත්තති සෙඛියා ධම්මා සත්ත අධිකරණ සමථා ධම්මා එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.

පාරාජිකුද්දෙසො.

---

උද්දිට්ඨා, උදෙසන ලදහ; ආයස්මන්තෙහි, ආයුෂ්මතුන් විසින්; තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, තෙළෙස් සඞ්ඝාදිසෙසාපත්තීහුද; මෙ අනියතාධම්මා, ද්විවිධ අනියතාපත්තීහුද; තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තිස් නිස්සග්ගි පචිති ඇවැත්හුද;

මෙ නවුති පාචිත්තියා ධම්මා, දෙයානූ පචිති ඇවැත්හුද; චත්තාරො පාටිදෙසනියා ධම්මා, සතර පාටිදෙසනියාපත්තීහුද; සෙඛියා ධම්මා, සෛක්ෂ ධර්මයෝද; සත්ත අධිකරණ සමථා ධම්මා, සප්ත විධ අධිකරණ සමථ ධර්මයෝද; සුතා ඛො පන, අසන ලදහ; තස්ස භගවතො, ඒ භාග්‍යවතුන්ගේ; සුත්තාගතං, ප්‍රාතිමොක්ෂයෙහි ආවාවූ; සුත්තපරියාපන්නං, ඒ සූත්‍රයෙහිම අන්තර්ගතවූ; එත්තකං, මෙතෙක් සිකපද; අන්වද්ධමාසං, අඩමාසයෙහි; උද්දෙසං ආගච්ඡති, පොහෝ විසින් උදෙසිය යුතුබවට පැමිණෙයි; තත්ථ, ඒ ඒ ශික්ෂා පදයෙහි; සමග්ගෙහි, සමගවූ; සම්මොදමානෙහි, මනාකොට ප්‍රමුදිතවූ; අවිවදමානෙහි, විවාදනොකරන්නාවූ; සබ්බෙහෙව, හැමදෙනා විසින්ම; සික්ඛිතබ්බං, හික්මියයුතු; හෙවත් ඒ ඒ ශික්ෂාපද නොඉක්ම අධිශීලශික්ෂාතොමෝ සම්පාදනය කටයුත්තීයි;—

පාරාජිකුද්දෙසයි.

**ඉමෙ ඛො පනායස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

**සඤ්චෙතනිකා සුක්කවිස්සට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සඞ්ඝාදිසෙසො 1.**

**යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය හත්ථග්ගාහං වා වෙණිග්ගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං සඞ්ඝාදිසෙසො 2.**

**යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා තං යුවා යුවතිං මෙථුනූපසංහිතාහි සඞ්ඝාදිසෙසො. 3.**

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, මේ තෙළෙස් සඞ්ඝාදිසෙසාපත්තීහු; උද්දෙසං, උම තමන්ගේ ස්වරූපයෙන් උදෙසිය යුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.

සංචෙතනිකා, ව්‍යතික්‍රම සාධකවූ පූර්වභාග චේතනා ඇති; සුක්කවිස්සට්ඨි, ශුක්‍ර මොචනය, අඤ්ඤත්‍ර සුපිනන්තා, ස්වප්නාන්තයෙහිවූ ශුක්‍ර මොචනය විනා; සඞ්ඝාදිසෙසො, සඞ්ඝාදිසෙස නම් ආපත්ති වේ. * 1.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; ඔතිණ්ණො, කාය සංසර්ග රාගයා විසින් බස්නා ලද්දේ; (නොහොත්) කාය සංසර්ග රාගයට බටුයේ, විපරිණතෙන චිත්තෙන, පරිශුද්ධ භාවය හැර ලෙම රාගයෙන් විරූපව පෙරළියාවූ සිතින්; මාතුගාමෙන සද්ධිං, මිනිස් මාගමක් හා සමග; කායසංසග්ගං, ශරීර සංසර්ගයට; කෙසේවූද? හත්ථග්ගාහං වා, හස්තග්‍රහණයට හෝ; වෙණිග්ගාහං වා, ගෙතූ නොගෙතූ කෙශකලාපග්‍රහණයට හෝ; අඤ්ඤතරස්ස වා, අඞ්ගස්ස පරාමසනං, † උක්තාවශෙෂ ශරීර පරාමර්ශනයකට හෝ; සමාපජ්ජෙය්‍ය, පැමිණියේ වීනම්; සඞ්ඝාදිසෙසො, ඕහට සඞ්ඝාදිසෙස නම් ආපත්ති වේ. 2.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; ඔතිණ්ණො, දුට්ඨුල්ල

---

* "ආපත්තියෙක් වේ" පොත්හි.

† "අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං" යි පෙලෙහි පෙණේ.

**යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍ය එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යාති මෙථුනූපසංහිතෙන සඞ්ඝාදිසෙසො. 4**

**යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා අන්තමසො තඞ්ඛණිකාය පි සඞ්ඝාදිසෙසො. 5.**

---

වචනස්සාදරාගයා විසින් බස්නා ලද්දේ; (නොහොත්) දුඩුල්ල වචනස්සාදරාගයට බටුයේ; විපරිණතෙන චිත්තෙන, පරිසුඬ භාවය හැර එම රාගයෙන් විරූපව පෙරලියාවූ සිතින්; මාතුගාමං, සභාග සභාග තෙපුල් දන්නා මිනිස්මාගමකට; දුට්ඨුල්ලාහි, වසමග පසමග (හෙවත් උච්ස්මාගී පස්සාවමාගී) පිළිබඳවූ; මෙථුනූපසංහිතාහි, මෛථුනසංනිශ්‍රිතවූ; වාචාහි. වචනයෙන්; යථා තං යුවා යුවතිං, තරුණ පුරුෂයෙකු තරුණස්ත්‍රියකට මෙන්; ඔභාසෙය්‍ය, අසභ්‍ය බෙණේ නම්; සඞ්ඝාදිසෙසො, ඕහට සංඝාදිසෙස නම් ආපත්ති වේ. 3

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; ඔතිණ්ණො, අත්ත කාම පාරිචරියා රාගයා විසින් බස්නා ලද්දේ, (නොහොත්) අත්ත කාම පාරිචරියා රාගයට බටුයේ; විපරිණතෙන චිත්තෙන, පරිසුඬ භාවයහැර එම්රාගයෙන් විරූපව පෙරලියාවූ සිතින්; මාතුගාමස්ස සන්තිකෙ, සුභාෂිත දුර්භාෂිත දන්නා මිනිස්මාගමක සමීපයෙහිලා; භගිනි, ස්ත්‍රිය; යා, යමක් තොමෝ; සීලවන්තං, පාණාතිපාතාදීන් විරත හෙයින් සිල්වත්වූ; බ්‍රහ්මචාරිං, මෛථුන ධර්මයෙන් විරත හෙයින් බ්‍රහ්මචාරිවූ; කල්‍යාණ ධම්මං, තදුභය විරමණයෙන් කල්‍යාණ ධර්මවූ; මා දිසං, මා වැනියකුහු; එතෙන ධම්මෙන, ඒ මෛථුනධර්මයෙන්; පරිචරෙය්‍ය, අභිරමණය කරවා නම්; පාරිචරියානං, පාරිචරියාවන් අතුරෙහි; එතදග්ගන්ති, ඒ මාගමගේ පාරිචරියාතොමෝ අග්‍රයයි; අත්තකාම පාරිචරියාය වණ්ණං, තමහට මෙවුන්දම්හු මෙහෙනිකිරීමෙහි අනුසස්; මෙථුනූපසංහිතෙන, "අරහසි ත්වං මය්හං මෙථුන ධම්මං දාතුං" යනාදිවූ මෛථුනධර්ම ප්‍රතිසංයුක්ත වචනයෙන්; භාසෙය්‍ය, කියාද; සංඝාදිසෙසො, ඕහට සංඝාදිසෙස නම් ආපත්ති වේ. 4.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම, සඤ්චරිත්තං, ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි සඤ්චරණ භාවයට; හෙවත් හසුන් ගැණුම් විමසීම්

**සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අස්සාමිකං**
**අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං දීඝසො**
**ද්වාදස විදත්ථියො සුගත විදත්ථියා තිරියං සත්තන්තරා භික්ඛූ අභි**
**නෙතබ්බා වත්ථුදෙසනාය තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනා**
**රම්භං සපරික්කමණං සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කම**
**ණෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථු**
**දෙසනාය පමාණං වා අතික්කාමෙය්‍ය සඞ්ඝාදිසෙසො 6.**

---

නැවත ගෙණ ඊමට; සමාපජ්ජෙය්‍ය, පැමිණියේවීනම්; හේ කෙසේ ද යත්? පුරිස මතිං, පුරුෂයාගේ අභිප්‍රාය; ඉත්ථියාවා, ස්ත්‍රියට හෝ; ඉත්ථිමතිං, ස්ත්‍රියගේ අභිප්‍රාය; පුරිසස්සවා, පුරුෂයාට හෝ; ජායත්තනෙවා, නිබඳ අඹුසැමි බවෙහි හෝ; ජාරත්තනෙවා, මිථ්‍යාචාර බැව්හි හෝ, අන්තමසො, යටත්පිරිසෙයින්, තඞ්ඛණිකායපි. එ කෙණෙහි සංවාස කටයුතු මාගමකටද කියානම්, සංඝාදිසෙසො, ඔහට සංඝාදිසෙස නම් ආපත්ති වේ. 5.

සඤ්ඤාචිකාය පන, තමාගේ යාඥවෙන්; (නොහොත්) තමා විසින් ඉල්වාගත් වැපොරො ඈ උපකරණයෙන්; අස්සාමිකං, කර වා දෙන හිමියන් නැති හෙයින් අස්වාමිකවූ; අත්තුද්දෙසං, තමා වසන පිණිස කරවන බැවින් තමා උද්දෙස කොට ඇති; කුටිං, උල්ලිත්තාදි කුටිය; කාරයමානෙන භික්ඛුනා, කරවන්නාවූ භික්ෂුහුවිසින්; පමාණිකා, ප්‍රමාණයෙන් යුක්තව; කාරෙතබ්බා, කරවිය යුත්තී; තත්‍ර, ඒ කුටියගේ; ඉදං පමාණං, මේ ප්‍රමාණයි; සුගතවිදත්ථියා, සුගත්විඳතින්; දීඝසො, හිත්තියෙහි පිටතදිගින්; ද්වාදසවිදත්ථියො, දොළොස්වියතෙක; තිරියං, පුළුලෙහි; අන්තරා, හිත්ති ඇතුලෙහි අන්තයෙන්; සත්ත, සත්වියතෙකි; වත්ථුදෙසනාය, කුටියක් කරණ බිම දෙසන පිණිස; භික්ඛූ, භික්ෂූහු; අභිනෙතබ්බා, එලවිය යුත්තාහ; තෙහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්; අනාරම්භං, කුහුඹිල්ලිකසායාදි උපද්‍රව රහිත බැවින් නිරුපද්‍රවවූ; සපරික්කමණං, බලිවද්දයුත්ත සකටයක් සිසාරවා යාහැකි බැවින් උපචාර සහිතවූ; වත්ථු, කුටි වස්තුව; දෙසෙතබ්බං, ඥත්තිය දෙවනුකොට ඇති කම්වචනින් දෙසිය යුතුය; භික්ඛු, මහණතෙම; සාරම්භෙ, සොපද්‍රවවූ; අපරික්කාමණෙ, උපචාර නැත්තාවූ; වත්ථුස්මිං, කුටිවස්තුයෙහි; සඤ්ඤාචිකාය, ස්වසංයාචිත පරිෂ්කාරයෙන්; කුටිං කාරෙය්‍ය චෙ, කුටිය කෙළේවීනම්; වත්ථුදෙසනාය, කුටිවස්තුව දෙසන පිණිස; භික්ඛූවා අනභිනෙය්‍ය, භික්ෂූන් හෝ නොඑලවූයේවීනම්; පමාණංවා අතික්කාමෙය්‍ය,

මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය සඞ්ඝාදිසෙසො. 7.

යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය අප්පෙව නාම නං ඉමම්හා, බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙව තං අධිකරණං හොති භික්ඛු ච දොසං පතිට්ඨාති සඞ්ඝාදිසෙසො. 8.

---

ප්‍රමාණය හෝ ඉක්මවූයේවීනම්; සඞ්ඝාදිසෙසො, ඔහට සඞ්ඝාදිසෙස නම් ආපත්තිවේ. 6.

සස්සාමිකං, කරවාදෙන හිමියන් ඇතිබැවින් සස්සාමිකවූ; අත්තුද්දෙසං, තමා උදෙසා කරවන බැවින් ආත්මොද්දෙශවූ; මහල්ලකං පන, සංයාචිත කුටියට වඩා මහත් බැවින් මහල්ලක නම්වූ; විහාරං, උල්ලිත්තාදි විහාරය; කාරයමානෙන භික්ඛුනා, කරවන්නාවූ භික්ෂුහු විසින්; වත්ථුදෙසනාය, විහාරවස්තුව දෙසන පිණිස; භික්ඛූ, භික්ෂූන්; අභිනෙතබ්බා, එළඹිය යුත්තාහ; තෙහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්; අනාරම්භං, නිරුපද්‍රවවූ; සපරික්කමණං, උපචාර සහිතවූ; වත්ථු, විහාර වස්තුව; දෙසෙතබ්බං, ඤත්තිය දෙවනකොට ඇති කම්මවාචනින් දෙසිය යුත්තේය; භික්ඛු, මහණ තෙම; සාරම්භෙ, උපද්‍රව සහිතවූ; අපරික්කමණෙ, උපචාර රහිතවූ; වත්ථුස්මිං, භූමියෙහි; මහල්ලකං විහාරං කාරෙය්‍ය චෙ, මහල්ලක විහාරය කෙළේ වීනම්; වත්ථුදෙසනාය, විහාර වස්තුව දෙසන පිණිස; භික්ඛූ වා අනභිනෙය්‍ය, භික්ෂූන් හෝ නොඑළඹුයේවූනම්; සංඝාදිසෙසො, ඔහට සංඝාදිසෙස නම් ආපත්ති වේ. 7.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; දුට්ඨො, ද්වේෂයෙන් දූෂිතවූයේ; දොසො, මෙරමා දූෂිත කරන්නේ; අප්පතීතො, ප්‍රීතිසුඛාදීන් අපගතවූයේ; තං, ඒ පුද්ගලයා; ඉමම්හා බ්‍රහ්මචරියා, මේ උත්තම චරියාවෙන්; චාවෙය්‍යං, පහකොළම්නම්; අප්පෙවනාම ඉති, ඉතා යෙහෙකැයි; භික්ඛුං, භික්ෂුවක්හට; අමූලකෙන, දෘෂ්ට ශ්‍රුත පරිශඞ්කාසඞ්ඛ්‍යාත මුල් නැතිහෙයින් අමූලකවූ; පාරාජිකෙන ධම්මෙන, එක්තරා පාරාජි ඇවතකින්; අනුද්ධංසෙය්‍ය, චොදනා කෙරේනම්;

**යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤභාගියඤ්චෙව තං අධිකරණං හොති කොචි දෙසො ලෙසමත්තො උපාදින්නො භික්ඛු ච දොසං පතිට්ඨාති සඞ්ඝාදිසෙසො. 9.**

---

තතො, ඒ චොදනා කළ සමයෙන්; අපරෙන සමයෙන, අනික් සමයෙක්හි; සමනුග්ගාහියමානො වා, "කිං තෙ දිට්ඨං" යනාදීන් විචාරණ ලබන හෝ; අසමනුග්ගාහියමානො වා, නොවිචාරණ ලබන හෝ, භික්ඛු ච, චොදනා කළ මහණ ද, දොසං පතිට්ඨාති, තුච්ඡකම්මයා භණිතං, යනාදීන් තමාගේ දොෂය ප්‍රතිඥ කෙරේද, අධිකරණඤ්ච, පාරාජික සඞ්ඛ්‍යාත ආපත්තාධිකරණයද, අමූලකං චෙව හොති, දර්ශනාදි මූල රහිත වේද, සංඝාදිසෙසො, ඔහට සංඝාදිසෙස නම් ආපත්ති වේ. 8.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; දුට්ඨො, ද්වෙෂයෙන්; දූෂිත වූයේ; දොසො, මෙරමා දූෂිත කරන්නේ; අප්පතීතො, ප්‍රීතිසුඛාදීන් අපගතවූයේ; අඤ්ඤභාගිස්ස, මනුෂ්‍යජාති භික්ෂුභාවකොට්ඨාසයෙන් අන්‍යවූ තිරශ්චීනජාති ඡගලකභාවාදි කොටස් ඇති; අධිකරණස්ස, දබ්බමල්ලපුත්තාදි නාමකරණයට වස්තුවූ ඡගලකාදීනු ගේ; කිංචි දෙසං ලෙසමත්තං, ජාත්‍යාදි කිසිදෙශලෙසමාත්‍රයක්; උපාදය, චොදනා කරණපිණිස ගෙණ; නං, ඒ පුද්ගලයා; ඉමම්හා බ්‍රහ්මචරියා, මේ උත්තම චරියාගෙන්; චාවෙය්‍යං, පහ කෙළෙම් නම්; අප්පෙවනාම ඉති, යෙහෙකැයි; භික්ඛුං, භික්ෂුවක්හට; පාරාජිකෙන ධම්මෙන, එක්තරා පරිජී ඇවතකින්; අනුද්ධංසෙය්‍ය, චොදනා කෙළේනම්; තතො, ඒ චොදනා කළ සමයෙන්; අපරෙන සමයෙන, අනික් සමයෙක්හි; සමනුග්ගාහියමානොවා, විචාරණ ලබන හෝ; අසමනුග්ගාහියමානොවා, නොවිචාරණ ලබන හෝ; භික්ඛුච, චොදනාකළ මහණද; දොසං, තමාගේ දොෂය; පතිට්ඨාති, ප්‍රතිඥ කෙරේද; තං අධිකරණඤ්ච, ඡගලකාදිවූ ඒ අධිකරණයද; අඤ්ඤභාගියඤ්චෙව හොති, තිරශ්චීන ජාති ඡගලකාදි අන්‍ය කොට්ඨාස ඇත්තේම වේද; කොචි දෙසො ලෙසමත්තො, ජාත්‍යාදි කිසි දෙශලෙසමාත්‍රයෙක්; උපාදින්නො, චොදනා කරණපිණිස ගන්නා ලද්දේ වේද; සඞ්ඝාදිසෙසො, ඔහට සඞ්ඝාදිසෙස නම් ආපත්ති වේ. 9.

යො පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමෙය්‍ය භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි සමෙතායස්මා සඞ්ඝෙන සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසුවිහරතීති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය යාවතතියං චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො 10.

---

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; සමග්ගස්ස සඞ්ඝස්ස, සමගි සඞ්ඝයාගේ; භෙදාය, බිඳීම පිණිස; පරක්කමෙය්‍ය, යත්න කෙරේ නම්; භෙදන සංවත්තනිකං, භෙදය පිණිස පවත්නාවූ; අධිකරණං වා, භෙදකර වස්තු සඞ්ඛ්‍යාත කාරණයක් හෝ; සමාදාය, ගෙණ; පග්ගය්හ තිට්ඨෙය්‍ය, නොහැර සිටිද; සො භික්ඛු, ඒ භෙදක මහණ තෙම; භික්ඛූහි, සෙසු ලජ්ජී භික්ෂූන් විසින්; ආයස්මා, ඇවත; සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය, සමගි සඞ්ඝයාගේ බිඳීම පිණිස, මා පරක්කමි, උත්සාහ නොකර; භෙදන සංවත්තනිකං වා අධිකරණං, සඞ්ඝභෙදය පිණිස පවත්නාවූ කාරණයක් හෝ; සමාදාය, ගෙණ; පග්ගය්හ, හුවා; මා අට්ඨාසි, නොසිටු; ආයස්මා, ආයුෂ්මත් තෙම; සඞ්ඝෙන, සඞ්ඝයා හා; සමෙතු, ක්ෂීරොදක මෙන් එක්වේවා; ඒ කාරණය කිමයත්? හි, යම්හෙයකින්; සඞ්ඝො, සඞ්ඝතෙම; සමග්ගො, සමගිවූයේ; සම්මොදමානො, අතිසයින් සතුටුවූයේ; අවිවදමානො, විවාද නොකරන්නේ; එකුද්දෙසො, එක්ව පැවති පාමොක් උදෙසීම් ඇත්තේ; ඵාසුවිහරති, සුවසේ වෙසේද; ඉති, එහෙයිනැයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතු වන්නේයි; සො භික්ඛු, ඒ භෙදකාරක මහණතෙම; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවං වුච්චමානො, මෙසේද කියනු ලබන්නේ; තථෙව පග්ගණ්හෙය්‍ය, එසේම ගෙණ; සිටෙය්‍ය, සිටියේවීනම්; සො භික්ඛු, ඒ පටහැනි * මහණතෙම; භික්ඛූහි, භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ භෙදප්‍රක්‍රමය හරණ පිණිස; යාවතතියං, තුන්යලක්; සමනුභාසිතබ්බො, සමනුභාසන කම් කටයුත්තේය; යාවතතියං, තුන්යලක්; සමනුභාසියමානො, සමනුභාසන කම් කරණු ලබන්නේ; තං පටිනිස්සජ්ජෙය්‍ය චෙ, ඒ යත්නය හරණේවීනම්; ඉච්චෙතං, එසේ ඒ හැරපීම;

---

* "ඒ ගතහැකි" පොත්හි.

**තස්සෙව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා තෙ එවං වදෙය්‍යුං මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ ධම්මවාදී චෙසො භික්ඛු විනයවාදී චෙසො භික්ඛු අම්හාකඤ්චෙසො භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති ජානාති නො භාසති අම්හාකම්පෙතං ඛමතීති තෙ භික්ඛූ භික්ඛූහි එවමස්සු වචනීයා මා ආයස්මන්තො එවං අවචුත්ථ න චෙසො භික්ඛු ධම්මවාදී න චෙසො භික්ඛු විනයවාදී මා ආයස්මන්තානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ සමෙතායස්මන්තානං සඞ්ඝෙන සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො**

---

කුසලං, මැනව; නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, ඉදින් නොහරන්නේවී නම්; සඞ්ඝාදිසෙසො, සඞ්ඝාදිසෙස නම් ආපත්තියෙක් වේ 10.

තස්සෙව ඛො පන භික්ඛුස්ස, සඞ්ඝභෙදයට උත්සාහ කරණ ඒ භික්ෂුහටම; අනුවත්තකා, අනුව පවත්නාවූ; වග්ගවාදකා, නො සමග තෙපුල් බණන්නාවූ; භික්ඛූ, භික්ෂුහු; එකො වා, එකෙක් හෝ; ද්වෙ වා, දෙන්නෙක් හෝ; තයො වා, තුන්දෙනෙක් හෝ; හොන්ති, වෙද්ද; තෙ, ඒ භික්ෂුහු; ආයස්මන්තො, ආයුෂ්මත්නි; එතං භික්ඛුං, ඒ භික්ෂුහට; කිඤ්චි, කිසිවක්; මා අවචුත්ථ, නොකියව; එසො භික්ඛු, ඒ මහණතෙමේ; ධම්මවාදීච, ධර්මයද කියයි; එසො භික්ඛු, ඒ මහණ තෙමේ; විනයවාදී ච, විනයද කියයි; එසො භික්ඛු, ඒ මහණ තෙමේ, අම්හාකං ච, අපගේද; ඡන්දං ච, අධ්‍යාසයද; රුචිං ච, අභිප්‍රායද; ආදාය, ගෙණ, වොහරති, බෙණෙයි; නො, අපගේ ඡන්දාදිය; ජානාති, දනියි; භාසති, අප හා සමග බෙණෙයි; එතං, ඒ සඞ්ඝභෙදය; අම්හාකම්පි ඛමතීති, අපටද අභිමතයයි; එවං වදෙය්‍යුං, මෙසේ කියත් නම්; තෙ භික්ඛූ, ඒ භෙදානුවර්තක මහණහු; භික්ඛූහි, සෙසු ලජ්ජි භික්ෂූන් විසින්; ආයස්මන්තො. ආයුෂ්මත්නි, මා එවං අවචුත්ථ, එසේ නොකියව්; එසො භික්ඛු, ඒ මහණතෙමේ; න ච ධම්මවාදී, ධර්මවාදීද නොවෙයි; එසො භික්ඛු, ඒ මහණතෙමේ; න ච විනයවාදී, විනයවාදීද නොවෙයි; ආයස්මන්තානම්පි, ආයුෂ්මතුන්ටද; සඞ්ඝභෙදො, සඞ්ඝභෙදය; මා රුච්චිත්ථ, අභිමත නොවේවා; ආයස්මන්තානං, ආයුෂ්මතුන්ගේ සිත්; සඞ්ඝෙන, සඞ්ඝයා හා; සමෙතු, එක්බවට යේවා; කාරණා කිම යත්—හි, යම් හෙයකින්; සඞ්ඝො, සඞ්ඝතෙම; සමග්ගො, සමගිවූයේ; සම්මොදමානො, අතිශය සිත් සතුටුවූයේ; අවිවදමානො, විවාද නොකරන්නේ; එකුද්දෙසො, එක්ව ඇවැසි උද්දෙස ඇත්තේ;

**ඵාසුවිහරන්තීති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නොචෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො. 11.**

**භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොති උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකංවා අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණංවා පාපකංවා විරමථායස්මන්තො මම වචනායාති සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි**

---

ඵාසුවිහරන්ති, සුවසේ වෙසේද; ඉති, එහෙයිනැයි; එවං වචනීයා අස්සු, මෙසේ කියයුතු වන්නාහ; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවං ච වුච්චමානා, මෙසේද කියනු ලබන්නාහු; තථෙව පග්ගණ්හෙය්‍යුං, එසේම ගෙණසිටිත්නම්; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භික්ඛූහි, භික්ෂූන්විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ භෙදනුවර්තක බව හරණ පිණිස; යාවතතියං, තුන්යලක්; සමනුභාසිතබ්බා, සමනුභාසන කම් කටයුත්තාහුයි; යාවතතියං, තුන්යලක්; සමනුභාසියමානා, සමනුභාසනකම් කරණු ලබන්නාහු; තං, ඒ භෙදානුවර්තකබව; පටිනිස්සජ්ජෙය්‍යුංචෙ, හරිත්නම්; ඉච්චෙතං, එසේ ඒ ඇරපීම; කුසලං, මැනව; නො චෙ පටිනිස්සජ්ජෙය්‍යුං, ඉදින් නොහරිත්නම්; සඞ්ඝාදිසෙසො, ඒ භෙදානුවර්තක මහණුන්ට සඞ්ඝාදිසෙස නම් ආපත්තියෙක් වේ. 11.

භික්ඛු පනෙව, මහණ වනාහී; දුබ්බච ජාතිකො හොති, දුර්වචස්භාව ඇත්තේ වේද; උද්දෙස පරියාපන්නෙසු, ප්‍රාතිමොක්ෂොද්දෙශයෙහි ඇතුලත්වූ; සික්ඛාපදෙසු, ශික්ෂාපදයෙහි ලා; භික්ඛූහි; භික්ෂූන් විසින්; සහධම්මිකං, ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; වුච්චමානො, කියනු ලබන්නේ; ආයස්මන්තො; ආයුෂ්මත්නි; කිඤ්චි කල්‍යාණංවා පාපකංවා, කිසි යහපතක් හෝ නපුරක් හෝ; මාමං අවචුත්ථ, මට නොකියව්; අහම්පි, මමද; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්ට; කිඤ්චි කල්‍යාණංවා පාපකංවා, කිසි යහපතක් හෝ නපුරක් හෝ; න වක්ඛාමි, නොකියමි; ආයස්මන්තො, ආයුෂ්මත්නි, මම වචනාය, මට කියන වචනයෙන්; විරමථ ඉති, දුරවවයි; අත්තානං අවචනීයං කරොති, තමා නොකියයුතු කෙරේද; සො භික්ඛු, ඒ නොකීකරු මහණතෙමේ; භික්ඛූහි, සෙසු පෙශල භික්ෂූන් විසින්; ආයස්මා, ඇවත්

වචනීයමෙව ආයස්මා අත්තානං කරොතු ආයස්මාපි භික්ඛූ වදෙ
තු සහ ධම්මෙන භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන එ
වං සංවඩ්ඪා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤ වච
නෙන අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනෙනාති එවඤ්ච සො භික්ඛු භික්ඛූ
හි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාව
තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය යාවතතියඤ්චෙ
සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො
චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො. 12.

භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය

---

අත්තානං අවචනීයං මා අකාසි, තමා නොකියයුතුනොකර;

ආයස්මා, ආයුෂ්මත් තෙම; අත්තානං, තමා; වචනීයමෙව ක
රොතු, කියයුතුමකෙරේවා; ආයස්මාපි, ආයුෂ්මත්ද; භික්ඛූ, භික්ෂූන්
ට; සහ ධම්මෙන. ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; වදෙතු, කියාවා; භික්ඛූපි,
භික්ෂූහුද, ආයස්මන්තං, ආයුෂ්මත්හට; සහධම්මෙන, ප්‍රඥප්ත ශික්ෂා
පදයෙන්; වක්ඛන්ති, කියත්; එවං, මෙසේ; යදිදං, යම්මේ හිත වච
නයෙක්, ආපත්තියෙන් නැගීමෙක් ඇද්ද; අඤ්ඤමඤ්ඤ වචනෙන
අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනෙන, ඒ අන්‍යොන්‍ය වචනයෙන් අන්‍යොන්‍ය
යන් නැගීමෙන්; තස්ස භගවතො පරිසා. ඒ භගවත්හුගේ පරිෂද්
තොමෝ; සංවඩ්ඪා හි ඉති, අභිවෘද්ධි වන්නීමයයි; එවං, මෙසේ; වච
නීයත්‍ව අස්ස, කියයුතුවන්නේය; සො භික්ඛු, ඒ මහණ තෙමේ; භි
ක්ඛූහි, භික්ෂූන් විසින්; එවං ච වුච්චමානො, මෙසේද කියනු ලබන්
නේ; තථෙව පග්ගණ්හෙය්‍ය, එසේම ගණී නම්: සො භික්ඛු, ඒ මහ
ණ තෙමේ; භික්ඛූහි, භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ අවච
නීයත්‍ව කාරණය හරණ පිණිස; යාවතතියං, තුන්යලක්; සමනුභා
සිතබ්බො, සමනුභාසනකම් කටයුත්තේය; යාවතතියං, තුන්
යලක්; සමනුභාසියමානො, සමනුභාසනකම් කරණු ලබන්නේ;
තං, ඒ අවචනීයත්‍වකරණය; පටිනිස්සජ්ජෙය්‍ය, හරණේවීනම්; ඉච්චෙ
තං, එසේ ඒ හැරීම; කුසලං, මැනව; නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය,
ඉදින් නොහරණේ වීනම්; සඞ්ඝාදිසෙසො, ඔහට සඞ්ඝාදිසෙස නම්
ආපත්තියෙක් වේ. 12.

භික්ඛු පනෙව, මහණ වනාහි; කුලදූසකො, "පුෂ්පදානාදිවූ ත
මාගේ දුෂ්ප්‍රතිපත්තියෙන්" කුලයන්ගේ සැදැහැ නසන්නේ; පාප
සමාචාරො, ලාමකවූ සමාචාර ඇත්තේ; අඤ්ඤතරං, එක්තරා; ගා
මං වා, ගමක්හෝ; නිගමංවා, නියංගමක් හෝ; උපනිස්සාය, නිසා;

විහරති කුලදූසකො පාපසමාචාරො තස්ස පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලන්තෙ ඉධ වාසෙනාති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්තීති සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා එවං අවච න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො

---

විහරති. වෙසේද; තස්ස, ඒ භික්ෂුහුගේ; පාපකා සමාචාරා, ලාමකවූ ආචාරයෝ; දිස්සන්ති චෙව, දක්නා ලැබෙද්ද; සුයන්තිච, අසනු ලැබෙද්ද; තෙන, ඒ භික්ෂුහු විසින්; දුට්ඨානි කුලානිච, දූෂිතවූ කුලයෝද; දිස්සන්ති චෙව, දක්නා ලැබෙද්ද; සුයන්තිච, අසනු ලැබෙද්ද; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; භික්ඛූහි, සෙසු ලජ්ජී භික්ෂූන් විසින්; ආයස්මා ඛො, ආයුෂ්මත් තෙම; කුලදූසකො, කුලදූසකය; පාප සමාචාරො, ලාමකවූ සමාචාර ඇත්තේය; ආයස්මතො ඛො, ආයුෂ්මතුන්ගේ; පාපකා සමාචාරා, ලාමකවූ සමාචාරයෝ; දිස්සන්ති චෙව, දක්නා ලැබෙති; සුයන්ති ච, අසනු ලැබෙති; ආයස්මතා, ආයුෂ්මතුන් විසින්; දුට්ඨානි කුලානිච, දූෂිතවූ කුලයෝද; දිස්සන්ති චෙව, දක්නා ලැබෙති; සුයන්තිච, අසනු ලැබෙති; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; ඉමම්හා ආවාසා, මේ විහාරයෙන්; පක්කමතු, නැගීයේවා; තෙ, තාගේ; ඉධ, මෙ විහාරයෙහි; වාසෙන, විසීමෙන්; අලන්ති, කාමිනැතැයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතු වන්නේය; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවංච වුච්චමානො, මෙසේද කියනුලබන්නාවූ; සො භික්ඛු, ඒ "පබ්බාජනීය කම්කරණුලබන" මහණ තෙමේ; තෙ භික්ඛූ, ඒ භික්ෂූන්ට; භික්ඛූ, භික්ෂූහු; ඡන්දගාමිනො ච, ඡන්දයෙනුදු පවත්නාහ; භික්ඛූ, භික්ෂූහු; දොසගාමිනො ච, ද්වේෂයෙනුදු පවත්නාහ; භික්ඛූ, භික්ෂූහු; මොහගාමිනො ච, මෝහයෙනුදු පවත්නාහ; භික්ඛූ, භික්ෂූහු; භයගාමිනො ච, භයෙනුදු පවත්නාහ; තාදිසිකාය ආපත්තියා, එබඳුවූ ආපත්තියෙන්; එකච්චං පබ්බාජෙන්ති, එකෙක්හු නගති; එකච්චං න පබ්බාජෙන්තීති, අනිකෙක්හු නොනගති; එවං, මෙසේ; වදෙය්‍ය, බණන්නේවීනම්; සො භික්ඛු, ඒ මහණ තෙමේ; භික්ඛූහි, භික්ෂූන් විසින්; ආයස්මා, ඇවත; මා එවං අවච,

**තාව භික්ඛූ මොහගාමිනො තාව භික්ඛූ භයගාමිනො ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලන්තෙ ඉධ වාසෙනාති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය යාවතතියං චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො. 13.**

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා.**

---

එසේ නොකිය; භික්ඛූ, භික්ෂූහු; තාව ඡන්දගාමිනො, තො ද ඡන්දගාමිහ; භික්ඛූ, භික්ෂූහු; තාව දොසගාමිනො, තො ද ද්වේෂගාමිහ;

භික්ඛූ, භික්ෂූහු; තාව මොහගාමිනො, තො ද මොහගාමිය; භික්ඛූ, භික්ෂූහු; තාව භයගාමිනො, තො ද භයගාමිහ; ආයස්මා ඛො, ආයුෂ්මත් තෙමේ; කුලදූසකො, කුලදූෂකය; පාප සමාචාරො, ලාමකවූ සමාචාර ඇත්තේය; ආයස්මතො ඛො, ආයුෂ්මත්හුගේ; පාපකා සමාචාරා, ලාමකවූ සමාචාරයෝ; දිස්සන්ති චෙව, දක්නා ලැබෙති; සුය්‍යන්ති ච, අසනු ලැබෙති; ආයස්මතා, ආයුෂ්මත්හු විසින්; දුට්ඨානි කුලානි ච, දූෂිත කුලයෝ ද; දිස්සන්ති චෙව, දක්නා ලැබෙති; සුය්‍යන්ති ච, අසනු ලැබෙති; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; ඉමම්හා ආවාසා, මේ වෙහෙරින්, පක්කමතු, නැගීයේවා; තෙ, තාගේ; ඉධ, මේ විහාරයෙහි; වාසෙන, විසීමෙන්; අලන්ති, කම් නැතැයි; එවං, මෙසේ; වචනියො අස්ස, කියයුතු වන්නේයි; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවං ච වුච්චමානො, මෙසේද කියනු ලබන්නාවූ; සො භික්ඛු, ඒ මහණ තෙම; තථෙව පග්ගණ්හෙය්‍යං, එසේම ගණී නම්; සො භික්ඛු, ඒ මහණ තෙමේ; තස්ස පටිනිස්සග්ගාය, "ඡන්දගාමිනො යනාදි" ඒ වචනය හරණ පිණිස, භික්ඛූහි, භික්ෂූන් විසින්; යාවතතියං, තුන්යලක්; සමනුභාසිතබ්බො, සමනුභාසනකම් කටයුත්තේයි; යාවතතියං තුන්යලක්; සමනුභාසියමානො, සමනුභාසන කම් කරණු ලබන්නේ; තං පටිනිස්සජ්ජෙය්‍යචෙ, ඒ වචනය හළේයේ වී නම්; ඉච්චෙතං, එසේ හැරපීම; කුසලං, මැනව; නොචෙ පටිනිස්සජ්ජෙය්‍ය, ඉදින් නො හළේයේ වීනම්; සඞ්ඝාදිසෙසො, ඕහට සඞ්ඝාදිසෙස නම් ආපත්තියෙක් වේ. 13.

ආයස්මන්තො, ආයුෂ්මත්නි; තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, තෙළෙස් සඞ්ඝාදිසෙසාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසන ලදහු;

**නවපඨමාපත්තිකා, චත්තාරො යාවතතියකා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා යාවතිහං ජානං පටිච්ඡාදෙති තාවතිහං තෙන භික්ඛුනා අකාමා පරිවත්ථබ්බං පරිවුත්ථ පරිවාසෙන භික්ඛුනා උත්තරිං ඡාරත්තං භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං චිණ්ණමානත්තො භික්ඛු යත්ථ සියා වීසතිගණො භික්ඛුසඞ්ඝො තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො එකෙනපි චෙ ඌනො වීසතිගණො භික්ඛු සඞ්ඝො තං භික්ඛුං අබ්භෙය්‍ය සො ච භික්ඛු අනබ්භිතො තෙ ච භික්ඛූ ගාරය්හා අයං තත්ථ සාමීචි.**

**තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි**

---

නවපඨමාපත්තිකා, ඔවුන් අතුරෙන් විකුම්කෙණෙහි ඇවැද්දයුතු ඇවැත්හු නවදෙනෙක; චත්තාරො යාවතතියකා, තුන්වන සමනුභාසනයෙහි ඇවැද්දයුතු ඇවැත්හු සතරදෙනෙකි; භික්ඛු, මහණ තෙමේ; යෙසං, යම් සඞ්ඝාදිසෙසාපත්තිකෙනෙකුන් අතුරෙන්; අඤ්ඤතරංවා අඤ්ඤතරංවා ආපජ්ජිත්වා, එක්තරා එක්තරා සඞ්ඝාදිසෙසාපත්තියකට ඇවද; යාවතිහං, යම්තාක් දවස්; ජානං, දන්නේ; පටිච්ඡාදෙති, තොකියා සඟවාද; තාවතිහං, ඒ තාක් දවස්; තෙන භික්ඛුනා, ඒ භික්ෂූහු විසින්; අකාමා, නොකැමැත්තහු විසිනුදු; පරිවත්ථබ්බං, පිරිවස් විසිය යුතුය; *පරිවුත්ථපරිවාසෙන භික්ඛුනා, විසූ පිරිවස්ඇති මහණහු විසින්; උත්තරිං, පරිවාසයෙන් මත්තෙහි; ඡාරත්තං, සරැයක්; භික්ඛු මානත්තාය, භික්ෂූන් ආරාධනා පිණිස; †පටිපජ්ජිතබ්බං, පැවැත්ත යුතුයි; චිණ්ණමානත්තො භික්ඛු, පිරූ මානත් ඇති යම් මහණෙක් ඇද්ද; සො භික්ඛු, ඒ මහණ තෙමේ; වීසතිගණො භික්ඛු සඞ්ඝො, විංශති වර්ගවූ භික්ෂුසඞ්ඝතෙමේ; යත්ථ සියා, යම් තැනෙක ඇත්තම්; තත්ථ, එහි; අබ්භෙතබ්බො, අබ්භාන්කම් විසින් ඇතුළත් කටයුත්තේයි; එකෙනපි ඌනො, එකක්හු විසිනුදු උණුවූ; වීසති ගණො භික්ඛු සඞ්ඝො, විංශති වර්ගවූ භික්ෂුසඞ්ඝතෙමේ; තං භික්ඛුං, ඒ භික්ෂූහු; අබ්භෙය්‍යචෙ, අබ්භාන්කම් විසින් ඇතුළත්හි ‡කෙරේනම්; සොච භික්ඛු, ඒ මහණද; අනබ්භිතො, අබ්භාන්කම් නොකරණ ලද්දේය; තෙච භික්ඛූ, ඒ මහණහුද; ගාරය්හා, ගර්හා කටයුත්තාහුමි; දුකුළාඇවැත් අව්දිතිසිසේස්සි; තත්ථ, ඒ සංඝාදිසෙසාපත්තියෙහි; අයං, මේ පරිවාස පූර්‍ණාදිය; සාමීචි, ලොකොත්තරධර්මානුගත ප්‍රතිපත්තියෙකි.

තත්ථ, ඒ තෙලෙස් සඞ්ඝාදිසෙසාපත්තියෙහිලා; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි;

---

* පිරිය යුතුය. † භික්ෂූන්ගේ මානත් පිණිස ‡ ඇතුළත්.

**කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.**

සඞ්ඝාදිසෙසුද්දෙසො.

---

**ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයං ධම්මො අනියතො. 1.**

---

එත්ථ, මේ සඞ්ඝාදිසෙසාපත්තීන්හි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවන වටහිදු විචාරමි, එත්ථ, මේ සඞ්ඝාදිසෙසාපත්තීන්හි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වන වටහිදු විචාරමි; එත්ථ, මේ සඞ්ඝාදිසෙසාපත්තීන්හි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසුදුහ; තස්මා තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතයහ; එතං, මේ තුෂ්ණීම්භාවය; එවං ධාරයාමි, එසේහෙයින් දරමි පිරිසුදු හෙයිනැයි සලකමි.

සඞ්ඝාදිසෙසොද්දෙශයයි.

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන වෙ අනියතා ධම්මා, මේ ද්විවිධ අනියතාපත්තීහු; උද්දෙසං, නමතමන්ගේ ස්වරූපයෙන් උදෙසිය යුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.

යොපන භික්ඛු, යම් මහණෙක් තෙම; එකො, එකලාවූයේ; එකාය එකලාවූ; මාතුගාමෙන සද්ධිං, මිනිස්මාගමක්හා සමග; රහො අනොපෙනෙන තැන්හිවූ; පටිච්ඡන්නෙ, කවුළුවටකුඩාදීන් මුවහවූ; අලංකම්මනියෙ, මෛථුනසෙවනයට යොග්‍යවූ; ආසනෙ, අස්නෙහි;

**නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලං කම්මනියං අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා නිසජ්ජං භික්ඛු පටිජානමානො**

---

නිසජ්ජං කප්පෙය්‍ය, හිඳ ගනේද; තමෙනං, ඒ භික්ෂුහු; සද්ධෙය්‍ය වචසා, ඇදහිය යුතු වචන ඇති; උපාසිකා, ආසඞ්ඛ්‍යාවිතාවූ උපාසිකා තොමෝ; දිස්වා, දැක; තිණ්ණං ධම්මානං, තුන්ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන, අන්‍යතරවූ; පාරාජිකෙන වා, මෛථුන ධර්ම පාරාජිකායෙන් හෝ; සඞ්ඝාදිසෙසෙන වා, කායසංසර්ග සඞ්ඝාදිසෙසයෙන් හෝ; පාචිත්තියෙන වා, නිෂද්‍ය මූලක පාචිත්තියෙන් හෝ; වදෙය්‍ය, කියානම්; භික්ඛු, මහණ තෙමේ; නිසජ්ජං, නිෂද්‍යය; පටිජානමානො; ප්‍රතිඥාකරන්නේනම්; තිණ්ණං ධම්මානං, තුන් ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන, අන්‍යතරවූ; පාරාජිකෙනවා, පාරාජිකාපත්තියෙන් හෝ; සඞ්ඝාදිසෙසෙනවා, සඞ්ඝාදිසෙසයෙන් හෝ; පාචිත්තියෙනවා, පාචිත්තියෙන් හෝ; කාරෙතබ්බො, කටයුත්තේ ය; සද්ධෙය්‍ය වචසා, හැදහිය යුතු වචන ඇති; සා උපාසිකා, ඒ උපාසිකා තොමෝ; යෙනවා; නිෂද්‍යාදීන් යම් ආකාරයක් හා සමග; වදෙය්‍ය, මෛථුනාදීන් ආරෝපනය කොට කියාද; සො භික්ඛු, ඒ මහණ තෙමේ; තෙන, ඒ ප්‍රතිඥයෙන්; කාරෙතබ්බො, කටයුත්තේයි; අයං ධම්මො මේ ධර්මය; අනියතො, ප්‍රතිඥයෙන් කටයුතු බැවින් අනියත නම් වේ. 1.

ආසනං, ආසනය; නහෙව ඛො පන පටිච්ඡන්නං හොති, භාවාට කුඩ්‍යාදීන් ප්‍රතිච්ඡන්න නොවේද; නාලං කම්මනියං, මෛථුන සෙවනයට යොග්‍ය නොවේද, මාතුගාමං, සභාසභාය හෙපුල් දන්නා මිනිස් මාගමකට; දුට්ඨුල්ලාහි වාචාහි, දුට්ඨුල්ල වාචායෙන්; ඔභාසිතුං, බණින්නට; අලඤ්ච ඛො හොති, යොග්‍ය වේද; යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ; තථාරූපෙ, එබඳුවූ; රහො, පිය බස් නො අසන තන්හිවූ; ආසනෙ, අස්නෙහි; එකො, එකලාවූයේ; එකාය, එකලාවූ; මාතුගාමෙන සද්ධිං, මිනිස් මාගමක හා සමග; නිසජ්ජං කප්පෙය්‍ය, හිඳ ගනේද; තමෙනං, ඒ මහණහු; සද්ධෙය්‍යවචසා, හැදහියයුතු වචනඇති; උපාසිකා, උපාසිකා තොමෝ; දිස්වා, දැක; ද්වින්නං ධම්මානං, ද්විවිධවූ ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන, අන්‍ය තරවූ; සඞ්ඝාදිසෙසෙන වා, කායසංසර්ගයෙන් හා දුට්ඨුල්ල

ජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයම්පි ධම්මො අනියතො 2.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ අනියතා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති

අ නි ය තු ද්දෙ සො

—— 0 ——

---

වචනයෙන් වන සඟ වෙසෙසින් හෝ, පාචිත්තියෙනවා නිදන් මූලකපාචිත්තියෙන් හෝ; වදෙය්‍ය,කියන්නේද; භික්ඛු,මහණතෙම: නිසජ්ජං,හිඳීම; පටිජානමානො.ප්‍රතිඥාකරන්නේම්;ද්වින්නං ධම්මානං, මිච්ඡාපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන, අන්‍යතරවූ; සඞ්ඝාදිසෙසෙනවා; සඟ වෙසෙසින් හෝ, පාචිත්තියෙනවා; පාචිත්තියෙන් හෝ; කාරෙතබ්බො, කටයුත්තේයි; සද්ධෙය්‍යවචසා, හැදහියයුතු වචනඇති; සා උපාසිකා, ඒ උපාසිකාතොමෝ; යෙනවා, නිශ්දයාදී යම් ආකාරයක් හා සමග; වදෙය්‍ය, කායසංසර්ගාදීන් ආරොපණය කොට කියාද; සො භික්ඛු, ඒ මහණ තෙමේ; තෙන කාරෙතබ්බො, ඒප්‍රතිඥයෙන් කටයුත්තේයි, අයම්පි ධම්මො, ඒධර්මයද, අනියතො ප්‍රතිඥයෙන් කටයුතු හෙයින් අනියත නම්වේ.

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ද්වෙ අනියතා ධම්මා, මිච්ඡ අනියතා පත්තීහු; උද්දිට්ඨා ඛො, උද්දෙශකළදහ; තත්ථ, ඒ මිච්ඡ අනියතාපත්තීයෙහි ලා; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි,විචාරමි; එත්ථ, මේ අනියතාපත්තීහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවන වටත් දු විචාරමි, එත්ථ, මේ අනියතාපත්තීයෙහි පරිසුද්ධා කච්චි, පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වනවටත් දු විචාරමි එත්ථ, මේ අනියතාපත්තීයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; ආයස්මන්තො ආයුෂ්මත්හු; එත්ථ, මෙහි; පරිසුද්ධා, පිරිසුදුහ, තස්මා තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතයහ, එතං, මේතුෂ්ණීම්භාවය, එවං ධාරයාමි,එසේහෙයින් දරමි; පිරිසුදුහෙයිනැයි සලකමි.

අනියතොද්දෙසො නි.

———

**ඉමෙ ඛො පනා යසමනෙතා තිංස නිසසගගියා පාචිතතියා ධමමා උදෙදසං ආගචඡනති**

**නිටඨිත චීවරසමිං පන භිකඛුනා උබභතසමිං කඨිනෙ දසාහ පරමං අතිරෙක චීවරං ධාරෙතබබං තං අතිකකාමයතො නිසසගගියං පාචිතතියං 1**

**නිටඨිතචීවරසමිං පන භිකඛුනා උබභතසමිං කඨිනෙ එකරතතමපි චෙ භිකඛු තිචීවරෙන විපපවසෙයය අඤඤතර භිකඛු සමමුතියා නිසසගගියං පාචිතතියං 2**

**නිටඨිත චීවරසමිං පන භිකඛුනා උබභතසමිං කඨිනෙ භිකඛුනො පනෙව අකාල චීවරං උපපජෙජයය ආකඞඛමානෙන භිකඛුනා පටිගගහෙතබබං පටිගගහෙතවා ඛිපපමෙව කාරෙතබබං නො චසස පාරිපූරි මාසපරමං තෙන භිකඛුනා තං චීවරං නිකඛිපිතබබං ඌනසස පාරිපූරියා සතියා පචචාසාය තතො චෙ උතතරිං නිකඛිපෙයය සතියාපි පචචාසාය නිසසගගියං පාචිතතියං 3**

---

: ආයසමනෙතා ආයුෂමත්නි, ඉමෙ ඛො පන තිංස නිසසගගියා පාචිතතියා ධම්මා, මේ තිස්නිසගිපචිතිඇවැත්හු; උදෙදසං තමතමන්ගේ ස්වරූපයෙන් උදෙසියයුතුබවට; ආගචඡනති, පැමිණෙත්.

නිඨිත චීවරසමිං, සිවුරුකොට නිමිකල්හි උබභතසමිං කඨිනෙ, කෙලින් උදුලකල්හි, භිකඛුනා; භික්ෂූහු විසින්; දසාහපරමං, දශ දවසක් පරම කොට ඇති කාලයක්; අතිරෙකචීවරං, නොඉටු නො විකැපූ සිවුර; ධාරෙතබබං, දරියයුතුයි; තං, ඒසිවුර අතිකකාමයතො, දසාහපරම්කාලය ඉක්මවන්නාහට; නිසසගගියං පාචිතතියං නිසඟි පචිතිවේ. 1.

භිකඛුනා, භික්ෂූහුගේ; නිඨිතචීවරසමිං සිවුරුකොට නිමිකල්හි උබභතසමිං කඨිනෙ, කෙලින් උදුලකල්හි; භිකඛු, මහණතෙමේ; එකරතතමපි එකරැයකුදු තිචීවරෙන සිවුරුනමින් ඉටූ තුන්සිවුරෙන්; භිකඛුසමමුතියා, අඤඤතර, සඞඝ සම්මතියක් නැතිව; විපපවසෙයය චෙ, විප්‍රයොව වෙසේනම්; නිසසගගියං පාචිතතියං, නිසඟි පචිතිවේ. 2.

භිකඛුනා, භික්ෂූහුගේ; නිඨිතචීවරසමිං, සිවුරුකොට නිමිකල්හි; උබභතසමිං කඨිනෙ, කෙලින් උදුලකල්හි; භිකඛුනො පනෙව, භික්ෂූහටම; අකාලචීවරං උපපජෙජයය, නොකල් සිවුරක් උපන්නම්; ආකඞඛමානෙන භිකඛුනා, කැමති භික්ෂූහු විසින්; පටිගගහෙතබබං,

**යොපන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍යවා රජාපෙය්‍යවා ආකොටාපෙය්‍යවා නිස්සග්ගියං පාචිත්තියං. 4**

**යොපන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවත්තකා නිස්සග්ගියං පාචිත්තියං. 5.**

**යොපන භික්ඛු අඤ්ඤාතකං ගහපතිංවා ගහපතානිංවා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා නිස්සග්ගියං පාචිත්තියං, තත්ථායං සමයො අච්ඡින්නචීවරොවා හොති භික්ඛු නට්ඨචීවරොවා අයං තත්ථ සමයො. 6.**

---

පිළිගනයුතුය; පටිග්ගහෙත්වා, පිළිගෙණ; ඛිප්පමෙව, වහාම; කාරෙතබ්බං, කරවියයුත්තේය; නොචෙ පාරිපූරි අස්ස, ඉදින් සම්පූර්ණ නොවීනම්; හෙවත් නොසෑහේනම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; ඌනස්ස පාරිපූරියා, ඌනචීවරයාගේ පූරණය පිණිස; සතියා පච්චාසාය, අයලින් සිවුරක් ලැබෙසියන ආසාවක් ඇතිකල්හි; තං චීවරං, ඒ සිවුර; මාසපරමං, මසක් පරමකොට; නික්ඛිපිතබ්බං, නොඉවා නොවිකපා තිබියයුත්තේය; සතියාපි පච්චාසාය. චීවරාසාවක් ඇතිකල්හිදු; තතො උත්තරිං, ඒ මාසපරමයෙන් මත්තෙහි; නික්ඛිපෙය්‍යචෙ, තබානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිති වේ. 3.

යොපන භික්ඛු, යම්කිසි මහණෙක්, අඤ්ඤාතිකාය භික්ඛුණියා, නොනෑ මෙහෙණක ලවා; පුරාණචීවරං, මදකුදු වැළඳගැන්මෙන් පුරාණ නම්වූ සිවුරක්; ධොවාපෙය්‍යවා, සොඩවානම් හෝ; රජාපෙය්‍යවා, රජන් කරවානම් හෝ; ආකොටාපෙය්‍යවා, කොටවා නම් හෝ; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිති වේ 4.

යොපන භික්ඛු, යම් මහණෙක්; අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො, නොනෑ මෙහෙණක අතින්; චීවරං, විකප්පුන් පොහොනා සිවුරක්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර, යටත්පිරිසෙයින් අරළුකඩකුදු දීගැන්ම තබා; පටිග්ගණ්හෙය්‍ය, පිළිගණීනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ. 5.

යොපන භික්ඛු, යම්කිසි මහණෙක්; අඤ්ඤාතකං, නොනෑ; ගහපතිංවා, ගෘහපතියෙක් හෝ; ගහපතානිංවා, ගිහිණියක හෝ; සමයා අඤ්ඤත්‍ර, සමය තබා; චීවරං, විකප්පුන් පොහොනා සිවුරක්; විඤ්ඤ

තඤ්චේ භික්ඛුං අඤ්ඤාතකො * ගහපතිවා ගහපතානිවා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං තතොචෙ උත්තරිං සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං. 7.

භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්සවා ගහපතානියාවා චීවර චෙතාපන්නං උපක්ඛටං හොති ඉමිනා චීවර චෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙස්සාමීති තත්‍ර චෙසො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය සාධු වත මං ආයස්මා ඉමිනා චීවර චෙතාපන්නෙන එවරූපංවා එවරූපංවා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහීති කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං. 8

---

ජෙය්‍ය, ඉල්වානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිතියෙවි; තත්‍ර, ඒ චීවරවිඤ්ඤත්‍යෙහි; අයං සමයො, මේ සමයයි; භික්ඛු, මහණ තෙමේ; අච්ඡින්න චීවරොවා හොති, පැහැරගන්නාලද සිවුරු ඇත්තේ හෝ වේද; නට්ඨ චීවරොවා, නටසිවුරු ඇත්තේ හෝ වේද; අයං තත්‍ර සමයො, මේ එහි සමයයි. 6.

තං, ඒ අච්ඡින්නාදි චීවරඇති; භික්ඛුං, භික්ෂුහු; අඤ්ඤාතකො, නොනෑ; ගහපතිවා, ගෘහපතියෙක් හෝ; ගහපතානිවා, ගිහිණියක් හෝ; අභිහට්ඨුං, කයින් වචසින් එලවා; බහූහි චීවරෙහි, බොහෝ සිවුරෙන්; පවාරෙය්‍යචෙව, පවරානම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂුන් විසින්; තතො, ඒ එලවූ සිවුරෙන්; සන්තරුත්තරපරමං, අඳනාව හා සමග පොරෝනාව පරම්කොටඇති; චීවරං, සිවුරු; සාදිතබ්බං, ඉවසිය යුතුය; තතොචෙ උත්තරිං, හඳනා පොරෝනා පමණකින් වැඩියක්; සාදියෙය්‍යචෙව, ඉවසානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිතිවේ. 7.

භික්ඛුං පනෙව උද්දිස්ස, භික්ෂුවක්හු උදෙසා; අඤ්ඤාතකස්ස ගහපතිස්සවා, නොනෑ ගෘහපතියෙකු විසින් හෝ; ගහපතානියාවා, නොනෑ ගිහිණියක් විසින් හෝ; ඉමිනා චීවර චෙතාපන්නෙන, මේ සිවුරු මිලයෙන්; චීවරං, සිවුරක්; චෙතාපෙත්වා, විකිණගෙණ; ඉත්ථන්නාමං භික්ඛුං, මෙනම් භික්ෂුහු; චීවරෙන, සිවුරකින්; අච්ඡාදෙස්සාමීති, වසමියි; හෙවත් මෙනම් භික්ෂුහට සිවුරක් දෙමියි; චීවර චෙතාපන්නං, සිවුරු මිලයක්; උපක්ඛටං හොති, රැස්කොට

---

* "තඤ්චෙ අඤ්ඤාතකො" තිපි පාඨො.

**භික්ඛුං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙකචීවරචෙතාපන්නානි උපක්ඛටානි හොන්ති ඉමෙහි මයං පච්චෙකචීවරචෙතාපන්නෙහි පච්චෙකචීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙහි අච්ඡාදෙස්සාමාති, තත්‍ර චෙසො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙක චීවරචෙතාපන්නෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ උභොව සන්තා එකෙනාති කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං. 9.**

---

තබතලද්දේ වේද; සො භික්ඛු, ඒ මහණ තෙමේ; පුබ්බෙ අප්පවාරිතො, පෙර නොපවරණ ලද්දේ; තත්‍ර උපසඞ්කමිත්වා, ඒ ගෘහපති ආදීහු යම් තැනෙක්හිද එතැනට එළඹ; ආයස්මා, ඇවැත; ඉමිනා චීවරචෙතාපන්නෙන, මේ සිවුරු මිලයෙන්; එවරූපංවා එවරූපං වා චීවරං, මෙබඳු හෝ මෙබඳු හෝ සිවුරක්; චෙතාපෙත්වා, ගෙණ; මං අච්ඡාදෙහි, මා වළඳගන්ව; සාධුවත ඉති, මෙසේ කෙළෙසිවිනම් මැනවයි; කල්‍යාණකම්‍යතං උපාදාය, යහපතක් කැමැතිබව සිතින් ගෙණ; චීවරෙ, සිවුරෙහි; විකප්පං, අධිකවිධානයට; ආපජ්ජෙය්‍ය වේ, පැමිණියේවිනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිස්සග්ගිපචිත්තිවේ. 8.

භික්ඛුං පනෙව උද්දිස්ස, භික්ෂුවක්හු උදෙසා; * උභින්නං අඤ්ඤාතකානං ගහපතීනංවා, නොනෑ ගෘහපතීන් දෙන්නෙකු විසින් හෝ; ගහපතානීනංවා, නොනෑ ගෘහිණීන් දෙන්නෙකු විසින් හෝ; මයං, අපි; ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි, මේ වෙන්වෙන්වූ සිවුරු මිලයෙන්; පච්චෙක චීවරානි චෙතාපෙත්වා, වෙනවෙන සිවුරු ගෙණ; ඉත්ථන්නාමං භික්ඛුං, මෙනම් භික්ෂුවක්හට; චීවරෙහි අච්ඡාදෙස්සාමහි, සිවුරු දෙම්හයි කියා; පච්චෙකචීවර චෙතාපන්නා, ප්‍රත්‍යෙක චීවර මූලයෝ; † උපක්ඛටා හොන්ති, රැස්කරණලදවෙද්ද; සො භික්ඛු, ඒ මහණ තෙමේ; පුබ්බෙ අප්පවාරිතො, පෙර නොපවරණ ලද්දේ; තත්‍ර උපසඞ්කමිත්වා, ඒ ගෘහපතිආදීහු යම්තැනකද එතනට එළඹ; ආයස්මන්තො, ආයුෂ්මත්නි; උභොව සන්තා, නෙපිදෙදෙනාහුම එක්ව; ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි, මේ ප්‍රත්‍යෙක චීවරමූලයෙන්; එවරූපංවා එවරූපංවා චීවරං, මෙබඳු හෝ මෙබඳු හෝ සිවුරක්; චෙතාපෙත්වා, ගෙණ; මං, මා; එකෙන අච්ඡාදෙථ, එකසිවුරකින්ම අච්ඡාදනයකරව; සාධුවතඉති, එසේ කළහු

---

* "භික්ෂුවක්හු නිසා" පොත්.  † "මූලයෙන්" පොත්.

භික්ඛුං පනෙව උද්දිස්ස රාජාවා රාජභොග්ගොවා බ්‍රාහ්මණොවා ගහපතිකොවා දූතෙන චීවර චෙතාපනනං පහිණෙය්‍ය ඉමිනා චීවරචෙතාපනෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙහීති, සොචෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවර චෙතාපනනං ආභතං පටිග්ගණ්හාතු ආයස්මා චීවර චෙතාපනනන්ති තෙන භික්ඛුනා සො දූතො එවමස්ස වචනීයො "නඛො මයං ආවුසො චීවරචෙතාපනනං පටිග්ගණ්හාම චීවරඤ්ච ඛොමයං පටිග්ගණ්හාම කාලෙන කප්පියන්ති" සොචෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය අත්ථිපනායස්මතො කොචි වෙය්‍යාවච්චකරො'ති

---

නම් වෑනවයි; කල්‍යාණකම්‍යතං උපාදය, යහපතක් කැමතිබව සිතින්ගෙණ; චීවරෙ, සිවුරෙහි; විකප්පං, අධික විධානයට; ආපජ්ජෙය්‍යචෙ, පැමිණියේවීනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ. 9.

භික්ඛුං පනෙව උද්දිස්ස, භික්ෂුවක්හු උදෙසා; රාජාවා, රජෙක් හෝ; රාජභොග්ගොවා, රාජමාත්‍යයෙක් හෝ; බ්‍රාහ්මණොවා, බමුණෙක් හෝ; ගහපතිකොවා, ගෘහපතියෙක් හෝ; ඉමිනා චීවරචෙතාපනෙනන, මේ සිවුරු මිලයෙන්; චීවරං චෙතාපෙත්වා, සිවුරක් ගෙණ; ඉත්ථංනාමං භික්ඛුං, මෙනම් භික්ෂුවක්හට; චීවරෙන අච්ඡාදෙහීති, සිවුරක් පිළිගන්වයි කියා; දූතෙන, දූතයා ලවා; පහවන් දූතයා අත; චීවරචෙතාපනනං, රන්රිදීඈ අකැප වතක්; පහිණෙය්‍ය, එවූයේවීනම්; සො දූතො, ඒ දූතතෙමේ; තං භික්ඛුං, ඒ භික්ෂුහු * කරා; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; ආයස්මන්තං උද්දිස්ස, ආයුෂ්මත්හු උදෙසා; ඉදං ඛො චීවරචෙතාපනනං, මේ හිරණ්‍යාදි චීවරමූල්‍යය; ආභතං, ගෙණෙනලද; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; චීවරචෙතාපනනං, චීවරමූල්‍යය; පටිග්ගණ්හාතුඉති, පිළිගන්වයි; එවං, මෙසේ; වදෙය්‍යචෙ, කීයේවීනම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; සො දූතො, ඒ දූතතෙමේ; ආවුසො, ඇවත; මයං අපි; චීවරචෙතාපනනං, අකැපසිවුරු මිලයෙන්; නඛො පටිග්ගණ්හාම, නොපිළිගණ්නුම්හ; මයං, අපි; කාලෙන, ප්‍රයොජනයක් ඇතිකල්හි; කප්පියං, කැප්වූ; චීවරංචඛො, සිවුරක්ම; පටිග්ගණ්හාමඉති, පිළිගණ්නුම්හයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතුවන්නේයි; සො දූතො, ඒ දූතතෙමේ; තං භික්ඛුං, ඒ භික්ෂුහට; ආයස්මතො, ආයුෂ්මත්හුගේ; කොචි වෙය්‍යාවච්චකරො, කිසි කප්පියකාරකයෙක්;

---

* "භික්ෂූන්" පොත්.

චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිත බ්බො ආරාමිකො වා උපාසකො වා එසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරො'ති, සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය, යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා, උපසඞ්කමතු ආයස්මා කාලෙන චීවරෙන තං අච්ඡාදෙස්ස තීති, චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපස ඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො'- අත්ථො මෙ ආවුසො චීවරෙනා'ති, ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරය මානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ අභිනිප්ඵාදෙය්‍ය චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං* තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතො උද්දිස්ස තිට්ඨමානො තං චීවරං

---

අත්ථිපනඉති, ඇද්දැයි; එවං, මෙසේ; වදෙය්‍යචෙ, කීයේවිනම්; භික්ඛවෙ, මහණෙනි; චීවරත්ථිකෙන භික්ඛුනා, සිවුරු කැමති මහණහු විසින්; වෙය්‍යාවච්චකරො, කැපකරුවු; ආරාමිකොවා, ආරාමිකයෙක් හෝ; උපාසකොවා, උපාසකයෙක් හෝ; ආවුසො, ඇවිත; එසො මේතෙමේ; භික්ඛූනං, භික්ෂූන්ගේ; වෙය්‍යාවච්චකරොති, කප්පියකාරකයායි; නිද්දිසිතබ්බො, දැක්වියයුතු; සො දූතො, ඒ දූතතෙමේ; තං වෙය්‍යාවච්චකරං, ඒ කප්පියකාරකයා; සඤ්ඤාපෙත්වා, ගිවිස්වා;(සිවුරුගෙන දෙනපරිද්දෙන් නියොගකොට;)තං භික්ඛුං, ඒ භික්ෂුහු කරා; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; යං වෙය්‍යාවච්චකරං, යම් කප්පියකාරයෙකු; නිද්දිසි, මට දැක්විද; සො; ඒ තෙමේ; මයා, මාවිසින්; සඤ්ඤත්තො, (සිවුරුගෙණ දෙනපරිද්දෙන්) ගිවිස්වනලද; ආයස්මා, ආයුෂ්මත්තෙමේ; කාලෙන, සිවුරු කැමතිකලෙක; උපසඞ්කමතු, එළඹේවා; තං චීවරෙන අච්ඡාදෙස්සතීති, තුඹට සිවුරක් ගෙණදෙන්නේයයි; එවං, මෙසේ; වදෙය්‍යචෙ, කීයේවීනම්; භික්ඛවෙ, මහණෙනි, චීවරත්ථිකෙන භික්ඛුනා, සිවුරු කැමති භික්ෂුහු විසින්; වෙය්‍යාවච්චකරො, කප්පියකාරකතෙමේ; උපසඞ්කමිත්වා, එළඹ; ආවුසො, ඇවත; මෙ, මට; චීවරෙන අත්ථොති, සිවුරෙන් ප්‍රයොජන ඇතැයි; ද්වත්තික්ඛත්තුං දෙතුන්වරෙක; චොදෙතබ්බො, ඉල්වියයුත්තේය; සාරෙතබ්බො, සිහිකරවියයුත්තේය; ද්වත්තික්ඛත්තුං, දෙතුන්වරෙක; චොදයමානො, ඉල්වන්නේ; සාරයමානො, සිහිකරවන්නේ; තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඒ සිවුර නිපදවීනම්; ඉච්චෙතං, මෙසේ ඒ නිපදවීම්;

---

* “ඡක්ඛත්තුම්පරමං” සමහර

අභිනිප්ඵාදෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ අභිනිප්ඵාදෙය්‍ය ත තො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය නිස්ස ග්ගියං පාචිත්තියං—නො චෙ අභිනිප්ඵාදෙය්‍ය යතස්ස චීවරචෙ තාපන්නං ආභතං තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙ තබ්බො යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතා පන්නං පහිණිත්ථ න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනු භොති යුඤ්ජන්තායස්මන්තො සකං මා වො සකං විනස්සාති අයං තත්ථ සාමීචි 10.

චීවර වග්ගො පඨමො

—0—

---

කුසලං, මැනව; නොචෙ අභිනිප්ඵාදෙය්‍ය, ඉදින් නොනිපදවීනම්; චතුක්ඛත්තුං, සතරවරෙක;පඤ්චක්ඛත්තුං, පස්වරෙක; ඡක්ඛත්තුප රමං, සවරක් පරමකොට; තුණ්හීභූතෙන, තුෂ්ණීම්භූතවූවිසින්; උද්දිස්ස ඨාතබ්බං, උදෙසා සිටියයුතුයි; චතුක්ඛත්තුං, සතරවරෙක; පඤ්චක්ඛත්තුං, පස්වරෙක; ඡක්ඛත්තුපරමං, සවරක් පරමකොට; තුණ්හීභූතො, තුෂ්ණීම්භූතව, උද්දිස්ස තිට්ඨමානො, උදෙසා සිටින් නේ; තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඒ සිවුර නිපදවීනම්; ඉච්චෙතං, මෙසේ ඒ නිපදවීම; කුසලං, මැනව; තතො උත්තරිං, ඒ චොදනා ස්ථානපරිමාණයෙන් මත්තෙහි; වායමමානො, ව්‍යායාම කරන් නේ; තං චීවරං අභිනිප්ඵාදෙය්‍යචෙ, ඒ මෙසිවුර නිපදවීනම්; නිස්ස ග්ගියං පාචිත්තියං, නිසගිපචිති වේ; නොචෙ අභිනිප්ඵාදෙය්‍ය, ඉදින් නොනිපද වීනම්; යතො, රාජාදී යමක්හු කෙරෙන්; අස්ස, ඒ භික්ෂුහට; චීවරචෙතාපන්නං ආභතං, සිවුරුමිල ගෙණෙ න ලද්ද; තත්ථ, ඔහු සමීපයට; ආයස්මන්තො, ආයුෂ්මත්නි; තුම්හෙ, තෙපි; භික්ඛුං, උද්දිස්ස, යම් භික්ෂුවක්හු උදෙසා; යං ඛො චීවරචෙතාපන්නං, යම්සිවුරු මිලයක්; පහිණිත්ථ, එවූද; තං, ඒ සිවුරුමිලය; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; කිඤ්චිඅත්ථං, මඳද කටයුත්තක්; නානුභොති, නොනිපයයි; ආයස්මන්තො, ආයුෂ්මත් හු; සකං, තමන් සතුධනයට; යුඤ්ජන්තු, පැමිණෙත්වා; වොසකං, තොප සන්තකය; මා විනස්සාති, නොනස්වයි කියා; සාමංවා ගන්තබ්බං, භික්ෂූහු තමා විසින්හෝ යායුතුය; දූතොවා පාහෙ තබ්බො, දූතයෙක් හෝ යැවිය යුත්තේය; තත්ථ, එහි; අයං, මේ; සාමීචි, ලොකොත්තර ධම්මානුගත ප්‍රතිපත්තියෙකි. 10.

පලමුවන සිවුරුවගයි.

—0—

**යො පන භික්ඛු කොසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 1.**

**යො පන භික්ඛු සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 2**

**නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානෙන ද්වෙ භාගා සුද්ධකාළකානං එළකලොමානං ආදාතබ්බා තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං, අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාළකානං එළකලොමානං තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 3.**

**නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං, ඔරෙනචෙ භික්ඛු ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං 4.**

---

යොපන භික්ඛු, යම් මහණෙක්; කොසියමිස්සකං, තිහිරිහු මුසු කරණලද; සන්ථතං, එළුලොම් මුවාසන්ථතයක්; කාරාපෙය්‍ය, කරවානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිති වේ. 1.

යොපන භික්ඛු, යම් මහණෙක්; සුද්ධකාළකානං, හුදෙක් කළු වූ; එළකලොමානං, එළුලොමින්; සන්ථතං කාරාපෙය්‍ය, සන්ථතයක් කරවානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිති වේ. 2.

නවං පන සන්ථතං, අලුත් සන්ථතයක්; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂූන් විසින්; සුද්ධකාළකානං එළකලොමානං, හුදුකලුවූ එළුලොමින්; ද්වෙ භාගා, දෙකොටස්කෙනෙක්; ආදාතබ්බා, ගතයුත්තාහ; ඔදාතානං, සුදුඑළුලොමින්; තතියං, තුන්වනකොටස ගතයුතුය; ගොචරියානං, කිඹුල්වන් එළුලොමින්; චතුත්ථං, සතර වන කොටස ගතයුතුය; භික්ඛු, මහණතෙමේ; සුද්ධකාළකානං එළකලොමානං, හුදුකලු එළුලොමින්; ද්වෙභාගෙ, දෙකොටසක්ද; ඔදාතානං, සුදු එළුලොමින්; තතියං, තුන්වන කොටසද; ගොචරියානං, කිඹුල්වන් එළුලොමින්; චතුත්ථං, සතරවන කොටසද; අනාදා, නොගෙණ; නවං සන්ථතං, අලුත් සන්ථතයක්; කාරාපෙය්‍ය චෙ, කරවානම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිති වේ. 3.

භික්ඛුනා, භික්ෂූන් විසින්; නවං පන සන්ථතං, අලුත් සන්ථතයක්; කාරාපෙත්වා, කරවාගෙණ; ඡබ්බස්සානි, සවුරුද්දක්; ධාරෙතබ්බං, වැලඳනයුතුය; තං සන්ථතං, ඒසන්ථතය; විසජ්ජෙත්වාවා,

නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය, අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 5.

භික්ඛුනො පනෙව අද්ධානමග්ගප්පටිපන්නස්ස එළකලොමානි උප්පජ්ජෙය්‍යුං ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බානි, පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානි අසන්තෙ හාරකෙ, තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙපි හාරකෙ නිස්සග්ගියං පාචිත්තියං 6.

---

කිසිවක්හටදී හෝ; අවිස්සජ්ජෙත්වා, නොදීහෝ; භික්ඛුසම්මතියා අඤ්ඤත්‍ර, සඞ්ඝසම්මතියක් නැතිව; ඡබ්බස්සානං ඔරෙන, (සන්ථතයකළදවස් පටන්)සාවුරුද්දක් ඇතුළත;අඤ්ඤංනවං සන්ථතං, අනික් අලුත් සන්ථතයක්; කාරාපෙය්‍යචෙ, කරවාතම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිතිවේ. 4.

නිසීදනසන්ථතං පන, නිසීදනසන්ථතයක්; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂූනු විසින්; දුබ්බණ්ණකරණාය, විවර්ණකරණය පිණිස;පුරාණසන්ථතස්ස, පුරාණ සන්ථතයාගේ; සාමන්තා එක්පසෙකින්; සුගතවිදත්ථි,සුගත්වියතක්පමණතැන; ආදාතබ්බා, කපාගතයුතුය; භික්ඛු, මහණතෙමේ; පුරාණසන්ථතස්ස, පුරාණ සන්ථතයාගේ; සාමන්තා, එක්පසෙකින්; සුගතවිදත්ථිං, සුගත් වියතක් පමණතැන; අනාදා, නොගෙණ; නවංනිසීදනසන්ථතං, අලුත් නිසීදන සන්ථතයක්; කාරාපෙය්‍යචෙ, කරවාතම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිතිවේ. 5.

අද්ධානමග්ගපටිපන්නස්ස, දීඝමාර්ගයට ප්‍රතිපන්නවූ; භික්ඛුනො පනෙව, භික්ෂුවක්හට; එළකලොමානි, එළුලොම්හු; උප්පජ්ජෙය්‍යුං, උපන්නාහුනම්; ආකඞ්ඛමානෙන භික්ඛුනා, කැමති මහණහු විසින්, පටිග්ගහෙතබ්බානි, පිළිගතයුත්තාහු; පටිග්ගහෙත්වා, පිළිගෙණ; අසන්තෙහාරකෙ, අනික් ගෙණයන්නකු නැතිකල්හි; තියොජනපරමං,(ගත්තැන පටන්)තුන්යොදනක්පමණතැන්; සහත්ථා, සිය අතින්;හරිතබ්බානි,ගෙණයායුත්තාහු; තතො උත්තරිං, ඒ තියොජන පරමයෙන් මත්තෙහි; අසන්තෙපි හාරකෙ, අනික්ගෙණයන්නකුනැතිකල්හි; හරෙය්‍යචෙ,තෙමේ ගෙණයේනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිතිවේ. 6.

**යොපන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා නිස්සග්ගියං .පාචිත්තියං 7.**

**යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 8.**

**යොපන භික්ඛු නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 9.**

**යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 10**

**එළකලොමවග්ගො දුතියො**

—0—

---

යොපන භික්ඛු, යම් මහණෙක්; අඤ්ඤාතිකාය, භික්ඛුනියා, නො නෑ මෙහෙණක ලවා; එළකලොමානි, එළුලොම්; ධොවාපෙය්‍යවා, සොදවානම් හෝ; රජාපෙය්‍යවා, රජත්කරවානම් හෝ; විජටාපෙය්‍යවා, හවුල්හරවානම් හෝ; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිති වේ 7.

යොපන භික්ඛු, යම් මහණෙක්; ජාතරූපරජතං, රන්රිදීමසුකහවණු; උග්ගණ්හෙය්‍යවා, (තමා පිණිස තෙමේ) ගණීනම් හෝ, උග්ගණ්හාපෙය්‍යවා,(තමා පිණිස අනුන්ලවා)ගන්වානම් හෝ; උපනික්ඛිත්තං, තමාපිණිස එලවන ලද්දක්; සාදියෙය්‍යවා, (ප්‍රතික්ෂෙප නොකොට සිතින්)ඉවසානම් හෝ; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිතිවේ. 8.

යොපන භික්ඛු, යම් මහණෙක්; නානප්පකාරකං, අනෙකප්‍රකාරවූ; රූපියසංවොහාරං, රන්රිදී මසුකහවණු පෙරළිකිරීමට; සමාපජ්ජෙය්‍ය, පැමිණියේවීනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිති වේ. 9.

යොපන භික්ඛු, යම් මහණෙක්; නානප්පකාරකං, (සිවුරුඈ කැප බඩු විසින්) අනෙප්‍රකාරවූ; කයවික්කයං, ගණුදෙනුකිරීමට; සමාපජ්ජෙය්‍ය, පැමිණියේවීනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ. 10.

**දෙවන එළුලොම් වගයි.**

—0—

**දසාහපරමං අතිරෙකපත්තො ධාරෙතබ්බො තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං 1.**

**යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං, තෙන භික්ඛුනා සො පත්තො භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බො, යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො සො තස්ස භික්ඛුනො පදාතබ්බො:- අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බොති අයං තත්ථසාමීචි 2.**

**යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනියානි භෙසජ්ජානි සෙය්‍යථිදං? සප්පිනවනීතං තෙලං මධුඵාණිතං තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි, තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං 3.**

---

අතිරෙකපත්තො, නොඉටු නොවිකැප්පු පාත්‍රයෙක්; දසාහපරමං, දසදවසක් පමණකාල්; ධාරෙතබ්බො, දැරියයුත්තේය, වැලඳගතයුත්තේය; තං, ඒ පාත්‍රය; අතික්කාමයතො,(දසාහපරමකාලය) ඉක්මවන්නාහට; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිතිවේ. 1.

සොපන භික්ඛු, යම් මහණෙක්; ඌනපඤ්චබන්ධනෙන පත්තෙන, උනුපස්බාන්පාඇතියාව; අඤ්ඤං නවංපත්තං චෙතාපෙය්‍ය, අනික් අලුත් පාත්‍රයක් ඉල්වාගණීනම්, නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ. තෙන භික්ඛුනා, ඒ භික්ෂූහු විසින්; සොපත්තො, ඒ විනවූ පාත්‍රය තෙමේ; භික්ඛු පරිසාය, භික්ෂුපර්ෂද්හි; නිස්සජ්ජිතබ්බො, නිසදිය යුත්තේය; තස්සා භික්ඛුපරිසාය, ඒ මහණපිරිසැ; යොච පත්තපරියන්තො, හැමදෙනා ගන්වා කෙළවරලද යම් පාත්‍රයෙක් ඇද්ද; සො, ඒ පාත්‍රයතෙමේ; තස්ස භික්ඛුනො, ඒ භික්ෂූහට; භික්ඛු මහණ, තෙ, තා විසින්; අයං පත්තො, මේ පාත්‍රයතෙමේ; යාවභෙදනාය, බිඳීම දක්වා, ධාරෙතබ්බොති, වැලඳගතයුත්තේයයි කියා; පදාතබ්බො, දියයුත්තේයි; අයං තත්ථ සාමීචි, මේ එහි වත්. 2.

ගිලානානං භික්ඛූනං, ගිලන් මහණුන් විසින්; පටිසායනීයානි, අනුභව කටයුතුවූ; යානි ඛොපන තානි භෙසජ්ජානි, යම් ඒ බෙහෙද කෙනෙක් ඇද්ද; සෙය්‍යථීදං, ඔහු කවරහයත්; සප්පි, දුවූ තෙල්ය; නවනීතං, වෙඬරුය; තෙලං, තලතෙල් ඈ තෙල්ය; මධු, මිය; ඵාණිතං, උක්සකුරුය, (පැනිය) යන මොහුයි; තානි, ඒ බෙහෙජ්ජයෝ; පටිග්ගහෙත්වා, පිළිගෙණ; සත්තාහපරමං, සත්දවසක්

---

* "විකප්පු" සමහර

**මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං, අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බං; ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය, ඔරෙනඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය; නිස්සග්ගියං පාචිත්තියං 4**

**යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා පච්ඡා කුපිතො අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං 5.**

---

පරම කොට ඇති කාලයක්; සන්නිධිකාරකං, සන්නිධි කොට හෙවත් නගා තබා; පරිභුඤ්ජිතබ්බානි, අනුභව කට යුත්තාහ; තං අතික්කාමයතො, ඒ සත්තාහපරමකාලය ඉක්මවන්නාහට; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිති වේ. 3.

ගිම්හානං, ගිමන් සාරමස් අතුරෙන්; මාසො සෙසොති, මසෙක් සිටියේයයි කිවහැකි කල්හි; භික්ඛුනා, භික්ෂූහු විසින්; වස්සිකසාටික චීවරං, වැසිසළුසිවුර; පරියෙසිතබ්බං; නැපැවරූතැනින් සෙවිය යුතුය; ගිම්හානං, ගිමන් සාරමස් අතුරෙන්; අඩ්ඪමාසො සෙසොති, අඩමසෙක් සිටියේයයි කියගැකි කල්හි; කත්වා, (ගෙතනම් ඈ) කොට නිමවා, නිවාසෙතබ්බං, හැන්දයුත්තේය; ගිම්හානං, ගිමන් සාරමස් අතුරෙන්; මාසො සෙසොති, මසෙක් සිටියේයි; ඔරෙන, මෑතම හෙවත්;පශ්චිම මාසයට පූර්වභාගයෙහි;වස්සිකසාටිකචීවරං, වැසිසළු සිවුරු; පරියෙසෙය්‍ය චෙ, පිරියෙස්නේවිනම්ද; ගිම්හානං, ගිමන් සාරමස්අතුරෙන්; අඩ්ඪමාසො සෙසොති, අඩමසෙක් සිටියේයයි කියා; ඔරෙන, මෑතමහෙවත් පැසුලු අඩමසට † පූර්වභාගයෙහිම; කත්වා, කොට නිමවා; නිවාසෙය්‍ය, හඳතේවිනම්ද; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිතිවේ. 4

යොපන භික්ඛු, යම්මහණෙක්! භික්ඛුස්ස, භික්ෂුවක්හට; සාමං චීවරං දත්වා, මෙහෙකිරීම් ඈ කැමතිවතෙණම්ම සිවුරක්දී;කුපිතො, මෙහෙනොකරණ හෙයින් කිපියේ; අනත්තමනො, නොසතුටුසිත් ඇත්තේ; අච්ඡින්දෙය්‍යවා, සකසන්තායෙන් තෙමේ පැහැරගණී නම් හෝ; අච්ඡින්දාපෙය්‍ය වා, අනුන්ලවාපහරවා ගණීනම් හෝ නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිතිවේ 5.

---

† “පශ්චිමමසට” පොත්.

**යො පන භික්ඛු සාමං *සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 6.**

**භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානි වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීයති ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ අප්පෙව නාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති; එවඤ්ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය:- අන්තමසො පිණ්ඩපාතමත්තම්පි නිස්සග්ගියං පාචිත්තියං 7.**

---

යො පන භික්ඛු, යම් මහණෙක්; සාමං, තෙමේ ම; සුත්තං විඤ්ඤාපෙත්වා, සිවුරුපිණිස හු ඉල්වාගෙණ; තන්තවායෙහි (නො නෑ නොපැවරූ)පෙහෙරන් ලවා; චීවරං වායාපෙය්‍ය,(අකප්පිය විඤ්ඤත්තික) සිවුරුපිළියක් වියවා නම්; නිස්සග්ගියං පාචිත්තියං නිසගිපචිති වේ. 6.

භික්ඛුං පනෙව උද්දිස්ස, භික්ෂුවක්හු උදෙසා; අඤ්ඤාතකො ගහපති වා, නො නෑ ගිහිමිනිසෙක් හෝ; ගහපතානි වා, නො නෑගිහිමහගමක් . හෝ; තන්තවායෙහි, පෙහෙරන් ලවා; චීවරං වායාපෙය්‍ය, සිවුරුපිළියක් වියවා නම්; සො භික්ඛු, ඒ මහණ තෙම; පුබ්බෙ අප්පවාරිතො,(චීවරස්වාමින් විසින්) පළමු නො පවරණලදුව; තත්‍ර චෙ, ඒ පෙහෙරනු යම් තැනෙක වෙසෙද්ද එහි; තන්තවායෙ, පෙහෙරන් කරා; උපසඞ්කමිත්වා, එළඹ; ආවුසො, ඇවැත්නි; ඉදං චීවරං, මේ සිවුරුපිළිය; මං උද්දිස්ස වීයති, මා නිසා වියනුලැබෙයි; ආයතඤ්ච කරොථ, දිගු ද කරව්; විත්ථතඤ්ච; පලළු ද කරව්; අප්පිතඤ්ච, ඝන ද කරව්; සුවීතං ච, හැම තැන් සමකොට වියනලද්ද ද කරව්; සුප්පවායිතඤ්ච, හැමතැනම හු සමකොට තනති පහරණ ලද්ද ද කරව්; සුවිලෙඛිතඤ්ච; වලයෙන් මනාකොට ගහනලද්ද ද කරව්;සුවිතච්ඡිතඤ්ච කරොථ කොසෙසසන් ගසා මනාකොට මදනා ලද්දද කරව් මයම්පි, අපි දු; ආයස්මන්තානං, ආයුෂ්මතුන්ට; කිඤ්චිමත්තං, කිසිවක්; අනුප දජ්ජෙය්‍යාම, දුන්නාමෝ නම්; අප්පෙව නාම ඉති, යෙහෙකැයි කියා; චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය චෙ, සිවුරෙහි අධිකවිධානයට පැමිණී

---

* "සාමඤ්ඤුව" සන්නයෙහි

දසාහානාගතං කත්තිකතෙමාසික* පුණ්ණමං භික්ඛුනො පනෙව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං පටිග්ගහෙත්වා යාව චීවරකාල සමයං නික්ඛිපිතබ්බං තතො චෙ උත්තරිං† නික්ඛිපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං. 8.

උපවස්සං ඛො පන කත්තිකපුණ්ණමං යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො ආකඞ්ඛමානො තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය, සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය, ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං, තතො චෙ උත්තරිං විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං. 9.

---

දේවිනම්; එවඤ්ච වත්වා, මෙසේදකියා; සො භික්ඛු, ඒ මහණ තෙමේ; කිඤ්චිමත්තං, කිසිවක්; අන්තමසො, යටත්පිරිසෙයින්; පිණ්ඩපාතමත්තම්පි, ආහාරමාත්‍රයක්හුදු ;අනුපදජ්ජෙය්‍ය, දුන්නේවීනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිතිවේ. 7

කත්තිකතෙමාසිකපුණ්ණමං, වප්මස මැදිපොහොය; දසාහානාගතං, පඤ්චමියෙහි පටන් දසදවසකින් අසම්ප්‍රාප්තකල්හි හෙවත් විසේනිය පටන් මැදිපොහොය හා එක්ව එකොළොස් දවස මුලුල්ලෙහිම; භික්ඛුනො පනෙව, භික්ෂුවක්හට; අච්චෙක චීවරං, (ගම්කාදීන් විසින් දෙන) ඉක්මන් සිවුරක්; උප්පජ්ජෙය්‍ය, උපන්නේවීනම්; අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා, අත්‍යායික චීවරයෙකැයි දන්නා භික්ෂුණු විසින්; පටිග්ගහෙතබ්බං, පිළිගතයුත්තේය; පටිග්ගහෙත්වා, පිළිගෙණ; යාවචීවරකාලසමයං, යම්තාක් චීවරකාලසඞ්ඛ්‍යාතසමය ද ඒතාක්; නික්ඛිපිතබ්බං, (මේ අත්‍යායිකචීවරයෙකැයි සලකුණක් කොට) තිබියයුතු; තතො උත්තරිං, ඒ චීවරකාලසමයෙන් මත්තෙහි; නික්ඛිපෙය්‍ය ච,(නො ඉටා නො විකපා) තබන්නේ වී නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිතිවේ. 8.

උපවස්ස ඛො පන, පෙරවස් වැස; කත්තිකපුණ්ණමං,(පැවරු තැන පටන්) ගිල්මස මැදිපොහොය දක්වා මසක් මුලුල්ලෙහි; ආරඤ්ඤකානි, අරණ්‍යයෙහි කරණලද; සාසඞ්කසම්මතානි, ආසඞ්කාසහිත හයි දන්නාලද; සප්පටිභයානි, බලවත්වූ භය ඇති; යානි ඛො පන

---

* "තෙමාසික" සමහර සිංහලපොත් † "උත්තරි" බුරුම.

යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං 10.

පත්තවග්ගො තතියො.

---

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි, පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා.

—0—

---

තානි: සත්තාසනානි, යම් ඒ සෙනසුන් කෙණෙක්ඇද්ද; තථාරූපෙසු සෙනාසනෙසු, එබඳු සෙනස්නෙහි; විහරන්තො, වසන්නාවූ; භික්ඛු, ආරණ්‍යකභික්ෂුතෙම; ආකඞ්ඛමානො, (සොරබියෙන්)සිවුරු සැඟවියටිවූයේ; තිණ්ණං චීවරානං, තුන්සිවුරු අතුරෙන්; අඤ්ඤතරං චීවරං, එක්තරාසිවුරක්; අන්තරඝරෙ, හාත්පස ගොචර ග්‍රාමයෙහි; නික්ඛිපෙය්‍ය, තබන්නේය; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; තෙන චීවරෙන විප්පවාසාය; ඒ (අන්තරඝරේ තිබූ)සිවුරෙන් වියො ව විසීම පිණිස; කොචිදෙව පච්චයො සියා, (ග්‍රාමාන්තරයකට යන) කිසිකටයුත්තෙක් ඇත්නම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; ඡාරත්තපරමං, සරැයක් පමණ කාලයක්; තෙන චීවරෙන, ඒ සිවුරෙන්; විප්පවසිතබ්බං, වියො ව විසියයුතු; අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, සඞ්ඝසම්මතියක් නැතිව; තතො උත්තරිං, ඒ ඡාරත්ත පරමයෙන් මත්තෙහි; විප්පවසෙය්‍ය චෙ, වියො ව වෙසේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟිපචිතිවේ. 9.

යො පන භික්ඛු, යම් මහණෙක්; පරිණතං, (දෙම්හ යනාදීන් සඟහට) පිරිණාමිතලද; සඞ්ඝිකං, එහෙයින්ම සඞ්ඝසන්තකවූ; ලාභං, චීවරාදී වස්තුව; ජානං, දන්නේ හෙවත් දැන දැන; අත්තනො පරිණාමෙය්‍ය, තමහට නතු කෙරේනම්; නිස්සග්ගියංපාචිත්තියං, නිසඟි පචිතිවේ. 10

තුන්වන පාත්‍රවගයි.

—0—

ආයස්මන්තො, ආයුෂ්මත්නි; තිංස නිස්සග්ගියා පාචිත්තිය, ධම්මා, තිස් නිසඟිපචිති ඇවැත්හු; උද්දිට්ඨාඛො, උදෙසන ලදහ;

**ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

**සම්පජාන මුසාවාදෙ පාචිත්තියං 1**
**ඔමසවාදෙ පාචිත්තියං 2.**
**භික්ඛුපෙසුඤ්ඤෙ පාචිත්තියං. 3.**

**යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තියං. 4.**

---

තත්‍ථ, එහි; ආයස්මන්ත, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; එත්‍ථ, මේ නිස්සග්ගිපචිත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවනවටත් විචාරමි; එත්‍ථ, මේ නිස්සග්ගිපචිත්තියෙහි; පරිසුද්ධාකච්චි, පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන් වනවටත් විචාරමි; එත්‍ථ, මේ නිස්සග්ගිපචිත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; එත්‍ථ, මෙහි; ආයස්මන්තා, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසුදුහ; තස්මා තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතයහ; එතං, මේ තුෂ්ණීම්භාවය; එවං ධාරයාමි, එසේහෙයින් දරමි; පිරිසිදුහෙයිතැයි සලකමි.

**නිස්සග්ගිපචිත්තිවේ.**

—— 0 ——

ආයස්මන්තෙනි, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන ද්වෙ නවුති පාචිත්තියා ධම්මා, මේ දෙයානූ පාචිත්තියාපත්තිහු; උද්දෙසං, (තමන් තමන්ගේ ස්වරූපයෙන්) උදෙසියයුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.

සම්පජානමුසාවාදෙ, දැන දැන මුසවා කීමෙහි හෙවත් දැන දැන මුසවා කීම නිමිත්ත කොටගෙණ; පාචිත්තියං, පචිති ඇවැත්වේ 1.

ඔමසවාදෙ, උපසම්පන්නක්හට ජාත්‍යාදීන් ගටා බිණීමෙහි; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 2.

භික්ඛුපෙසුඤ්ඤෙ, භික්ෂූන් ඔවුනොවුන් කෙරෙහි ප්‍රියබවනස්නා කාරණ කේලාම් කීමෙහි; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 3

යො පන භික්ඛු, යම් මහණෙක්; අනුපසම්පන්නං, අනුපසම්පන්නයකු; ධම්මං, පාලිධර්මය, පදසො, පදාදිවශයෙන්; වාචෙය්‍ය, සහොච්චාරණ විසින් හදාරවා නම්; පාචිත්තියං, පචිතිඇවැත් වේ. 4

**යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං* දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං 5.**

**යො පන භික්ඛු මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං. 6.**

**යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන පාචිත්තියං. 7.**

**යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරොචෙය්‍ය භූතස්මිං පාචිත්තියං. 8.**

**යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා පාචිත්තියං. 9.**

---

යො පන භික්ඛු, යම් මහණෙක්; අනුපසම්පන්නෙන, අනුපසම්පන්නයකු හා; උත්තරිං දිරත්තතිරත්තං, දෙතුන්රැයකින් මත්තෙහි; සහසෙය්‍යං කප්පෙය්‍ය, (සතරවනරැ පටන්) කැටිව එකසෙනස්නෙහි හොවී නම්; පාචිත්තියං, පචිත් ඇවැත්වේ. 5.

යො පන භික්ඛු, යම් මහණෙක්; මාතුගාමෙන, මිනිස්ගෑනමක හා සමග; සහසෙය්‍යං කප්පෙය්‍ය, කැටිව එකසෙනස්නෙහි හොවීනම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 6.

යො පන භික්ඛු, යම්මහණෙක්, මාතුගාමස්ස, (සභ්‍ය සභ්‍ය තෙපුල්දන්නා) මිනිස්ගෑනමකට; අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන,(ශ්‍රවණොපචාරයෙහි සිටි)විඥවූ මිනුෂ්‍යපුරුෂයකු නැතිව; උත්තරිං ඡප්පඤ්චවාචාහි, සපස්පෙදෙකින් වඩා; ධම්මං දෙසෙය්‍ය, බණ කියානම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 7.

යො පන භික්ඛු, යම් මහණෙක්; අනුපසම්පන්නස්ස, අනුපසම්පන්නක්හට; උත්තරිමනුස්සධම්මං, (ධ්‍යානාදී භේදඇති) උත්තරීමනුෂ්‍යධර්මය; ආරොචෙය්‍ය, (ප්‍රථමධ්‍යානයට †සමවැදිමි යනාදීන් ඉදුරා)කියා නම්; භූතස්මිං, තමා කෙරෙහි ඒධර්මය විද්‍යමාන කල්හි පාචිත්තියං, පචිතිඇවැත්වේ. 8.

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛුස්ස, පරිජි නො අවන් භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලං ආපත්තිං, සඞ්ඝාදිසෙසාපත්තියක්; අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, සඞ්ඝසම්මුතියක් නැතිව; අනුපසම්පන්නස්ස, අනුපසම්පන්නක් හට; ආරොචෙය්‍ය, (සවිස්තර කොට)කියානම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 9

---

* "උත්තරි" බුරුම † "ප්‍රථමධ්‍යානයෙන්" සමහර.

**යො පන භික්ඛු පඨවිං* ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං. 10.**

**මුසාවාදවග්ගො පඨමො.**

—— ——

**භූතගාමපාතව්‍යතාය පාචිත්තියං 1.**

**අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං 2.**

**උජ්ඣාපනකෙ ඛීය්‍යනකෙ පාචිත්තියං 3**

**යො පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං† වා ගච්ඡෙය්‍ය පාචිත්තියං 4.**

---

යො පන භික්ඛු, යම්මහණෙක්; පඨවිං, අකැපපොළොව; ඛණෙය්‍ය වා, (අකැපබව දැනදැන තෙමේ) කණී නම් හෝ; ඛණාපෙය්‍ය වා, ("ඉමං පඨවිං ඛණ" යනාදින් අනුන් ලවා)කණවා නම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 10.

**පළමුවන මුසාවාදවගයි.**

——0——

භූතගාමපාතව්‍යතාය, තෘණවෘක්ෂාදීන්ගේ ඡේදනාදියෙහි; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 1.

අඤ්ඤවාදකෙ, ("සඟමැද චොදයමානව විචාළදෙය තබා") අනිකක් කීමෙහිද; විහෙසකෙ, (එසේම විචාළදෙය නො කියා)වෙහෙසදීමෙහිද; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 2.

උජ්ඣාපනකෙ, "සම්මති ලද භික්ෂූන් සෙසු භික්ෂූන් විසින්" ලාමක කොට සිතනා සේ (බණනවචනයෙහිද; ඛීය්‍යනකෙ,)ඔහුගේ නුගුණ භික්ෂූන් කෙරෙහි පහළවනසේ) බණනවචනයෙහිද; ‡පාචිත්තියං, පචිතිඇවැත්වේ. 3.

යො පන භික්ඛු, යම් මහණෙක්; සඞ්ඝිකං, සඟසතු; මඤ්චං වා, ඇඳක් හෝ; භිසිං වා, බිසක් හෝ; කොච්ඡං වා, සුවඳහොට ආදියෙන් කළබව්ලක් හෝ; අජ්ඣොකාසෙ, (ආකාශාන්තවෘක්ෂමූලාදී) අභ්‍යවකාශයෙහි; සන්ථරිත්වා වා, තෙමේ අතුට හෝ; සන්ථරාපෙත්වා වා, (අනුපසම්පන්නයකු ලවා) අතුරුවා හෝ; පක්කමන්තො, බැහැර යන්නේ; තං, ඒ මඤ්චාදිය; නෙව උද්ධරෙය්‍ය, සුදුසු තැනක තෙමේ හෝ තබා නොතබා නම්; න උද්ධරාපෙය්‍ය, අනුන්

---

* "පඨවිං" බු. † "අනාපුච්ඡා" යන්නා ‡ "ඛීණමෙහි ද" සමහර.

**යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං. 5.**

**යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය යස්ස සම්බාධො භවිස්සති සො පක්කමිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං. 6 |**

**යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සංඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තියං. 7.**

---

ලවා හෝ නගා නොතබා නම්; අනාපුච්ඡා වා, නොපිළිවිස හෝ හෙවත් දහරසාමණේරාදි සුදුසු කෙණෙකුන්ට පාවානොදී හෝ, ගච්ඡෙය්‍ය, යේනම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 4.

යො පන භික්ඛු, යම් මහණෙක්; සඞ්ඝිකෙ, සාඞ්ඝිකවූ; විහාරෙ සබ්බපච්ඡිම තෘණසයනාසන† යෙහි; සෙය්‍යං, හිසිවිල්ලම්කාදිවූ සාඞ්ඝිකශයනාවක්; සන්ථරිත්වා වා, (සඟින්ගෙණ) තෙමේ අතුට හෝ; සන්ථරාපෙත්වා වා, අනුන්ලවා අතුරුවා හෝ; පක්කමන්තො, දිසාවකට යන්නේ; තං, ඒ සෙය්‍යාව; නෙව උද්ධරෙය්‍ය, (වේගන් නොකනසේ තෙමේ හෝ) නගා නොතබා නම්; න උද්ධරාපෙය්‍ය, අනුන්, ලවා හෝ නගා නො තබ්බවා නම්; අනාපුච්ඡා වා ගච්ඡෙය්‍ය, නොපිලිවිස හෝ යේනම්; පචිත්තිය, පචිතිඇවැත්වේ 5.

යො පන භික්ඛු, යම් මහණෙක්; සඞ්ඝිකෙ විහාරෙ, සඟසතුසෙනස්නෙහි; පුබ්බුපගතං භික්ඛුං, පළමුකොට වෙසෙමින් සිටි මහණහු; ජානං, (නොනැගී* යන්නේයයි) දැන දැන; අනුපඛජ්ජ, මඬවා දීන්ගේ උපචාරයට වැද; යස්ස සම්බාධො භවිස්සති, යමක්හට විඩාවෙද; සො පක්කමිස්සතීති, හෙතෙමේම යන්නේ යයි; එතදෙව පච්චයං කරිත්වා, මෙම කාරණා කොට; අනඤ්ඤං (ගිලන්බව් ඈ,) අනිකක් කාරණා නොකොට; සෙය්‍යං කප්පෙය්‍ය, සයනක්‍රියා කෙරේ නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ 6.

යො පන භික්ඛු, යම් මහණෙක්; කුපිතො, කිපියේ; අනත්තමනො, නොසතුටුසිත් ඇත්තේ; භික්ඛුං, උපගත † භික්ෂුවක්හු; සඞ්ඝිකා විහාරා, සඟසතු සෙනස්නෙන්; නික්කඩ්ඪෙය්‍ය වා, තෙමේ හෝ පිටත්කෙරේ නම්; නික්කඩ්ඪාපෙය්‍ය වා, අනුන්ලවා හෝ පිටත් කරවා නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ 7.

---

† "සයනාදි" සමහර. † "උපසම්පන්න" සමහර.

* "නැගියං" සමහර.

**යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ උපරිවෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා සහසා* අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං. 8.**

**මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන යාව ද්වාරකොසා අග්ගළට්ඨපනාය ආලොකසන්ධිපරිකම්මාය ද්විත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං, තතො චෙ උත්තරිං අප්පහරිතෙපි ඨිතො අධිට්ඨහෙය්‍ය පාචිත්තියං. 9.**

---

යො පන භික්ඛු, යම් මහණෙක්; සංඝිකෙ විහාරෙ, සඟසතු සෙනස්නෙහි; වෙහාසකුටියා, (පොහොරු නොඅතුළ උස් යට මහල් ඇති) ආකාසකුටියගේ; උපරි, තුලාම්මතෙහි තුබනලද; ආහච්චපාදකං, වල්හිසවිද සිලුගන්වා කළ පා ඇති; මඤ්චංවා, සිහලු මුදුනෙහි ඇණනොනැසූ හැඳකහෝ; පීඨං වා, එසේමවූ පුටුයක හෝ; අභිනිසීදෙය්‍යවා, ඉඳිනම් හෝ; අභිනිපජ්ජෙය්‍ය වා, හොවිනම් හෝ පාචිත්තියං පචිති ඇවැත් වේ. 8.

මහල්ලකම්පන, (සස්වාමික බැවින්) මහල්ලක නම්වූ; විහාරං, උලලිතාදි විහාරය; කාරයමානෙන භික්ඛුනා, කරවන්නාවූ භික්ෂුහු විසින්; යාවද්වාරකොසා, යම්තාක් ද්වාරකොසයද එතාක් හෙවත් දොරබාවට හාත්පස දෙරියන් වියත් පමණ සියලු ප්‍රදේශය; අග්ගලට්ඨපනාය, දොරබාව නියවලවන පිණිස; "පුනප්පුනා ලිම්පිතබ්බො වා ලෙපාපෙතබ්බොවා" යනු පාඨ ශෙෂයි, තුන්මැටියෙහි මනෙත ගීඳු නැවත නැවත තමාහෝ මතිකාලෙප කටයුත්තේය; අනුන් ලවා හෝ කරවියයුත්තේය.; ආලොකසන්ධි, කවුළු සම්පත් හෙවත් වටින් කවුළු පොහොරු පලල පමණ ඇති ප්‍රදේශය; පරිකම්මාය, ඒ කවුළු තබා පිරියමපිණිස (ලෙපකටයුත්තේ හෝය කරවියයුත් තේ හෝයි;) අප්පහරිතෙ ඨිතෙන, ධාන්‍යමුද්ගමාසාදීන් නොවපුල තැන සිටියහු විසින්ද; ඡදනස්ස, තෘණ පණ්ණාදි ඡදනයාගේ; ද්විත්තිපරියායං, දෙතුන් පරික්ෂෙපයෙන් දෙතුන්මගෙක් හෝ; අධිට්ඨාතබ්බං, මතුමතෙහි සොයන විසින් විධාන කටයුත්තේය; තතො උත්තරිං, එකී තුන්මගින් හෝ තුන්පරික්ෂෙපයෙන් හොවිඩා අප්පහරිතෙ ඨිතොපි, අප්පහරිතස්ථානයෙහි සිටියේද; අධිට්ඨෙය්‍ය † වෙ, විධාන කෙරේ නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 9.

---

* "සහස්ස" යනු බුරුමපොත්හිද සමහරසිංහල පොත්හිද

† "අධිට්ඨහෙය්‍ය" පාලියං

යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා පාචිත්තියං. 10.

### භූතගාම වග්ගො දුතියො.

---

යො පන භික්ඛු අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තියං. 1.

සම්මතොපි චෙ භික්ඛු අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තියං. 2.

යො පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානා හොති භික්ඛුනි අයං තත්ථ සමයො. 3.

---

යො පන භික්ඛු, යම් මහණෙක්; උදකං, දිය; සප්පාණකං, පණුවන් ඇත්තේයයි; ජානං, දන්නේ; තිණංවා, තණ හෝ මත්තිකං වා, මැටි හෝ; සිඤ්චෙය්‍ය වා, (ඒ උදකයෙන් තෙමේහෝ) තෙමානම්; සිඤ්චාපෙය්‍යවා, (අනුන්ලවා) හෝ තෙමවානම්, පාචිත්තියං, පචිති ඇවැත් වේ. 10.

### දෙවන භූතගාම වගයි

---

යො පන භික්ඛු, යම් මහණෙක්; අසම්මතො, (භික්ෂුණ්‍යවවාද සම්මුතියෙන්) සම්මත නොකරණලද්දේ; භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදෙය්‍ය, (අෂ්ටගරුධර්මපාඨොච්චාරණකරණ විසින්) අවවාදකෙරේ නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 1.

සම්මතො භික්ඛු, සම්මතවූ මහණද; අත්ථං ගතෙසූරියෙ, හිරු අවරට ගියකල්හි; භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදෙය්‍යචෙ; (ගරුධර්මයෙන් හෝ අන්‍ය ධර්මයකින් හෝ) අවවාදකෙරේ නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 2

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛුනූපස්සයං, මෙහෙණවරට; උපසඞ්කමිත්වා, එළඹ; අඤ්ඤත්‍ර සමයා, සමය තබා; භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදෙය්‍ය, ගරුධර්මයෙන් අවවාදකෙරේනම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ—තත්ථ, එහි; අයං සමයො, මේ සමයයි; භික්ඛුනි, භික්ෂුණීතොමෝ; ගිලානාහොති, ගිලන්වේද; තත්ථ, එහි; අයං සමයො, මේ සමයයි.

**යො පන භික්ඛු එවං වදෙය්‍ය ආමිසහෙතු භික්ඛු භික්ඛුනියො ඔවදන්තීති පාචිත්තියං. 4.**

**යොපන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා පාචිත්තියං. 5.**

**යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා පාචිත්තියං. 6.**

**යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො සත්‍ථගමනීයො හොති මග්ගො සාසඞ්කසම්මතො සප්පටිභයො අයං තත්‍ථ සමයො 7.**

---

යොපනභික්ඛු, යම් මහණෙක්; භික්ඛු, භික්ෂූහු; ආමිසහෙතු, (චීවරාදි) ආමිස හෙතු කොට ගෙණ; භික්ඛුනියො ඔවදන්තීති, භික්ෂුණීන්ට අවවාදකෙරෙති යි; එවං, මෙසේ; වදෙය්‍ය, (සම්මත භික්ෂුන්ට) බෙනේනම්; පාචිත්තියං' පචිති ඇවැත්වේ. 4.

යො පන භික්ඛු, යම් මහණෙක්; අඤ්ඤාතිකාය භික්ඛුනියා නොනෑ මෙහෙණින්නකට; චීවරං, සිවුරක්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර, පෙරලි කිරීමක් නැතිව; දදෙය්‍ය, දේනම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 5.

යො පන භික්ඛු, යම් මහණෙක් අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑ මෙහෙණෙක ගේ; චීවරං, සිවුරක්; සිබ්බෙය්‍යවා, තෙමේ හෝ ගෙතුම් කෙරේනම්; සිබ්බාපෙය්‍ය වා, අනුන්ලවා හෝ ගෙතුම් කරවානම්; පාචිත්තියං පචිති ඇවැත්වේ 6

යො පන භික්ඛු යම් මහණෙක්; භික්ඛුනියා සද්ධිං, භික්ෂුණියක හා සමග; සංවිධාය, බැණගෙණ; එකද්ධානමග්ගං, එකඅද්දන්මග කට; අන්තමසො, යටත්පිරිසෙයින්; ගාමන්තරම්පි, තමන් හුන් ගමින් අනික් ගමකටද; අඤ්ඤත්‍ර සමයා, යායුතු සමය හැර; පටිපජ්ජෙය්‍ය, යේ නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ ___ තත්‍ථ, එහි; අයං සමයො, මේ සමයයි; මග්ගො, මාර්ගයතෙමේ; සත්‍ථගමනීයො, හොති, සත්වා වත් හා සමග යායුතු වේද; සාසඞ්කසම්මතො; ආසංකායයි දන්නාලද ද; සප්පටිභයො, සප්‍රතිභය ද; තත්‍ථ, එහි; අයං සමයො, මේ සමයයි. 7.

**යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධගාමිනිං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය පාචිත්තියං. 8.**

**යො පන භික්ඛු ජානං භික්ඛුනිපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා. පාචිත්තියං. 9.**

**යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං එකො එකායරහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං. 10.**

**භික්ඛුනොවාදවග්ගො තතියො.**

—0—

**අගිලානෙන භික්ඛුනා එකො ආවසථපිණ්ඩො භුඤ්ජිතබ්බො තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තියං. 1.**

---

යො පන භික්ඛු යම් මහණෙක්; භික්ඛුනියා සද්ධිං, භික්ෂුණියක හා එක්ව; සංවිධාය, බැණගෙණ; උද්ධගාමිනිංවා, උඩුගඟට යන නෞ අධො ගාමිනිං වා යටගඟට යනනෞ; එකංනාවං අභිරුහෙය්‍ය, එකනැවකට නැගේනම්; අඤ්ඤත්‍රතිරියං තරණාය, සරසයනනැව තබා; පාචිත්තියං, පචිති ඇවැත්වේ 8.

යොපන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැන දැන; භික්ඛුනීපරිපාචිතං, "භික්ෂූහුගේ ශීලඥානාදිගුණ මෙනා නෑ මෙනා පැවැරු කුලනට කියා" භික්ෂුණිය විසින් නිපදවනලද; පිණ්ඩපාතං, පඤ්චවිධ භොජනයෙන් අන්‍යතරභොජනයක්; පරිභුඤ්ජෙය්‍ය, වළඳනම්; පුබ්බෙ, භික්ෂුණීයගේ පරිපාචනයට පළමුකොටම; ගිහිසමාරම්භා අඤ්ඤත්‍ර, ගිහීන් සැපදූ භොජනය හැර; පාචිත්තියං, පචිති ඇවැත් වේ 9.

යොපන භික්ඛු, යම් මහණෙක්; එකො, එකලාවූයේ; එකාය, එකලාවූ; භික්ඛුනියා සද්ධිං, මෙහෙණකහා සමග; රහො නිසජ්ජං කප්පෙය්‍ය, රහස්හි හිඳනෙතේ නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 10.

**තුන්වන භික්ෂුණ්‍යවවාද වගයි.**

—0—

අගිලානෙන භික්ඛුනා, නො ගිලන් මහණහු විසින්; එකො, එකදවසකට නිසිවූ; ආවසථපිණ්ඩො. පුණ්‍යාර්ථීන් විසින් නියම කොට දිසානුදිසාවෙහි පැණවූ භොජනයක්; භුඤ්ජිතබ්බො, එකදවසක්ම වැළඳියයුත්තේය; තතො උත්තරිං, එයින් මතොතයි දෙවනදවස් පටන් ගෙණ; භුඤ්ජෙය්‍ය චෙ, වළඳනම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 1.

ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො නාවාභිරූහණසමයො මහාසමයො සමණභත්තසමයො අයං තත්ථ සමයො. 2.

පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අයං තත්ථ සමයො. 3.

භික්ඛුං පනෙව කුලං උපගතං පූවෙහි වා මන්ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය ආකඞ්ඛමානෙන භික්ඛුනා ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බා තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය පාචිත්තියං, ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං අයං තත්ථ සාමීචි. 4.

---

ගණභොජනෙ, ගණව පිළිගත් භොජනයෙහි නිමිත්තකොටගෙණ; අඤ්ඤත්‍ර සමයා, සමය හැර; පාචිත්තියං, පචිති ඇවැත්වේ; තත්ථ, ඒ ගණවපිළිගැන්මෙහි; අයං සමයො, මේසමයයි; ගිලානසමයො, ගිලන්සමයය; චීවරදානසමයො, (කෙළින් අතුරුපස්මසද නොඅතුළු කැතිසමයද යන) සිවුරුදෙනසමයය; චීවරකාර සමයො, සිවුරුකරණසමයය; අද්ධානගමනසමයො, අඩයොදනක් පමණකුදු යනසමයය; නාවාභිරූහණසමයො, නැවුනැගෙන සමයය; මහාසමයො, (යම්කලෙක්හි ගොදුරුගම භික්ෂූහු සතරදෙනෙක් සිඟා නොනැපෙත් නම්) එබඳුමහාසමයය; සමණභත්තසමයො, (යම්කිසි පැවිජියක්හු බතින් පවරණ) සමණභත්ත සමයය; තත්ථ, එහි ලා; අයං සමයො, මේ සමයයි. 2.

පරම්පරභොජනෙ, "භොජනෙන නිමන්තෙමි යනාදින් අකප්පිය වචනයෙන් බොහෝ දෙනෙකු පැවරූකල්හි" පැවරු පිළිවෙළින් නොවලඳ උත්පටිපාටියෙන් වැළඳීමෙහි; සමයා අඤ්ඤත්‍ර, සමය හැර; පාචිත්තියං, පචිතිඇවැත්වේ, තත්ථ, එහි; අයං සමයො, මේ සමයයි; ගිලානසමයො, ගිලන්සමයය; චීවරදාන සමයො, සිවුරුදෙනසමයය; චීවරකාරසමයො, සිවුරුකරණසමයය; තත්ථ, එහි; අයං සමයො, මේසමයයි. 3.

කුලං උපගතං, කුලයට එළඹී; භික්ඛුං පනෙව, භික්ෂුවක්හු; පූවෙහිවා, (පඬුරුපිණිස පිළියෙළකළ අභිරස ලඟඵැඇ) කානදෙසින් හෝ; මන්ථෙහි වා, (මාර්ගපකරණපිණිස පිළියෙළකළබද

**යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං. 5,**

**යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙය්‍ය හන්ද භික්ඛු ඛාද වා භුඤ්ජ වා'ති ජානං ආසාදනාපෙක්ඛා ‡ භුත්තස්මිං පාචිත්තියං. 6.**

**යො පන භික්ඛු විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං. 7.**

---

හත්තිලතණ්ඩුලාදි)මත්ථයෙන්හෝ අභිහට්ඨුං,එලවා; පවාරෙය්‍ය,පැවරුයේ වීනම්; ආකඞ්ඛමානෙන භික්ඛුනා, කැමතිභික්ෂූහු විසින්; ද්වත්තිපත්තපූරා, පිරූදෙතුන්පා කෙනෙක්; පටිග්ගහෙතබ්බා, පිළිගතයුත්තාහ; තතො උත්තරිං, තුන්පාත්‍රයකින් මතෙහි; පතිගණ්හාය්‍ය, පිළිගත්තේවීනම්; පාචිත්තියං, පචිතිඇවත්වේ. ~ ද්වත්තිපත්තපූරෙ, පිරූදෙතුන් පාත්‍රයන්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; තතො නීහරිත්වා, ලදතැනින් ගෙණහැර; භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං, භික්ෂූන් හා සමග බෙදූගතයුතුයි; තත්‍ර, එහි; අයං සාමීචි, මෙවති. 4.

යොපන භික්ඛු, යම් මහණෙක්; භුත්තාවී, වැලඳූයේ; පවාරිතො, පැවරුයේ;අනතිරිත්තං, අසිරිත් නොකළ; ඛාදනීයංවා,හෝ යාවකාලික(කනදෙයක්;)භොජනීයංවා,(ඔදනාදි)භොජනයක්හෝ; ඛාදෙය්‍ය වා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වලඳ නම් හෝ; පාචිත්තියං, පචිතිඇවැත් වේ. 5.

යොපන භික්ඛු, යම් මහණෙක්, භුත්තාවිං, වැලඳූ; පවාරිතං, පැවරූ; භික්ඛුං, භික්ෂුවක්හු; ජානං, පැවරි අවත්බව දැනදැන; ආසාදනාපෙක්ඛා, වෙදනාකටපිවුනුයේ; අනතිරිත්තෙන, අසිරිත් නොකළ; ඛාදනීයෙන වා, කනදෙයකින් හෝ; භොජනීයෙන වා, භොජනයකින් හෝ; අභිහට්ඨුං, එලවා; භික්ඛු, මහණ; හන්ද, හැඳ ශිඳ; ඛාදවා, කාසි හෝ; භුඤ්ජවා, වළඳයි හෝ; පවාරෙය්‍ය, පවරා නම්; භුත්තස්මිං, ඔහු වැලඳුඅවසන්හි; පාචිත්තියං, පචිති ඇවත්වේ. 6.

යොපනභික්ඛු, යම් මහණෙක්; විකාලෙ, වෙලාඉකුත් කල්හි; ඛාදනීයං වා, කනදෙයක් හෝ; භොජනීයං වා, භොජනයක් හෝ, ඛාදෙය්‍යවා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වලඳ නම් හෝ; පාචිත්තියං, පචිතිඇවැත් වේ. 7.

---

‡ "පෙක්ඛො" සමහර

යො පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං. 8.

යානි ඛො පන තානි පණීතභොජනානි සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං. 9.

යොපන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා පාචිත්තියං. 10.

භොජනවග්ගො චතුත්ථො.

—0—

---

යොපනභික්ඛු, යම් මහණෙක්; සන්නිධිකාරකං, පිළිගෙණ එකරැයකුදු ඉකුත්වා තබනලද; ඛාදනීයං වා, යාවකාලික ඛාදනයෙක් හෝ; භොජනීයං වා, භොජනයක් හෝ; ඛාදෙය්‍ය වා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වලඳ නම් හෝ; පාචිත්තියං, පචිතිඇවැත් වේ. 8.

යානි ඛොපන තානි පණීතභොජනානි, යම් ඒ ප්‍රණීතම්ත්‍රවූ භොජනයෙක් ඇද්ද; සෙය්‍යථීදං, ඒකවරහ; සප්පි, ගිතෙල්ය; නවනීතං, වෙඬරුය; තෙලං, තලතෙල් ඈ තෙල්ය; මධු, මීය, ඵාණිතං, උක්සකුරුය; මච්ඡො, දියෙහිමස; මංසං, කැපමස; ඛීරං, (කැපමස් ඇති ගොමහිසාදීන්ගේ) කිරිය; දධි,(එම සතුන්ගේ) දීය යනමොනු සි. යො පන භික්ඛු, යම් මහණෙක්; එවරූපානි පණීතභොජනානි, මෙබඳු ප්‍රණීතභොජනයන්; අගිලානො, නොගිලන්ව; අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා, තමා පිණිස ඉල්වා ගෙණ; පරිභුඤ්ජෙය්‍ය, වලඳ නම්, පාචිත්තියං, පචිතිඇවැත් වේ. 9.

යොපනභික්ඛු, යම් මහණෙක්; අදින්නං, නොපිළිගන්වනලද; ආහාරං, (වැළඳියයුතුයම්කිසි) අහරක්;මුඛද්වාරං, ගලබිලයට; ආහරෙය්‍ය, එලවා නම්; අඤ්ඤත්‍ර උදකදන්තපොනා, දිය හා දැහැටි දඬු තබා; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 10.

සතරවන භොජනවගයි.

—0—

**යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තියං. 1.**

**යො පන භික්ඛු භික්ඛුං එවං වදෙය්‍ය 'එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා'ති තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය 'ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති එකකස්ස මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං. 2.**

**යො පන භික්ඛු සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං. 3.**

---

යොපනභික්ඛු, යම් මහණෙක්; අචේලකස්ස වා, නග්නපරිබ්‍රාජකයක්හට හෝ; පරිබ්බාජකස්ස වා, පරිබ්‍රාජකයෙක්හට හෝ; පරිබ්බාජිකාය වා, පරිබ්‍රාජිකාවක්හට හෝ; සහත්ථා, තමා අතින්; ඛාදනීයං වා, කනදෙයක් හෝ; භොජනීයං වා, භොජනයක් හෝ; දදෙය්‍ය, දේ නම්; පාචිත්තියං, පචිති ඇවත්වේ. 1

යොපනභික්ඛු, යම් මහණෙක්; භික්ඛුං භික්ෂුවක්හට; ආවුසො ඇවැත; එහි, මා හා තැපිව එව; ගාමං වා, ගමකට හෝ; නිගමං වා, නියංගමකට හෝ; පිණ්ඩාය පවිසිස්සාමාති, ආහාරපිණ්ඩ වදුම්හයි කියා; තස්ස, සිහාවන් ඒ භික්ෂුහට; දාපෙත්වා වා, යම්කිසි ආමිසයක් දෙවා හෝ; අදාපෙත්වා වා, නො දෙවා හෝ; ආවුසො, ඇවැත; තයා සද්ධිං, තා හා සමග; කථාවා, බිණීම හෝ; නිසජ්ජා වා හිඳීමහෝ; ඵාසු න හොති, සුව නොවෙයි; එකකස්ස මෙ, හුදකලාවූ මට; කථාවා, බිණීම හෝ; නිසජ්ජා වා, හිඳීම හෝ; ඵාසු හොති, ඵාසු වෙයි; ගච්ඡාති, තෝ පළමුකොට එලවෙවයි කියා; එතදෙව පච්චයං කරිත්වා, මාගමක හා සිනාසෙළිඇ ඒ අනාචාරයම හෙතුකොටගෙණ; අනඤ්ඤං, දෙදෙනම එක්ව නොයපෙමිහ යනාදි අනික් සුදුසු කාරණයක් හෙතුනොකොට; උය්‍යොජෙය්‍ය; යවා නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 2.

යොපනභික්ඛු, යම් මහණෙක්; සභොජනෙ, (මෛථුනරාගයෙන් සමන්විත) ස්ත්‍රී පුරුෂයන් දෙන්නෙකු ඇති; කුලෙ, හෝනා ගෙහි; අනුපඛජ්ජ, ඇතුලටවැද; නිසජ්ජං කප්පෙය්‍ය, හිඳී නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 3.

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං. 4.**

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං. 5**

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො චීවරදානසමයො චීවරකාරසමයො අයං තත්ථ සමයො. 6**

**අගිලානෙන භික්ඛුනා චාතුමාසපච්චයපවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුන පවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං. 7.**

---

යො පන භික්ඛු, යම් මහණෙක්; මාතුගාමෙන සද්ධිං, මිනිස් මාගමක හා සමග; රහො, ඇසට රහස්වූ; පටිච්ඡන්නෙ, මුවාවූ; ආසනෙ, අස්නෙහි; නිසජ්ජං කප්පෙය්‍ය, හිඳී නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 4.

යො පන භික්ඛු, යම් මහණෙක්; එකො, හුදකලාවූයේ; එකාය, හුදකලාවූ; මාතුගාමෙන සද්ධිං, සත්‍යාසත්‍යතෙපුල් දන්නා මිනිස් මාගමක හා සමග; රහො, චක්ෂුශ්‍රොතයට රහස්වූ තන්හි; නිසජ්ජං කප්පෙය්‍ය, හිඳී නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 5.

යොපනභික්ඛු, යම් මහණෙක්; නිමන්තිතො, දායකයකින් පවරණලද්දේ; සභත්තො සමානො, පැවරු බතින් සභත්තවූයේ; සන්තං භික්ඛුං, දෙලොස්රියනකින් ඇතුළෙහි ඇති භික්ෂුවක්හු; අනාපුච්ඡා, "අහං ඉත්ථන්නාමස්ස ඝරං ගච්ඡාමි"යනාදීන් ආපුච්ඡා නොකොට; පුරෙභත්තංවා, පවරණලදබත් වැළඳීමට පෙරවූ හෝ; පච්ඡාභත්තං වා වැළඳීඉක්බිතිවූහෝ කුලෙසු, අන්‍යකුලයෙහි; චාරිත්තං ආපජ්ජෙය්‍ය, හිරුමුදුනෙන් පහ නොවන්නේතක් හැසිරීමට පැමිණේනම්; අඤ්ඤත්‍ර සමයා, සමය තබා; පාචිත්තියං, පචිතිඇවැත්වේ — තත්ථ, එහි; අයං සමයො, මේසමයයි; චීවරදානසමයො, සිවුරුදෙනසමයය; චීවරකාරසමයො, සිවුරුකරණසමයය; තත්ථ, එහි; අයං සමයො, මේසමයයි. 6.

අගිලානෙන භික්ඛුනා, නොගිලන්මහණහු විසින්; චාතුමාස පච්චයපවාරණා, සාරමසක් ගිලන්පසයෙන් කරණ පවාරණා,

යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං. 8.

සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො සෙනං ගමනාය දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං තතො චෙ උත්තරිං වසෙය්‍ය පාචිත්තියං 9

දිරත්තතිරත්තඤ්චෙ භික්ඛු සෙනාය වසමානො උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යූහං වා අනීක දස්සනං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං 10

අචෙලකවග්ගො පඤ්චමො

———0———

---

නොමෙයි; සාදිතබ්බා, රොගයක් ඇතිකල විනවම් ඉවසියයුතුය; පුන පවාරණාය අඤ්ඤත්‍ර, නැවත සාරමසක් පැවරීම තබා; නිච්ච පවාරණාය අඤ්ඤත්‍ර, යාවජීවයෙන් පැවැවරීම තබා;] තතො උත්තරිං, එයින් මත්තෙහි හෙවත් පිරිසුත්කාලින් හා පැවරූ බෙහෙදින් වඩා; සාදියෙය්‍ය චෙ, විනවා නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 7.

යො පන භික්ඛු, යම් මහණෙක්; උය්‍යුත්තං සෙනං, යුද්ධපිණිස ගමින් නික්මුනු චතුරඟිනීසෙනාව; දස්සනාය, බලනපිණිස, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, යන්නට සුදුසුකාරණයක් නැතිව; ගච්ඡෙය්‍ය, යේ නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 8.

තස්ස භික්ඛුනො, ඒ භික්ෂූහුගේ; සෙනං ගමනාය, සෙනාවට යනපිණිස; කොචි දෙව පච්චයො සියා, කිසි කටයුත්තෙක් ඇත් නම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂූනුවිසින්; දිරත්තතිරත්තං, දෙතුන් රැයක්; සෙනාය වසිතබ්බං, සෙනායෙහි විසියයුතුය; තතො උත්තරිං, තුන්රැයින් මත්තෙහි; වසෙය්‍ය චෙ, වෙසේනම්; පාචිත්තියං පචිති ඇවැත්වේ. 9

දිරත්තතිරත්තං, දෙතුන්රැයක්; සෙනාය වසමානො භික්ඛු, සෙනායෙහි වසන භික්ෂු තෙමේ; උය්‍යොධිකං වා, යුද්ධකරණතැනට හෝ; බලග්ගං වා, බලගණනතැනට හෝ; සෙනාබ්‍යූහං වා, සෙනාසන්නිවෙසස්ථානයට හෝ; අනීක දස්සනං වා, ඇත්ඇණි අස් ඇණිදක්නට හෝ; ගච්ඡෙය්‍ය, යේනම්; පාචිත්තියං පචිති ඇවැත්වේ 10.

පස්වන අචෙලක වගයි.

**සුරාමෙරයපානෙ පාචිත්තියං 1**

**අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං 2**

**උදකෙ හසධම්මෙ පාචිත්තියං 3.**

**අනාදරියෙ පාචිත්තියං 4.**

**යො පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය පාචිත්තියං 5**

**යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං 6**

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං තත්ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධානගමනසමයො වාතවුට්ඨිසමයො අයං තත්ථ සමයො 7.**

---

සුරාමෙරයපානෙ, රාමෙර බීමෙහි; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 1

අඞ්ගුලිපතොදකෙ, ඇඟිල්ලෙන් ගිරිහි කැවීමෙහි; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 2.

උදකෙ හසධම්මෙ, දියෙහි කෙළිමෙහි; පාචිත්තියං, පචිති ඇවැත් වේ 3.

අනාදරියෙ, "ශික්ෂාපදයෙන් අවවාදකළ පුද්ගලයාහට හෝ ධර්මයට හෝ" අනාදරකිරීමෙහි; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 4

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛුං, භික්ෂුවක්හු; භිංසාපෙය්‍ය, භය ගන්වා නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 5.

යො පන භික්ඛු, යම් මහණෙක්; අගිලානො, නොගිලන්වූයේ; විසිබ්බනාපෙක්ඛො, ඇල්හෙයින් තප්නා කැමැත්තේ; අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා.(පහන් දැල්වීම් ආ)එබඳු කාරණයක් නැතිව; ජොතිං, ගිනි; සමාදහෙය්‍ය වා, තෙමේ දල්වානම් හෝ; සමාදහාපෙය්‍ය වා, අනුන්ලවා දල්වවානම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 6.

යො පන භික්ඛු, යම් මහණෙක්; ඔරෙනද්ධමාසං, ඇතුළු අඩමස හෙවත් මැදුම්පියසැ නැවූ දවස් පටන් අඩමසක් නොපිරුණු කල්හි; අඤ්ඤත්‍ර සමයා, නහන සමය තබා; නහායෙය්‍ය, නහා නම්,

**නවං පන භික්ඛුනා චීවරලාභෙන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා අනාදා චෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං. 8.**

**යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං 9.**

---

පාචිත්තියං, පචිති ඇවැත් වේ. ——තත්‍ර, එහි; අයං සමයො, මේ සමයයි; ගිම්හානං, ගිමන් සාරමසින්; දියඩ්ඪො මාසො සෙසො, සිටිසෙලමසය; වස්සානස්ස, වස්සානයාගේ; පඨමො මාසො, පළමු මාසයයි; ඉති, මෙසේ; එතෙ අඩ්ඪතෙය්‍යමාසා, මොහු දෙමස් දෙපෝවර සෙකොණකා; උණ්හසමයො; එසින් ගිම්හි සිටිසෙලමස යයි කියනලද උණ්හ සමයද; පරිළාහසමයො, වසන්හි ආදිමසයයි කියනලද පරිදාහසමයද, ගිලානසමයො, "යස්ස විනා නහානං න ඵාසු හොති"යි වදාළ ගිලන්සමයද; කම්මසමයො, "අන්තමසො පරිවෙණම්පි සම්මට්ඨං හොතී"යි වදාළ කර්මාන්තසමයද; අද්ධානගමනසමයො "අඩ්ඪයොජනං ගච්ඡිස්සාමීති නහායිතබ්බං යනාදි වදාළ" අධ්වගමනසමයද; වාතවුට්ඨිසමයො, "භික්ඛු සරජෙන වාතෙන ඔකිණ්ණා හොන්ති ද්වෙවා තීනිවා උදක ඵුසිතානි කායෙ පතිතානි හොන්ති"යි වදාළ වාතවෘෂ්ටිසමයද යන; අයං, මේ; තත්‍ර සමයො, එහි සමයයි. 7.

නවම්පන භික්ඛුනා, චීවරලාභෙන, හඳනට පොරෝණට සුදුසු අලුත් සිවුරු ලද මහණහු විසින්; නීලං වා, ලොහොමලඇතිලක් හෝ; කද්දමං වා, මඩ හෝ; කාළසාමං වා, අඟුරුදැලිඈ කළුවක් හෝ යන; තිණ්ණං දුබ්බණ්ණකරණානං, ත්‍රිවිධ දුර්වර්ණකරණයන් අතුරෙන්; අඤ්ඤතරං දුබ්බණ්ණකරණං, එක්තරා දුර්වර්ණකරණයක්; ආදාතබ්බං, ගතයුතුය; භික්ඛු, මහණතෙම; තිණ්ණං දුබ්බණ්ණකරණානං, ත්‍රිවිධ දුර්වර්ණකරණයන් අතුරෙන්; අඤ්ඤතරං දුබ්බණ්ණකරණං, අන්‍යතර දුර්වර්ණකරණයක්; අනාදා, නොදී; නවං චීවරං, අලුත් සිවුරක්; පරිභුඤ්ජෙය්‍ය චෙ, වැළඳගණී නම්; පාචිත්තියං, පචිතිඇවත්වේ 8.

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛුස්ස වා, උපසපනක්හට හෝ; භික්ඛුනියා වා, මෙහෙණකට හෝ; සික්ඛමානාය වා, සික්ඛ

යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛොපි පාචිත්තියං. 10.

සුරාපානවග්ගො ඡට්ඨො.

——0——

යො පන භික්ඛු සඤ්චිච්චපාණං ජීවිතා වොරොපෙය්‍ය පාචිත්තියං. 1.

යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං. 2

---

මානාවිකාට හෝ, සාමණේරස්ස වා, සාමණේරයෙකුට හෝ; සාමණේරියා වා, *සාමණේරියකට හෝ; සාමං, තෙමේම; චීවරං විකප්පෙත්වා, සිවුරක් විකප්පා; අපච්චුද්ධාරකං, නො පසුදුරුවා; පරිභුඤ්ජෙය්‍ය වැලඳගණී නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 9.

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛුස්ස, භික්ෂුවක්හුගේ; පත්තං වා, ඉටත්පොහොනා පාත්‍රයක් හෝ; චීවරං වා, විනප්‍රත් පොහොනා සිවුරක් හෝ; නිසීදනං වා, නිසදුන් සිවුරක් හෝ; සූචිඝරං වා, ඉඳිකඩක් හෝ; කායබන්ධනං වා, කාබානක් හෝ; අන්තමසො, යටත් පිරිසෙයින්; හස්සාපෙක්ඛොපි, කෙළිකැමතිවද; අපනිධෙය්‍ය වා, තෙමේ සඟවා නම් හෝ; අපනිධාපෙය්‍ය වා, අනුන් ලවා සඟව වා නම් හෝ; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 10

සවන සුරාපාණ වගයි.

——0——

යො පන භික්ඛු, යම් මහණෙක්; සංචිච්ච, මොහු මරමි දැන දැන; පාණං, තිරිසන්ගියසතෙක්හු; ජීවිතා වොරොපෙය්‍ය, ජීවිතයෙන්පහකෙරේනම්; පාචිත්තියං, පචිති ඇවත්වේ 1.

යොපන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැනදැන; සප්පාණකං; උදකං, පණුවන් ඇතිදිය; පරිභුඤ්ජෙය්‍ය, අනුභවකෙරේ නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 2.

---

* සෙලෙහි "සාමණේරායවා"

**යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙය්‍ය පාචිත්තියං. 3**

**යො පන භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය පාචිත්තියං. 4.**

**යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය සො ච පුග්ගලො අනුපසම්පන්නො තෙ ච භික්ඛූ ගාරය්හා ඉදං තස්මිං පාචිත්තියං. 5**

**යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං 6.**

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං. 7.**

---

යො පන භික්ඛු, යම් මහණෙක්; ජානං; දැන දැන; යථාධම්මං; ධර්ම වූ පරිද්දෙන්; නිහතාධිකරණං, සන්හිඳුවනලද අධිකරණය; පුනකම්මාය, නැවත කරණ පිණිස; උක්කොටෙය්‍ය, උගුළුවා නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ. 3.

යොපන භික්ඛු, යම්මහණෙක්; භික්ඛුස්ස, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලං ආපත්තිං, සඞ්ඝාදිසෙසආපත්තියක්; ජානං, දැන දැන; පටිච්ඡාදෙය්‍ය, සඟවා නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ 4.

යො පන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැනදැන; ඌනවීසතිවස්සං පුග්ගලං, පිළිසඳපටන් නො පිරුණු විසිහවුරුදු ඇති පුද්ගලයා; උපසම්පාදෙය්‍ය, උපාධ්‍යායව උපසම්පන්න කරවා නම්; සො ච පුග්ගලො, ඒ පුද්ගලද; අනුපසම්පන්නො, උපසම්පන්න නොවෙයි; තෙච භික්ඛූ, ඒ ගණපූරකභික්ෂූහු ද; ගාරය්හා, ගර්හාකටයුත්තාහ හෙවත් දුකුළා ඇවැත් අවදිති; තස්මිං, ඒ උපාධ්‍යායයා කෙරෙහි; ඉදං පාචිත්තියං, මේ පාචිත්තිය දතයුත්තේයි. 5

යො පන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැන දැන; සංවිධාය, බැණගෙණ; ථෙය්‍යසත්ථෙන සද්ධිං, සොරසත්වාමුලු හා සමග; එකද්ධානමග්ගං, එක අද්දන්මගට; අන්තමසො, යටත් පිරිසෙයින්; ගාමන්තරම්පි, හුන් ගමින් අනික්ගමකට්ද; පටිපජ්ජෙය්‍ය, යේනම්, පාචිත්තියං, පචිතිඇවැත්වේ. 6.

යො පන භික්ඛු, යම් මහණෙක්; සංවිධාය, බැණගෙණ; මාතුගාමෙන සද්ධිං, මාගමක හා සමග; එකද්ධානමග්ගං, එක අද්දන්මගට;

යො පන භික්ඛු එවං වදෙය්‍ය තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි නහි සාධු භගවතො අබ්භක්ඛානං නහි භගවා එවං වදෙය්‍ය අනෙකපරියායෙන ආවුසො අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නොචෙ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තියං. 8.

---

අනාපත්තිකො, යටත් පිරිසෙයින්; ගාමන්තරම්පි, හුන්ගමින් අනික් ගමකට ද; පච්ඡෙජ්ජය, යේ නම්; පාචිත්තියං, පචිති ඇවැත් වේ 7

යො පන භික්ඛු යම් මහණෙක්; භගවතා, භාගවත්හු විසින්; යෙ ඉමෙ ධම්මා, සත්තාපත්තික්ඛන්ධසඞ්ඛාතා යම් මේ ධර්මකෙනෙක්; අන්තරායිකා, ස්වර්ගමොක්ෂයන්ට අන්තරාය කරන්නාහයි; වුත්තා, කියනලද්හුද; තෙ, ඒධර්මයෝ; පටිසෙවතො, සෙවුනාහට; යථා, යම්සේ; අන්තරායාය, ස්වර්ගමොක්ෂයන්ට අන්තරායපිණිස; නාලං, අසමර්ථයෝද; අහං, මම; භගවතා දෙසිතං ධම්මං, භාග්‍යවත්හු විසින් දෙසනලද ධර්මය; තථා ආජානාමි ඉති, එසේ දනිමියි; එවං වදෙය්‍ය, මෙසේ කියානම්; සො භික්ඛු, ඒභික්ෂුතෙම; භික්ඛූහි, සෙසුභික්ෂූන් විසින්; ආයස්මා. ඇවැත; මා එවං අවච, එසේ නොකිය; භගවන්තං භාගවත්හට; මා අබ්භාචික්ඛි, අභ්‍යාඛ්‍යාන නොකර; භගවතො, භාගවත්හට; අබ්භක්ඛානං, බිණීම; නහි සාධු, යහපත් නොවේ; භගවා, භගවත් තෙම; එවං, මෙසේ; නහි වදෙය්‍ය, නොමකියන්නේයි; ආවුසො. ඇවැත; භගවතා, භාගවත්හු විසින්; අන්තරායිකා ධම්මා, අන්තරායකරධර්මයෝ; අනෙකපරියායෙන "අට්ඨිකඞ්කලූපමා කාමා යනාදීන්" නොයෙක් කාරණයෙන්; අන්තරායිකා වුත්තා, අන්තරායකරහයි කියනලද්හුද; තෙ, ඒ ධර්මයෝ; පටිසෙවතො, සෙවුනාහට; අන්තරායාය, අන්තරායපිණිස; අලඤ්ච පන ඉති, සමර්ථයහයි; එවං වචනීයො අස්ස, මෙසේ තුන්යලක් කියයුතු වන්නේය; සො භික්ඛු, ඒ මහණතෙම; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවඤ්ච වුච්චමානො, මෙසේද කියනුලබන්නේ; තථෙව පග්ගණ්හෙය්‍ය, එසේම ගෙණ සිටී නම්; සො භික්ඛු, ඒමහණතෙම; භික්ඛූහි,

යො පන භික්ඛු ජානං තථාවාදිනා භික්ඛුනා අකතානු
ධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංව
සෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං 9.

සමණුද්දෙසොපි චෙ එවං වදෙය්‍ය තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති සො සමණුද්දෙසො භික්ඛූහි එවමස්ස වචනීයො මා ආවුසො සමණුද්දෙස එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි නහි සාධු භගවතො අබ්භක්ඛානං නහි භගවා එවං වදෙය්‍ය අනෙකපරියායෙන ආවුසො සමණුද්දෙස අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලංච

---

භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ ලබ්ධිය හරණපිණිස; යාවතතියං, තුන්වලක්; සමනුභාසිතබ්බො, සමනුභාසනකර්ම කට යුත්තේය; යාවතතියං, තුන්වලක්; සමනුභාසියමානො, සමනුභාසනකර්ම කරණු ලබන්නේ; තං පටිනිස්සජ්ජෙය්‍ය චෙ, ඒ ලබ්ධිය හරුයේ වී නම්; ඉච්චෙතං, මෙසේ ඒ හැරපීම; කුසලං, මැනව; නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, ඉදින් නො හරුයේ වී නම්; පාචිත්තියං පචිති ඇවැත්වේ. 8.

යො පන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැන දැන; තථාවාදිනා "තථාහං භගවතා දෙසිතං ධම්මං ආජානාමි යථාදි" වාද ඇති; අකතානුධම්මෙන, නො කරණලද අවසාරණසඞ්ඛ්‍යාත අනුධර්ම ඇති; තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන, ඒ ලබ්ධිය නොහළුවාවූ; භික්ඛුනා සද්ධිං, භික්ෂුහු හා සමග; සම්භුඤ්ජෙය්‍ය වා, ධර්මාමිෂයෙන් සම්භොග කෙරේ නම් හෝ; සංවසෙය්‍ය වා, උපොසථාදි *සඞ්ඝකර්ම කෙරේනම් හෝ; සහවාසෙය්‍යං කප්පෙය්‍ය, "නානූපචාරවූ එකච්ඡන්නයෙහි" එක්ව ලෙහා වී නම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත්වේ 9.

සමණුද්දෙසොපි, හෙරණපැවිජ්ජයෙකුදු; භගවතා, භාග්‍යවතුන් විසින්; යෙමෙ ධම්මා, යම් යම් ධර්මකෙණෙක්; අන්තරායිකා, අන්තරායකරහයි; වුත්තා, කියනලද්දාහුද; තෙ, ඒ ධර්මයෝ; පටිසෙවතො, සෙවුනාහට; යථා, යම්සේ; අන්තරායාය, අන්තරාය පිණිස; නාලං, අසමර්ථයෝද; අහං, මම; භගවතා දෙසිතං ධම්මං, භාග්‍යවතුන් විසින් දෙසනලද ධර්මය; තථා ආජානාමි ඉති, එසේ දනිමි; එවං වදෙය්‍ය, මෙසේ කියා නම්; සො සමණුද්දෙසො, ඒ හෙරණපැවිදි තෙමේ;

---

* "සොභඩාදි" පොත්.

ජානි තෙ පටිසෙවතො අනන්තරායායාති එවඤ්ච සො සමණුද්දෙසො භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො සමණුද්දෙසො භික්ඛූහි එවමස්ස වචනීයො අජ්ජතග්ගෙ තෙ ආවුසො සමණුද්දෙස න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො යම්පි චඤ්ඤෙ සමණුද්දෙසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං සාපි තෙ නත්ථි චර පිරෙ විනස්සාති. යො පන භික්ඛු ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං. **10.**

සප්පාණකවග්ගො සත්තමො.

—0—

---

භික්ඛූහි භික්ෂූන් විසින්; ආවුසො, ඇවැත; සමණුද්දෙස, සාමණේරය; මා එවං අවච, එසේ නොකිය; භගවන්තං; භාග්‍යවත්හට; මා අබ්භාචික්ඛි, අභ්‍යාඛ්‍යාන නොකර; භගවතො, භාග්‍යවත්හට; අබ්භක්ඛානං, බැණීම; න හි සාධු, යහපත් නොවේ; භගවා, භාග්‍යවත් තෙමේ; එවං, එසේ; න හි වදෙය්‍ය, නොම කියන්නේය; ආවුසො, ඇවැත, සමණුද්දෙස, සාමණේරය; භගවතා, භාග්‍යවත්හු විසින්; අන්තරායිකා ධම්මා, අන්තරායකර ධර්මයෝ; අනෙකපරියායෙන, නොයෙක් කාරණයෙන්; අන්තරායිකා වුත්තා, අන්තරායකරයයි කියනලදහ; තෙ, ඒ ධර්මයෝ; පටිසෙවතො, සෙවුනාහට; අනන්තරායාය, අන්තරාය පිණිස; අලං ච පන හොන්ති, සමර්ථයහයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතුවන්නේය; සො, ඒ ශ්‍රමණපැවිජි තෙමේ; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවඤ්ච, වුච්චමානො, මෙසේ කියනු ලබන්නේ; තථෙව, පග්ගණ්හෙය්‍ය, එසේම ගෙණ සිටින්නේ වීනම්; සො සමණුද්දෙසො, ඒ ශ්‍රමණපැවිජි තෙමේ; භික්ඛූහි, භික්ෂූන් විසින්; ආවුසො, ඇවැත; සමණුද්දෙස, සාමණේරය; තෙ, තාවිසින් අජ්ජතග්ගෙ, අදපටන් කොට; සො භගවා සත්ථා, ඒ භාග්‍යවත් ශාස්තෲ තෙමේ; න චෙව අපදිසිතබ්බො, අපගේ සර්වඥ යයි නොම කියයුත්තේය; අඤ්ඤෙ, සමණුද්දෙසා, සෙසු සාමණේරයෝ; භික්ඛූහි සද්ධිං, භික්ෂූන්හා සමග; දිරත්තතිරත්තං, දෙතුන්රැයක්; යම්පි ච සහසෙය්‍යං ලභන්ති, යම් සහසෙය්‍යාවක් ලැබෙද්ද; සාපි, ඒ සහසෙය්‍යාවද; තෙ නත්ථි, තට නැත; පරෙ, පරය, අපගේ නොවන්න; චර විනස්සාහි, අප නොදක යවයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතු වන්නේයයි ~ යො පන භික්ඛු, යම් මහණෙක්; ජානං, දැන දැන; තථා නාසිතං සමණුද්දෙසං, එසේ නෙරපණලද සාමණේ

යො පන භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වදෙය්‍ය න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමීති පාචිත්තියං ~~~ සික්ඛමානෙන භික්ඛවෙ භික්ඛුනා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං අයං තත්ථ සාමීචි. 1.

යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තීති සික්ඛාපදවිවණ්ණනකෙ පාචිත්තියං 2

---

රසා; උපලාපෙය්‍ය වා, පාසිවුරුදෙමි යනාදින් සඟණ් නම් හෝ, උපට්ඨාපෙය්‍ය වා, තමහට උපස්ථාන කරවා නම් හෝ; සම්භුඤ්ජෙය්‍ය වා, ධම්මාමිෂයෙන් සම්භොග කෙරේ නම් හෝ; සහසෙය්‍යං කප්පෙය්‍ය වා, සහසෙය්‍යා කෙරේ නම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත් වේ 10

## සත්වන සප්පාණකවග්ගයි.

——0——

යො පන භික්ඛු, යම් මහණෙක්; භික්ඛූහි, භික්ෂූන් විසින්; සහධම්මිකං වුච්චමානො, ප්‍රඥප්ත ශික්ෂාපදයෙන් කියනු ලබන්නේ; ආවුසො, ඇවැත; ව්‍යත්තං, ව්‍යක්තවූ හෙවත් බහුශ්‍රැත වූ; විනයධරං, විනයධරවූ; අඤ්ඤං භික්ඛුං, අනික් භික්ෂුවක්නු; යාව න පරිපුච්ඡාමි, යම්තාක් නො විචාරම්ද; තාව, ඒතාක්; අහං, මම; එතස්මිං සික්ඛාපදෙ, මේ ශික්ෂාපදයෙහි; න සික්ඛිස්සාමීති, නො හික්මෙමියි; එවං වදෙය්‍ය, මෙසේ කියානම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ ~~~ භික්ඛවෙ, මහණෙනි; සික්ඛමානෙන භික්ඛුනා, හික්මෙනු කැමති භික්ෂුහු විසින්; අඤ්ඤාතබ්බං, එසතු නිදානපුද්ගලාදිය දතයුත්තේය; පරිපුච්ඡිතබ්බං, අර්ථවිචාරියයුත්තේය; පරිපඤ්හිතබ්බං, විනාවශයෙන් තුලනා කටයුත්තේය; තත්ථ, එහි; අයං සාමීචි, මේවිධි. 1.

යො පන භික්ඛු, යම් මහණෙක්; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, පාමොක් උදෙසන ලබනකල්හි; උද්දිට්ඨෙහි, උදෙසනලද; ඛුද්දානුඛුද්දකෙහි, ක්ෂුද්‍රානුක්ෂුද්‍රවූ‡ ඉමෙහි සික්ඛාපදෙහි, මේ ශික්ෂාපදයෙන්; කිම්පන, කටයුතු කිම්; යාවදෙව, යම්තාක්; කුක්කුච්චාය, කැපදෙ නො කැප දෙ හෝයි උපදනා කුකුස්පිණිස; විහෙසාය,

---

‡ "කුඩා මහත්වූ" කියා පොත්හි පැනේ ගේ වරදයි.

**යො පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය ඉදානෙව ඛො ආවුසො අහං ආජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති, තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්වත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ කො පන වාදො භිය්‍යොති, න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකෙන මුත්ති අත්ථි යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො තඤ්ච යථා ධම්මො කාරෙතබ්බො උත්තරිං චස්ස මොහො ආරොපෙතබ්බො තස්ස තෙ ආවුසො අලාභා තස්ස තෙ දුල්ලද්ධං යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසිකරොසීති ඉදං තස්මිං මොහනකෙ පාචිත්තියං 3**

---

විපිළිසර විසින් උපදනා පීඩාපිණිස; විලෙඛාය, විචිකිච්ඡා සඞ්ඛාත මනොවිලෙඛාය පිණිස; සංවත්තන්තීති, වැටෙතියි; එවං වදෙය්‍ය, මෙසේ කියා නම්; සික්ඛාපදවිවණ්ණකො, මෙසෙයින් ශික්ෂාපදයට නිඥබිණීමෙහි; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 2

යො පන භික්ඛු, යම් මහණෙක්; අන්වද්ධමාසං, (පිළිවෙළින්) අඩමස අඩමස; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, (පොහෝ විසින්) පාමොක් උසුරුවනලබනකල්හි; අයම්පි කිර ධම්මො, මේ ධර්මයද; සුත්තාගතො, සූත්‍රයෙහි ආයේ; සුත්තපරියාපන්නො, සූත්‍රයෙහි ඇතුළත; අන්වද්ධමාසං, අඩමස අඩමස; උද්දෙසං ආගච්ඡතීති, උදෙසියයුතුබවට එන්නේයයි; අහං, මම; ඉදානෙව ඛො, දැන්ම, ආජානාමීති, දන්මියි; එවං වදෙය්‍ය, මෙසේකියානම්; තං භික්ඛුං, ඒ භික්ෂුහු; ද්වත්තික්ඛත්තුං, දෙතුන්වරෙක; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, පාමොක්උසුරුවනලබනකල්හි; ඉමිනා භික්ඛුනා, මේභික්ෂුහු විසින්; නිසින්නපුබ්බං, හුන්පිරූඇතැයි; අඤ්ඤෙ භික්ඛූ, සෙසු භික්ෂුහු; ජානෙය්‍යුං චෙ, දනිත්නම්; භිය්‍යො, බොහෝසේ උන්පිරූකල්හි; කො පන වාදො, කියයුතු කිම්; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; අඤ්ඤාණකෙන, නුහුඵනින් අවන්බැවින්; මුත්ති, මුත්තියෙක්; න ච අත්ථි, නො ම ඇති; තත්ථ තමාකළ ඒ අනාචාරයෙහි; යඤ්ච ආපත්තිං ආපන්නො අඤ්ඤාණකො යම් ආපත්තියකට අවන්දැ; තඤ්ච, ඒ ආපත්තියද; යථා ධම්මො ධර්මවිනය යම්සේද එසේම; කාරෙතබ්බො, කටයුත්තේය; උත්තරිං චස්ස; යථාධර්මකරණයෙන් මතුත් හිදැ, ආවුසො, ඇවත; යං ත්වං, යම්බඳු වූ තෝ; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, පාමොක් උසුරුවනලබනකල්හි අට්ඨිකත්වා අර්ථිව; න සාධුකං මනසිකරොසි, මනා කොට සිත්හි නොගන්නෙහිදැ

**යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං. 4.**

**යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තියං. 5**

**යො පන භික්ඛු භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය පාචිත්තියං. 6.**

**යො පන භික්ඛු භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං. 7.**

---

*තස්සතෙ, ඒ තමට; අලාභා, මෙතැනහි චිත්තසුඛලාභයෝද නැත; තස්ස තෙ, ඒ තමට; දුල්ලද්ධනති, (කුශලානුභාවයෙන්ලද මිනිසත් බව) දුර්ලභයයි (නිසඳ බැණ;) අස්ස, ඔහට; මෝහාරොපෙතබ්බො, මොහාරොපණ කටයුත්තේය; තස්මිං මොහනකෙ, මොහාරොපණකළකල නැවත මොහනක ඒපුද්ගලයා කෙරෙහි; ඉදං පාචිත්තියං, මේ පචිතිඇවැත් දතයුත්තේයි. 3.

යො පන භික්ඛු, යම් මහණෙක්; කුපිතො, කිපියේ, අනත්තමනො, ප්‍රීතිසුඛාදීන් අපගතවූයේ; භික්ඛුස්ස, භික්ෂුවක්හට; පහාරං දදෙය්‍ය, පහරදේ නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 4

යො පන භික්ඛු, යම් මහණෙක්; කුපිතො, කිපියේ; අනත්තමනො, ප්‍රීතිසුඛාදීන් අපගතවූයේ; භික්ඛුස්ස, භික්ෂුවක්හට; තලසත්තිකං, අතැසන්; † උග්ගිරෙය්‍ය, නගා නම්; පාචිත්තියං පචිතිඇවැත්වේ. 5.

යො පන භික්ඛු, යම් මහණෙක්; අමූලකෙන, (දෘෂ්ටශ්‍රැතාදි) මුල් නැත්තාවූ; සඞ්ඝාදිසෙසෙන, සඞ්ඝාදිසෙසාපත්තියෙකින්; භික්ඛුං, භික්ෂුවක්හට; අනුද්ධංසෙය්‍ය, චොදනා කෙරේ නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 6

යො පන භික්ඛු, යම්මහණෙක්; ඉති, මෙසේ කල්හි; අස්ස, මොහට; මුහුත්තමපි, ඇසිල්ලකුදු; අඵාසු භවිස්සතීති, ඵාසු නොවන්නේයයි; එතදෙව පච්චයං කරිත්වා, මේම කාරණා කොටගෙණ.

---

* "නොතබයි" කියයි † අත්සත් ' කියයි

**යොපන භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය යං ඉමෙ භණිස්සන්ති තං සොස්සාමීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං. 8.**

**යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තියං. 9.**

**යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය පාචිත්තියං. 10.**

**යො පන භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය යථා සන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්තීති පාචිත්තියං. 11**

---

අනඤ්ඤං, අනිකක් කාරණාකොට නොගෙණ; භික්ඛුස්ස, භික්ෂුවක්හට; සඤ්චිච්ච, දැනදැන; කුක්කුච්චං උපදහෙය්‍ය, "ඌනවීසති වස්සො මඤ්ඤෙ ත්වං උපසම්පන්නො" යනාදින් කුකුස් උපදවා නම්; පචිත්තියං, පචිති ඇවැත්වේ. 7.

යොපන භික්ඛු, යම් මහණෙක්; භණ්ඩනජාතානං, උපන්දබර ඇති; කලහජාතානං, උපන් කලහඇති; විවාදාපන්නානං, (භණ්ඩන කලහයෙන් මඩනාලද) විවාදාධිකරණයට පැමිණියාවූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; උපස්සුතිං, බස් ඇසෙනතැන; ඉමෙ, මොහු; යං භණිස්සන්ති, යමක් බෙණෙද්ද; තං සොස්සාමීති, ඒ අස්මි; එතදෙව පච්චයං කරිත්වා; මෙම කාරණා කොට; අනඤ්ඤං, අනිකක් කාරණා නො කොට; තිට්ඨෙය්‍ය, (බස්අසා) සිටි නම්; පාචිත්තියං, පචිති ඇවැත්වේ. 8.

යො පන භික්ඛු, යම් මහණෙක්, ධම්මිකානං, ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් කරණලද; කම්මානං, අපලොකනාදිචතුර්විධකර්මයන්ට; ඡන්දං දත්වා, සද දී; පච්ඡා, පසුව; ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, බුමුනානබවට පැමිණේ නම්; පාචිත්තියං පචිති ඇවත්වේ. 9

යො පන භික්ඛු, යම් මහණෙක්; සඞ්ඝෙ, සඞ්ඝයාකෙරෙහි; විනිච්ඡයකථාය වත්තමානාය, විනිශ්චය කථාවක් පවත්නාකල්හි; ඡන්දං අදත්වා, සදනොදී; ආසනා වුට්ඨාය, අස්නෙන් නැගී; පක්කමෙය්‍ය, (කර්මකොපනකරණු කැමතිව) යේ නම්; පාචිත්තියං, පචිති ඇවත්වේ. 10

යො පන භික්ඛු, යම් මහණෙක්; සමග්ගෙන සඞ්ඝෙන, සමග්‍ර සඞ්ඝයා හා කැටිව; භික්ඛුස්ස චීවරං දත්වා, (සෙනාසන පඤ්ඤාපකාදී

යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය පාචිත්තියං. 12.

සහධම්මිකා වග්ගො අට්ඨමො.

—0—

යො පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස අනික්ඛන්තරාජකෙ අනිග්ගතරතනකෙ පුබ්බෙ අප්පටිසංවිදිතො ඉන්දඛීලං අතික්කාමෙය්‍ය පාචිත්තියං. 1.

යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං — රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගණ්හාපෙත්වා වා නික්ඛිපිතබ්බං යස්ස භවිස්සති සො හරිස්සතීති අයං තත්ථ සාමීචි. 2.

---

විසින් සම්මත ලද) භික්ෂුවක්හට සිවුරුදී; පච්ඡා, පසුව; භික්ඛු, භික්ෂුහු; සංඝිකං ලාභං, සාංඝිකලාභය; යථාසන්ථුතං, විශ්වාස සන්ව; පරිණාමෙත්වාති, පිරිණමතියි; ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, බුමුනනාබවට පැමිණෙති නම්; පාචිත්තියං, පචිතිඇවැත්වේ 11

යො පන භික්ඛු, යම් මහණෙක්; පරිණතං, සඟහට පිරිණමනලද; සංඝිකං, එසඟසින්ම සම්බන්ධකාවූ; ලාභං, චීවරාදිවස්තුව; ජානං, දැනදැන; පුග්ගලස්ස පරිණාමෙය්‍ය, පුද්ගලයෙකුට පිරිණමා නම්; පාචිත්තියං, පචිතිඇවත්වේ. 12.

අටවන සහ ධාර්මිකාවගයි.

—0—

යො පන භික්ඛු, යම් මහණෙක්; ඛත්තියස්ස, ක්ෂත්‍රියජාතිඇති; මුද්ධාවසිත්තස්ස, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙකකරණලද, රඤ්ඤො, රජහුගේ, අනික්ඛන්තරාජකෙ, පිටතට නොනික්මුනු රජහුඇති; අනිග්ගතරතනකෙ, පිටතට නොගිය මෙහෙසුන්ඇති සයනයෙහි; පුබ්බෙ අප්පටිසංවිදිතො, පළමුකොට තමා ආබව නොදන්වනලද්දේ; ඉන්දඛීලං අතික්කාමෙය්‍ය, එළිපත ඉක්ම ඇතුළට වදී නම්, පාචිත්තියං, පචිතිඇවැත්වේ. 1.

යො පන භික්ඛු, යම් මහණෙක්; අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා අඤ්ඤත්‍ර, ඇතුළුඅරමද ඇතුළුගෙයද තබා; රතනං වා, (සෙසු

**යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා පාචිත්තියං. 3.**

**යො පන භික්ඛු අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය භෙදනකං පාචිත්තියං. 4.**

**නවම්පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානෙන අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං. 5.**

---

තැනතුබු මුතුමැණික් ඈ) රුවණක් හෝ, රතනසම්මතං වා, (පිළිඈ රතනසම්මතයක් හෝ; උග්ගණ්හෙය්‍ය වා, තමා තබා දෙනපිණිස තෙමේ ගණීනම් හෝ; උග්ගණ්හාපෙය්‍ය වා, අනුන්ලවා ගත්වා නම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත්වේ.— භික්ඛුනා පන, භික්ෂුහු විසින්, අජ්ඣාරාමෙ වා, ඇතුළුඅරම හෝ; අජ්ඣාවසථෙ වා, ඇතුළුගෙයි හෝ හුනු; රතනං වා, රුවණක් හෝ, රතනසම්මතං වා, රතනසම්මතයක් හෝ දැක; උග්ගහෙත්වා වා, තමාවිසින් ගෙණ හෝ; උග්ගණ්හාපෙත්වා වා, අනුන්ලවා ගන්නවා හෝ; යස්ස භවිස්සති, යමෙක්හුගේ වන්නේද; සො හරිස්සතීති, හෙතෙමේ ගෙණ යන්නේයයි; නික්ඛිපිතබ්බං, තබාතිබිය යුත්තේය; අයං තත්ථ සාමීචි, මේ එහි වත්. 2.

යො පන භික්ඛු, යම් මහණෙක්; සන්තං භික්ඛුං, (දෙළොස් රියනකින් ඇතුළත ඇති භික්ෂුවක්හු; අනාපුච්ඡා "විකාලෙගාමප්පවෙසනං ආපුච්ඡාමි" යි යනාදීන් නො පිළිවිස, විකාලෙ, විකල්හි; තථාරූපා අච්චායිකා කරණීයා අඤ්ඤත්‍ර, එබදු ඉක්මන් කටයුත්තක් නැතිව, ගාමං පවිසෙය්‍ය, ගම්වදිනම්, පාචිත්තියං, පචිති ඇවත්වේ. 3.

යො පන භික්ඛු, යම් මහණෙක්; අට්ඨිමයං වා, ඇටමුවා හෝ; දන්තමයං වා, දළමුවා හෝ; විසාණමයං වා, අංමුවා හෝ; සූචිඝරං ඉඳිකඩක්; කාරාපෙය්‍ය, කරවා නම්; භෙදනකං, බිඳීම්ඇති හෙවත් බිඳ දෙසියයුතුවූ; පාචිත්තියං, පචිතිඇවැත්වේ. 4.

නවං පන, අලුත්වූ; *මඤ්චං වා, ඇඳක් හෝ; පීඨංවා, පුටුවක් හෝ; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂුහු විසින්, හෙට්ඨිමාය අටනියාඅඤ්ඤත්‍ර, වැල්යටයහැර; †සුගතඞ්ගුලෙන, සුගත් අඟු

---

* "අලුත්වූ හෝ" පොත් † "වල්යටය හැර, වඩුනට" පොත්

**යෝ පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය උද්දාලනකං පාචිත්තියං. 6.**

**නිසීදනම්පන භික්ඛුනා කාරයමානෙන පමාණිකං කාරෙතබ්බං තත්‍රිදං පමාණං දීඝසො ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා තිරියං දියඩ්ඪං දසා විදත්ථි තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං. 7.**

**කණ්ඩුපටිච්ඡාදිම්පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං. 8**

---

ලෙන්; අඩංගුලපාදකං, අටඟුලක්පමණ පාඇතිකොට; කාරෙතබ්බං; කරවියයුත්තේය; තං අතික්කාමයතො, එය ඉක්මවන්නාහට; ඡෙදනකං පාචිත්තියං, ඡෙදනපචිතිවේ. 5

යො පන භික්ඛු, යම් මහණෙක්; මඤ්චං වා, ඇඳක් හෝ; පීඨං වා, පුටුවක් හෝ; තූලොනද්ධං; පුලුන් එවවලඳනාලදු කොට; කාරාපෙය්‍ය, කරවා නම්; උද්දාලනකං, සිඳහිම්ඇති; පාචිත්තියං පචිති ඇවත්වේ. 6.

නිසීදනම්පන, නිසදුන් සිවුරක්; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂූන් විසින්; පමාණිකං කාරෙතබ්බං, පමණින්යුක්ත කොට කරවියයුත්තේය; තත්‍ර, එහි; ඉදං පමාණං, මේ ප්‍රමාණයි; දීඝසො, දිගින්; සුගතවිදත්ථියා, සුගත්වියතින්; ද්වෙ විදත්ථියො, දෙවියතක; තිරියං, සරස්හි; දියඩ්ඪං, දෙළවියතෙක; දසා, දහය; විදත්ථි, වියතෙකි; තං අතික්කාමයතො, එකීපමණ ඉක්මවන්නාහට; † ඡෙදනකං පාචිත්තියං, ඡෙදනපචිතිවේ. 7.

කණ්ඩුපටිච්ඡාදිම්පන, කස්පිළියන්සිවුර; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂූන් විසින්; පමාණිකා, ප්‍රමාණයෙන් යුක්තව; කාරෙතබ්බා, කරවියයුත්තිය; තත්‍ර, එහි, ඉදං පමාණං, මේ ප්‍රමාණයි; සුගතවිදත්ථියා, සුගත්වියතින්; දීඝසො, දිගින්; චතස්සො විදත්ථියො, සතරවියතෙක; තිරියං, සරස්හි; ද්වෙ විදත්ථියො, දෙවියතෙක; තං අතික්කාමයතො, එකීපමණ ඉක්මවන්නාහට; ඡෙදනකං පාචිත්තියං, ඡෙදනපචිතිවේ. 8.

---

† "ඉක්මවන්නාහට" පොත්.

වස්සිකසාටිකම්පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං දීඝසො ඡවිදත්ථියො සුගතවිදත්ථියා තිරියං අඩ්ඪතෙය්‍යා තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං. 9.

යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා ඡෙදනකං පාචිත්තියං ~ තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡ විදත්ථියො ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං. 10.

රතනවග්ගො නවමො:

———0———

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමිති,

පාචිත්තියා.

---

වස්සිකසාටිකම්පන, වැසිකඑසිවුර; කාරයමානෙන භික්ඛුනා, කරවන භික්ෂූනු විසින්, පමාණිකා, පමණින් යුතුනාවී; කාරෙතබ්බා, කරවියයුත්තීය; තත්‍ර; එහි; ඉදං පමාණං, මේ ප්‍රමාණයි; සුගතවිදත්ථියා, සුගත්වියතින්; දීඝසො, දිගින්; ඡවිදත්ථියො, සවියතෙක; තිරියං, සරස්හි; අඩ්ඪතෙය්‍යා, අඩුතුන්වියතෙකි; තං අතික්කාමයතො, එකීපමණ ඉක්මවන්නාහට; ඡෙදනකං පාචිත්තියං, ඡෙදනකපාචිත්තියවේ. 9.

යො පන භික්ඛු, යම් මහණෙක්; සුගතචීවරප්පමාණං, සුගතචීවරප්‍රමාණකොට හෝ; අතිරෙකං වා, අධික කොට හෝ; චීවරං, සිවුරක්; කාරාපෙය්‍ය, කරවා නම්; ඡෙදනකං පාචිත්තියං, ඡෙදනපචිත්තියවේ ~ තත්‍ර, එහි; ඉදං, මේ; සුගතස්ස, සුගත්හුගේ; සුගතචීවරප්පමාණං, සුගත්චීවරයෙහි පමණයි; සුගතවිදත්ථියා, සුගත්වියතින්; දීඝසො, දිගින්; නව විදත්ථියො, නවවියතෙක; තිරියං, සරස්හි; ඡ විදත්ථියො, සවියතෙක; ඉදං, මේ; සුගතස්ස, සුගත්හුගේ; සුගතචීවරප්පමාණං, සුගතචීවරයෙහි පමණයි. 10.

නවවන රතනවග්ගයි.

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ද්වෙ නවුති පාචිත්තියා ධම්මා දෙයානූපාචිත්තියාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසනලදහ; තත්‍ර

**ඉමෙ ඛො පනායස්මන්තො චත්තාරො පාටිදෙසනියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

**යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනියං වා භොජනියං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනියං තං පටිදෙසෙමීති. 1.**

---

එති; ආයස්මන්තෙනා, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; එත්‍ථ, මේ පාචිත්තියෙහි; පරිසුද්ධාකච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවනවට ත්‍යිදු විචාරමි; එත්‍ථ, මේ පාචිත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වනවටත්‍යිදු විචාරමි,එත්‍ථ මේ පාචිත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; එත්‍ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසුදුහ; තස්මා තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතයහ; එතං, මේ තුෂ්ණීම්භාවය; එවං ධාරයාමි, එහෙයින්දරමි; † පිරිසිදු හෙයිතැයි සලකමි.

## සුද්ධපාචිත්තියයි.

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන චත්තාරො පාටිදෙසනියා ධම්මා, මේ සතරපාටිදෙසනියාපත්තීහු; උද්දෙසං, තම තමන්ගේ සවරූපයෙන් උදෙසියයුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.

යො පන භික්ඛු, යම්යහණෙක්, අන්තරඝරමපවිට්ඨාය, ඇතුළුගෙට වන්නාවූ; අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො, නොනෑමෙහෙණක අතින්; ඛාදනීයං වා, යාවකාලික කනදෙයක් හෝ; භොජනීයං වා, ඔදනාදිභොජනයක් හෝ; සහත්ථා පටිග්ගහෙත්වා, සිය අතින් පිළිගෙණ; ඛාදෙය්‍ය වා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වළඳා නම් හෝ; තෙන භික්ඛුනා, ඒමහණහු විසින්; ආවුසො ඇවැත; ගාරය්හං, නින්‍දකටයුතුවූ; අසප්පායං, සැප නොවන්නාවූ; පාටිදෙසනීයං ධම්මං; පාටිදෙසනීයාපත්තිකට; ආපජ්ජිං, අවන්මි; තං පටිදෙසෙමීති, ඒ දෙසමියි; පටිදෙසෙතබ්බං, දෙසියයුත්තේයි.

---

† "ධරමි"පෙ.ත්

භික්ඛූ පනෙව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති තත්‍ර චෙසා භික්ඛු
නී වොසාසමානරූපා ඨිතා හොති ඉධ සූපං දෙථ ඉධ ඔදනං
දෙථාති තෙහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදෙතබ්බා අපසක්ක
තාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තීති' ඒකස්ස චෙපි භික්ඛුනො
නප්පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදෙතුං අපසක්ක තාව භගි
නි යාව භික්ඛූ භුඤ්ජන්තීති පටිදෙසෙතබ්බං තෙහි භික්ඛූහි ගාර
ය්හං ආවුසො ධම්මං ආපජ්ජිම්හා අසප්පායං පාටිදෙසනීයං තං
පටිදෙසෙමාති 2.

යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානි යො පන භික්ඛු
තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු පුබ්බෙ අනිමන්තිතො අගි
ලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙ
ය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවු
සො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති 3

---

භික්ඛූ පනෙව; භික්ෂූහු; කුලෙසු, උපාසකකුලයෙහි; නිමන්ති
තා, භොජනයකින් පවරණලද්දාහු; භුඤ්ජන්ති, වළඳද්ද; තත්‍ර, එහි;
ඒසා භික්ඛුනී, ඒ භික්ෂුණී තොමෝ; ඉධ සූපං දෙථ, මෙහි සුප
දෙව; ඉධ ඔදනං දෙථාති, මෙහි බත් දෙවයි, වොසාසමානරූපා,
විධානකරණස්වභාව ඇත්තී; චෙ, ඉදින්, ඨිතා හොති, සිටියා වේද;
තෙහි භික්ඛූහි,(වළඳමින් හුන්)ඒ භික්ෂූන් විසින්; සා භික්ඛුනී, ඒමෙ
හෙණ තොමෝ; භගිනි, භගිනිය; යාව භික්ඛූ භුඤ්ජන්ති, යම්තාක්
භික්ෂූහු වළඳත්ද; තාව; ඒතාක්; අපසක්කාහි, පහව යවයි; අපසා
දෙතබ්බා, පාකටයුත්තීයි, භගිනි, බුහුනැනි, යාව භික්ඛූ භුඤ්ජන්ති,
යම්තාක් භික්ෂූහු වළඳත්ද; තාව, ඒතාක්; අපසක්කාහි, පහවයි
සියා; තං භික්ඛුනිං, ඒමෙහෙණ; අපසාදෙතුං; පහකරන්නට;
ඒකස්සපි භික්ඛුනො, එකද මහණෙකුට; නප්පටිභාසෙය්‍ය චෙ. නො
වැටහිණි නම්; තෙහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්; ආවුසො, ඇවැත්නි;
ගාරය්හං, නින්දාකටයුතුවූ; අසප්පායං, සැපනොවන්නාවූ; පාටිදෙස
නීයං ධම්මං, පාටිදෙසනීයාපත්තියක්; ආපජ්ජිම්හ, අවනුම්හ; තං
පටිදෙසෙමාති, ඒ දෙසම්හයි; පටිදෙසෙතබ්බං, දෙසියයුතු: 2.

සෙඛසම්මතානි,ලද්දාවූ සෙඛසම්මතිඇති; යානි ඛො පන තානි
කුලානි, යම් ඒ උපාසකකුලකෙනෙක් ඇද්ද; යො පන භික්ඛු, යම්
මහණෙක් තෙමේ; තථාරූපෙසු, එබඳුවූ; සෙඛසම්මතෙසු කුලෙසු
ලද්සෙඛසම්මති ඇතිකුලයෙහි; පුබ්බෙ,(ආරූපචාරයට බස්නට)පළමු

**යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි යො පන භික්ඛු තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති 4**

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පා ටි දෙ ස නී යා ධම්මා 'තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමිති 5.**

**පටිදෙසනීයා**

---

කොට; අනිමන්ත්‍රිතො, නො පවරණලද්දේ; අගිලානො,( සිඟායන මහණ ශක්තිඇතිබැවින්)නොගිලන්වූයේ,ඛාදනීයංවා, යාවකාලික කනදෙයක් හෝ; භොජනීයං වා,, ඔදනාදිභොජනයක් හෝ; සහත්ථා පටිග්ගහෙත්වා, සියඅතින් පිළිගෙණ; ඛාදෙය්‍යවා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වළඳ නම් හෝ; තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; ගාරය්හං ආවුසො —පෙ— පටිදෙසෙමීති "ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමි "යි; පටිදෙසෙතබ්බං, දෙසියයුත්තේය. 3

ආරඤ්ඤකානි, අරණ්‍යයෙහි කරණලද; සාසඞ්කසම්මතානි, ආසඞ්කාසහිත දන්නාලද;සප්පටිභයානි, පිහිටියාවූ බලවත්භය ඇති; යානි ඛො පන තානි සෙනාසනානි, යම් ඒ සෙනසුන් කෙනෙක් ඇද්ද; යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ; තථාරූපෙසු සෙනාසනෙසු, එබදු සෙනස්නෙහි; විහරන්තො; වසන්නේ; පුබ්බෙ අප්පටිසංවිදිතං, (මෙනම් කෙනෙකුන්ගෙන් ඛාද්‍යභොජ්‍ය ගෙණෙනු ලැබෙයි,) පළමුකොට නො කියනලද; ඛාදනීයං වා, යාවකාලික කනදෙයක් හෝ; භොජනීයං වා,ඔදනාදිභොජනයක් හෝ; අජ්ඣාරාමෙ, ඇතුළු ආරාමයෙහි ලා; සහත්ථා පටිග්ගහෙත්වා, සියඅතින් පිළිගෙණ; අගිලානො, නො ගිලන්ව; ඛාදෙය්‍ය වා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, වළඳ නම් හෝ; තෙන භික්ඛුනා, ඒ භික්ෂුහුවිසින්; ගාරය්හං–පෙ–පටිදෙසෙමීති 'ගාරය්හං ආවුසොධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමි''යි පටිදෙසෙතබ්බං, දෙසියයුත්තේයි. 4.

ආයස්මන්තො, ආයුෂ්මත්නි; චත්තාරො; පාටිදෙසනීයා ධම්මා, සතරපාටිදෙසනීයාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසනලදහ; තත්ථ,

ඉමෙ ඛො පනායස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා. 1.

පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා. 2.

සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛාකරණීයා3

සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛාකරණීයා4

සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 5.

සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 6.

---

එහි; ආයස්මන්ත, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; එත්ථ, මේ පාටිදෙසනීයාපත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවනවටහිදු විචාරමි; එත්ථ, මේපාටිදෙසනීයාපත්තියෙහි; පරිසුද්ධා කච්චි පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වනවටහිදු විචාරමි; එත්ථ, මේපාටිදෙසනීයාපත්තියෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසුදුහ; තස්මා; තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතහ; එවං, මේ තුෂ්ණීම්භාවයා එවං ධාරයාමි, එහෙයින් දරමි පිරිසිදු හෙයිනැයි සලකමි.

## පාටිදෙසනීයයි.

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන සෙඛියා ධම්මා, මේ ශෛක්ෂ්‍යධර්මයෝ; උද්දෙසං, (නමින් නමත්හේ ස්වරූපයෙන්) උදෙසියයුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්.

පරිමණ්ඩලං, හාත්පසින් වටකොට; නිවාසෙස්සාමීති. හඳිමි යන; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීයි; ශික්ෂියයුතු යයිසේයි 1.

පරිමණ්ඩලං, හාත්පසින් වටකොට; පාරුපිස්සාමීති, පොරවමියි; සික්ඛා, ශික්ෂාතොමෝ; කරණීයා, කටයුත්තීයි. 2.

සුපටිච්ඡන්නො, සුපිළිසන්වී (මනාකොට හැඳ පෙරවා;) අන්තරඝරෙ, ඇතුළුගම්; ගමිස්සාමීති, යෙමියි. 3.

සුපටිච්ඡන්නො, සුපිළිසන්ව; අන්තරඝරෙ, ඇතුළුගම්හී; නිසීදිස්සාමීති, හිඳිමියි. 4

සුසංවුතො, සුවිනීතව ( 5. 6 ) ඉඳුරන් නොවකුව, යටබලා හෙළ

ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 7

ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා

න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා

න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 10.

පඨමො වග්ගො.

---

න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 1

න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 2.

අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 3.

අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 4.

න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 5.

න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 6

න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 7

න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 8.

න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 9

න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 10.

දුතියො වග්ගො

---

නැලද ඇස් ඇතිව ( 7. 8. ) උක්ඛිත්තකාය, නගතලද සිවුරු * ඇතිව; අන්තරඝරෙ, ඇතුළුගම, න ගමිස්සාමීති, නොයමියි-(9. 10

පලමුවන වගයි

---

උජ්ජග්ඝිකාය, මහත්වූ සිනා ඇතිව (1 2.) අප්පසද්දො, දෙළොස්රියණින් මිත්තෙත් නො ඇසෙනහඬ ඇතිව ( 3. 4. ) කායප්පචාලකං, කයසලසලා (5. 6.) බාහුප්පචාලකං, අත සලසලා (7. 8 ) සීසප්පචාලකං, ඉස සලසලා ( 9 10 )

දෙවනවගයි.

---

* "සිරුරු" පොත්.

න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 1

න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 2.

න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 3

න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 4

න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා 5

න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා 6.

සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා 7

පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා 8

සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා 9

සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා 10.

තතියො වග්ගො

---

ඛම්භකතො, උකුලෙහි තබනලද අත්ඇතිව (1. 2.) ඔගුණ්ඨිතො, හිස් වසා පෙරව (3. 4.) උක්කුටිකාය, අස්පත්ලෙන් හෝ විලුඹෙන්යනගමන්ඇතිව(5.)පල්ලත්ථිකාය,අතින් හෝ කඩින් හෝ කඩින්හෝ අකව්වු ඇවිලිම්ඇතිව (6) සක්කච්චං, සිහිඑලවා; පිණ්ඩ පාතං,අහර; පටිග්ගහෙස්සාමීති, පිළිගණිමියි (7) පත්තසඤ්ඤී, පත්‍රගතසංඥ ඇතිව; (8) සමසූපකං, බත්සතරවනකොටස පමණවූ මුද්ගසූපාදී සූපඇති කොට (9) සමතිත්තිකං, පාත්‍රවව්ටියටමරෙබාවූ භාසමව පිරුණාවූ. 10

තුන්වනවගයි.

සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා 1

පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා 2.

සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා 3.

සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා 4

න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා 5

න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමි භිය්‍යොකම්‍යතං උපාදායාති සික්ඛාකරණීයා 6

න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා 7

න උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමීති සික්ඛා කරණීයා 8

නාතිමහන්තං කබළං කරිස්සාමීති සික්ඛා කරණීයා 9

පරිමණ්ඩලං ආලොපං කරිස්සාමීති සික්ඛා කරණීයා 10

චතුත්ථො වග්ගො

---

සපදානං, තමා දිසායෙහි පටන් පිළිවෙළින්; පිණ්ඩපාතං අහර; භුඤ්ජිස්සාමීති, වළඳිමියි; ථූපතො බත්මුදුනමැදීන්; ඔමද්දිත්වා, තනා ( 1. 2, 3 4. 5. ) සූපං වා, මුද්ගසූපාදිසූප හෝ; බ්‍යඤ්ජනං වා, අවුළුහෝ; භිය්‍යොකම්‍යතං උපාදාය, වැලිඳුකැමතිබව නිසා; ඔදනෙන, බතින්; නපටිච්ඡාදෙස්සාමීති, නොවසමියි. (6 ) සූපං වා, මුද්ග සූපාදිසූපහෝ*; ඔදනං වා, බත් හෝ; අගිලානො, නොගිලන්ව; අත්තනො අත්ථාය, තමා පිණිස; විඤ්ඤාපෙත්වා, වීනවා; න භුඤ්ජිස්සාමීති, නොවළඳමියි. (7) උජ්ඣානසඤ්ඤී, කිපිගිත් ඇතිව; පරෙසං, මෙරමාගේ; පත්තං, වළඳනපාත්‍රය; න ඔලොකෙස්සාමීති, නොබලමියි (8) අතිමහන්තං, මොනරබිජුඉටසේ ඉතාමහත් කොට; කබළං, ආලෝපය; න කරිස්සාමීති, නො කරමියි. (9.) පරිමණ්ඩලං, වට කොට. 10

සතරවනවගයි.

—0—

* "කොමුගෙශ්" කියාමුද්‍රිත සන්නයකහිබේ හේවරදයි

නානාහටෙ කබලෙ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛාකරණීයා. 1.

න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමීති සික්ඛාකරණීයා 2.

න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමීති සික්ඛාකරණීයා. 3.

න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 4.

න කබලාවච්ඡෙදකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 5

න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 6.

න හත්ථනිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 7.

න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා, 8

න ජිව්හා නිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 9

න චපු චපුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 10

පඤ්චමො වග්ගො.

---

න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා. 1
න හත්ථනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා 2
න පත්තනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛාකරණීයා. 3

---

කබලෙ, ආලොපය; අනාහටෙ, මුවට නො එළවුසඳ; මුඛද්වාරං, මුඛය; න විවරිස්සාමීති, විවර නොකරමියි. (1) භුඤ්ජමානො, වළඳමින්; සබ්බං හත්ථං, සියලුඅත; මුඛෙ, මුඛයෙහි; න පක්ඛිපිස්සාමීති නොලමියි. 2

සකබළෙන මුඛෙන; කබලසහිතවූ මුඛයෙන්; න බ්‍යාහරිස්සාමීති, නො බණිමියි. (3) පිණ්ඩුක්ඛෙපකං, ආලොපය මුඛයට දමදමා. (4.) කබලාවච්ඡෙදකං, ආලෝපය කඩකඩාගෙණ (5.) අවගණ්ඩකාරකං, වඳුරන්සේ කොපුලරැස්කොට කොට. (6) හත්ථනිද්ධුනකං, අත සලසලා (7) සිත්ථාවකාරකං, බත්හුලු හිසහිස (8) ජිව්හානිච්ඡාරකං, දිව නෙරනෙරා (9) චපු චපුකාරකං, චපුචපුයන හඬඇති කොටකොට; මෙවත් පස් පැහැර. පැහැර10.

පස්වනවගයි.

---

සුරුසුරුකාරකං, සුරුසුරුයන හඬඇති කොට කොට. (1) හත්ථනිල්ලෙහකං, අතලෙවිලෙව. (2) පත්තනිල්ලෙහකං, එක

න ඔඨනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා. 4

න සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා. 5

න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා. 6

න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 7

න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 8

න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 9

න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 10

ඡට්ඨො වග්ගො.

---

න පාදුකාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙමීති සික්ඛා කරණීයා. 1

න උපාහනාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 2

න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 3

---

ඇඟිල්ලෙකින් හුදු පාත්‍රය ලෙවලෙව (3) ඔඨනිල්ලෙහකං, දිවින් පිපි, තොල් ලෙවලෙව. (4) සාමිසෙන හත්ථෙන, ආමිසඇති අතින්; පානීයථාලකං පැන්තල (5) සසිත්ථකං, හුලුසහිතවූ; පත්තධොවනං) පාත්‍රසේදූ දිය; අන්තරඝරෙ, ඇතුළුගෙහි; න ඡඩ්ඩෙස්සාමීති, නො දමමිසි (6) ඡත්තපාණිස්ස, කුඩගත්අත්ඇති; *අගිලානස්ස, නොගිලන්හට; ධම්මං, බණ; න දෙසිස්සාමීති, නො දෙසමිසි. (7) දණ්ඩපාණිස්ස, වඩුරියනින් සතරරියන් පමණ දඬුගත් අත්ඇති. (8) සත්ථපාණිස්ස, කඩුඈ ශස්ත්‍රගත් අත්ඇති; (9) ආයුධපාණිස්ස දුනු හෝ හීදඬු හෝ ගත්අත්ඇති. 10.

සවනවගයි.

---

පාදුකාරූළ්හස්ස, පයලූ මිරිවැඩි ඇති. (1) උපාහනාරූළ්හස්ස පසලුවහන්ඇති. (2) යානගතස්ස, හීදෑළුගැල්යානාදියෙහි උන්නාවූ

---

* "ඇතිළ" පොත්

න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 3

න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 4

න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 5

න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 6

න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 7

න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 8

න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 9

න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 10

න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 11.

න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා. 12.

---

වූ. (3) සයනගතස්ස, යටත්පිරිසෙයින් බිමද හොත්තාවූ. (4) වෙඨිතසීසස්ස, කෙසාන්තය නොපෙණෙනසේ පිළිආදීන් වෙළනලද ඉස් ඇති. (5) ඔගුණ්ඨිතසීසස්ස, කොණ්ඩ නොපෙණෙනසේ වසනලද හිස් ඇති, (6) ඡමාය නිසීදිත්වා බිමහිඳ; ආසනෙ නිසින්නස්ස, ආසනයෙහි හුන්නාවූ. (7. 8.) නීචෙ ආසනෙ නිසීදිත්වා, මිටිහස්නෙහි හිඳ; උච්චෙ ආසනෙ නිසින්නස්ස, උස්ආසනයෙහි හුන්නාවූ: (9) ඨිතො සිටියෙමි; නිසින්නස්ස, හුන්නාවූ 10.

පච්ඡතො ගච්ඡන්තො, පස්සෙහි යන්නෙමි; පුරතො ගච්ඡන්තස්ස පෙරටුව යන්නාවූ, (11) උප්පථෙන ගච්ඡන්තො, නොමඟින් යන්

න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා. 13

න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා. 14

න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛාකරණීයා. 15

සත්තමො වග්ගො.

—0—

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සෙඛියා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

සෙඛියා නිට්ඨිතා.

——

---

තෙළෙස්;පසළොස්වන ගච්ඡනය, මෙහින් යන්නාවූ (12) ඨිතො, සිටියේම, අගිලානො, නොගිලන්ව; උච්චාරං වා, මලකිස හෝ; පස්සාවං වා; චටන්කිස හෝ, (13) හරිතෙ, තිල්තණ ආදියෙහි, (14) උදකෙ, පරිභොගඇති දියෙහි; අගිලානො, නො ගිලන්ව; උච්චාරං වා මලකිස හෝ; පස්සාවං වා, චටන්කිස හෝ; ඛෙළං වා, කෙළ හෝ; න කරිස්සාමීති, නොකෙරෙමියි; සික්ඛා, ශික්ෂාවතොමෝ; කරණීයා, කටයුත්තීයි. 15

සත්වනවගයි.

—0—

ආයස්මන්තො, ආයුෂ්මත්නි; සෙඛියා ධම්මා, ශෛක්ෂධර්මයෝ උද්දිට්ඨා ඛො, උද්දෙශකළදහ; තත්ථ, එහි; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; එත්ථ, මේ ශෛක්ෂධර්මයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; දුතියම්පි පුච්ඡාමි, දෙවනවටත්හිදු විචාරමි; එත්ථ, මේ ශෛක්ෂධර්මයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; තතියම්පි පුච්ඡාමි, තුන්වනවටහිදු විචාරමි; එත්ථ, මේ ශෛක්ෂධර්මයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසුදුද; එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා පරිසුදුහ; තස්මා තුණ්හී, එහෙයින් තුෂ්ණීම්භූතහ; එතං, මේ තුෂ්ණීම්භාවය; එවං ධාරයාමි, මෙසේහෙයින් දරමි; පිරිසිදුහෙයිනැයි සලකමි.

සෙඛියාවනිමියාය.

——

ඉමෙ ඛො පනායස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො සතිවිනයො දාතබ්බො අමූළ්හවිනයො දාතබ්බො පටිඤ්ඤාය කාරෙතබ්බො යෙභුය්‍යසිකා තස්සපාපියසිකා තිණවත්ථාරකො'ති.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

අධිකරණසමථා නිට්ඨිතා.

---0---

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; අධිකරණසමථා, අධිකරණයන් සන්සිඳුවන්නාවූ; ඉමෙ ඛො පන සත්තධම්මා, මේ සප්තවිධධර්මයෝ; උද්දෙසං, උදෙසියයුතුබවට; ආගච්ඡන්ති, පැමිණෙත්

